ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව

2023

විශ්වවිද්‍යාලයේ නිල ලාංඡනය



විශ්වවිද්‍යාලයේ නිල ලාංඡනය කහ පැහැති පසුබිමක වෘත්තාකාර ස්වරූපයකින් තිබෙන අතර එහි පරිවරණයෙහි ඒක කේන්ද්‍රීය වෘත්ත තුනක් එකිනෙකට සමීපව පිහිටා ඇත. මෙම වෘත්තය මධ්‍යයේ කුඩා ඒකකේනද්‍රීය වෘත්තයක නෙලුම් මලක් සටහන් වී ඇති අතර නෙලුම් මලේ එක් පෙති තට්ටුවක් යටින් තව පෙති තට්ටුවක් ආකාරයට පෙති තට්ටු දෙකක් වේ. වෘත්තය මධ්‍යයේ ඒකකේන්ද්‍රීය වෘත්ත දෙකට මැදිව මලේ කේශර පහිටා ඇත. නෙලුම් මල පිහිටි ඒකකේන්ද්‍රීය වෘත්තයන්ට පිටතින්ද ඒකකේනද්‍රීය වෘත්ත තුනට මැදිවන සේ පහතින් විශ්වවිද්‍යාලයේ නම සිංහල අක්ෂර වලින් දැක්වේ. එහි ඉහලින් පුරාණ බෞද්ධ ග්‍රන්ථයකින් උපුටාගත්

‘‘ විජ්ජා උප්පතතං සෙට්ඨා ’’ (‘‘සියල්ල අතරින් ප්‍රඥාව ශ්‍රේෂඨය’’)

යනුවෙන් ආදර්ශ පාඨය සඳහන් වේ.

විශ්වවිද්‍යාලයේ දැක්ම

අධ්‍යාපනයෙන් ජීවිත සෞභාග්‍යවත් කිරීම

විශ්වවිද්‍යාලයේ මෙහෙවර

අපගේ සංස්කෘතික උරුමයන්ගෙන් හා ඥානයෙන් ප්‍රබෝධයට පත් වෙමින් අධ්‍යාපනය ඇසුරෙන් තිරසර අනාගතයක් උදෙසා ගෝලීයව සාර්ථක පුරවැසියන් නිර්මාණය කිරීම

අපගේ අරමුණු

- **අරමුණ 01: ඉගෙනීම හා අධ්‍යාපනය**
- **අරමුණ 02: පර්යේෂණ හා සංවර්ධනය**
- **අරමුණ 03: මිනිසුන්**
- **අරමුණ 04: යටිතල පහසුකම්**
- **අරමුණ 05: මූල්‍ය**
- **අරමුණ 06: කැපී පෙනෙන ශිෂ්‍ය අත්දැකීම්**
- **අරමුණ 07: යාවජීව ප්‍රජාව, සමාජ වගකීම හා ජාතික සංවර්ධනය**

අපගේ හර වටිනාකම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ප්‍රජාව විසින් කාර්යයන් සිය කාර්යයන් සාමූහිකව ඉටුකිරීමේ දී ඒ සඳහා දක්වනු ලබන කැපකිරීම අපගේ හර වටිනාකම් වේ

- **අධ්‍යයන විශිෂ්ටත්වය සහ කාර්ය සාධනය**
- **විශ්වීය ආදරය කරුණාව සහ දයාව**
- **නිහතමානිකම සහ අවංකභාවය**
- **සමාජ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සුරක්ෂිත කිරීම**
- **බුද්ධිමය චින්තනයේ සහ නිර්මාණශීලීත්වයේ නිදහස**
- **වගවීම සහ සමාජ වගකීම**



අපගේ සංස්කෘතික උරුමයන්ගෙන් හා ඥානයෙන් ප්‍රබෝධයට පත් වෙමින් අධ්‍යාපනය ඇසුරෙන් තිරසර අනාගතයක් උදෙසා ගෝලීයව සාර්ථක පුරවැසියන් නිර්මාණය කිරීම

මූලික හරවටිනාකම

- අධ්‍යයන විශිෂ්ටත්වය සහ කාර්ය සාධනය
- විශ්වීය ආදරය කරුණාව සහ දයාව
- නිහතමානිකම සහ අවංකභාවය
- සමාජ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සුරක්ෂිත කිරීම
- බුද්ධිමය චින්තනයේ සහ නිර්මාණශීලීත්වයේ නිදහස
- වගවීම සහ සමාජ වගකීම

උපකුලපතිවරයාගේ පණිවිඩය



අඩසියවසකට අධික ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පද්ධතියේ ප්‍රමුඛතම විශ්වවිද්‍යාලයක් ලෙස ඉදිරියට පැමිණ තිබේ. ශිෂ්‍ය ජනගහනය අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මෙරට විශාලතම විශ්ව විද්‍යාලය ලෙස සැලකිය හැකි අතර එය පීඨ 11කින් සමන්විතය. 16,000කට අධික උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාවක් එහි ඉගෙනුම ලබයි.

2023 වර්ෂයේ සාක්ෂාත් කර ගන්නා ලද ජයග්‍රහණ පිළිබඳව සඳහන් කිරීමේ දී, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය උසස් අධ්‍යාපනයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් ලෙස අඛණ්ඩව වර්ධනය වෙමින් පවතින බව පෙනී යයි. දැනට විවිධ විෂයයන් හැදෑරීම සඳහා සිසුන් 16,000 කට අධික සංඛ්‍යාවක් බඳවාගෙන ඇති අතර, ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම, නවෝත්පාදන කටයුතුවල නිරතවීම සහ ඊළඟ පරම්පරාවේ නායකයින් සහ විද්වතුන් බිහි කිරීමේ මහඟු වගකීම ඉටු කිරීම සඳහා අප විශ්ව විද්‍යාලය ඇප කැපවී සිටී.

අපගේ විශ්වවිද්‍යාල ප්‍රජාව පෙර නොවූ විරූ අභියෝග හමුවේ සිය ඔරොත්තු දීමේ හැකියාව, අනුවර්තනය වීමේ හැකියාව සහ දැඩි අධිෂ්ඨානශීලීබව වසර පුරාවටම පෙන්නුම් කර ඇත. පවතින ගෝලීය අවිනිශ්චිතතාවයන් හමුවේ, අධ්‍යයන කටයුතු, පර්යේෂණ නවෝත්පාදන සහ ප්‍රජා සහභාගීත්වය සඳහා අපි දැඩි කැපවීමකින් යුතුව කටයුතු කරන්නෙමු.

2023 වාර්ෂික වාර්තාව තුලින් අධ්‍යයන අංශ, පර්යේෂණ මධ්‍යස්ථාන සහ වෙනත් වැඩසටහන් හරහා අපගේ පීඨ, කාර්ය මණ්ඩලය සහ සිසුන් ලබා ගත් කැපී පෙනෙන ජයග්‍රහණ විශේෂයෙන් සඳහන් කර ඇත. නව්‍ය පර්යේෂණ ක්‍රියාමාර්ගවල සිට බලපෑමක් ඇති කරන්නා වූ ප්‍රජා හවුල්කාරිත්වය දක්වා, අප දැරූ සෑම උත්සාහයක්ම, දැනුම වැඩි දියුණු කිරීම, සමාජ වගකීම් සක්‍රීය කිරීම සහ ජාතික සංවර්ධනය උදෙසා අප සතු කැපවීම පිළිබිඹු කරයි.

ඉදිරි අනාගතය දෙස බැලීමේ දී, අපගේ සාර්ථකත්වය ගොඩනගා ගැනීමට සහ අපගේ අභිවෘද්ධිය සහ සහයෝගීතාවය පවත්වා ගැනීම උදෙසා නව අත්දැකීම් ලබා ගැනීමට අපි උත්සාහ කරමින් සිටිමු. අධ්‍යයන නවෝත්පාදන, පර්යේෂණ විශිෂ්ටත්වය සහ ශිෂ්‍යාන්ගේ සාර්ථකත්වය උදෙසා නව අරමුණු පෙරදැරි කර ගනිමින් අඛණ්ඩ උත්සාහයක අපි නිරතව සිටින්නෙමු.

වසර ගණනාවක් පුරා අපගේ සාර්ථකත්වය උදෙසා කළ කැපවීම, වෙහෙස මහන්සිය සහ ලබා දුන් දායකත්වය වෙනුවෙන් විශ්ව විද්‍යාල ප්‍රජාවේ සියලුම සාමාජිකයින්ට මගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් නිර්වචනය කරනු ලබන සාරධර්ම සහ ප්‍රතිපත්ති තවදුරටත් ආරක්ෂා කරමින් අපි සැම එකට එක්ව අපගේ ආයතනය තවත් ඉහළට ඔසවා තබමු.

අපගේ විශ්ව විද්‍යාලයේ මෙහෙවර සහ දැක්ම යථාර්ථයක් කර ගැනීම සඳහා ඔබ ලබා දෙන අඛණ්ඩ සහයෝගය සහ උත්සාහයට බෙහෙවින් ස්තූතියි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්. පද්මලාල්
උප කුලපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

පටුන

විශ්වවිද්‍යාලයේ නිල ලාංඡනය I
විශ්වවිද්‍යාලයේ දැක්ම I
විශ්වවිද්‍යාලයේ මෙහෙවර I
අපගේ අරමුණු II
අපගේ හර වටිනාකම් II
උපකුලපතිවරයාගේ පණිවිඩය III
විශ්වවිද්‍යාලය 1
2023 වර්ෂයේ ප්‍රගතිය පිළිබඳ උපකුලපතිගේ දළ විශ්ලේෂණය 2
විශ්වවිද්‍යාලයේ පරිපාලනය 4
2023 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ නිලධාරි මණ්ඩලය 4
පරිපාලන ව්‍යුහය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 5
විශ්වවිද්‍යාලයේ පාලන බල මණ්ඩල 7
සනාතන සභාව 15
2023 වර්ෂයේ පැවති රැස්වීම් 15
අගය නිර්මාණ ආකෘතිය 16
ආයතනික පාලන රාමුව 18
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආයතනික පාලනය 18
විගණන කමිටු වාර්තාව 21
තිරසාරබව පිළිබඳ ප්‍රගති වාර්තාව 2023 23
තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA) 32
ශිෂ්‍ය හා සම්පත් විස්තරය 39
දේශීය සිසුන් පිළිබඳ තොරතුරු 39
විදේශීය සිසුන්ගේ විස්තර 41
විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2023 41
විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2023 41
නව ශිෂ්‍ය ලියාපදිංචිය 42
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2020/2021අධ්‍යයන වර්ෂයට අදාල ව බඳවා ගත් අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින් පිළිබඳ තොරතුරු 42
පසුගිය වසර පහ තුළ අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින්ගේ නව ලියාපදිංචි කිරීම් පිළිබඳ තොරතුරු .. 42
උපාධිධාරීන් පිළිබඳ තොරතුරු 44
උපාධිධාරී සේවා නියුක්තිය 45
ශිෂ්‍ය සුභසාධන පහසුකම් 46
මහපොළ ශිෂ්‍යාධාර 46
ශිෂ්‍යාධාර 46
නේවාසිකාගාර පහසුකම් 47
කාර්යය මණ්ඩල විස්තර 48

කාර්ය මණ්ඩල සාරාංශය (සේවා කාණ්ඩ ලෙස) 2023 දෙසැම්බර් 31 දිනට 48
2023 වර්ෂය තුළ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර49
තනතුරු අනුව අධ්‍යයන කාර්යය මණ්ඩලය 2019 - 2023 54
විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සුදුසුකම්: 2019 - 2023..... 55
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අයත් පීඨ 57
මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය 58
පීඨය විසින් පිරිනමනු ලබන උපාධි හා ඩිප්ලෝමා - 2023.....59
අධ්‍යාපනය සහ සේවා නියුක්ති නිපුණතා සංවර්ධනය 62
පර්යේෂණ හා සම්මන්ත්‍රණ.....63
විශේෂ වැඩසටහන් හා වැඩමුළු.....66
කර්මාන්ත සහයෝගීතා.....70
2022 හා 2023 යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය 71
ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2023.....71
අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු - 2023.....72
සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2023.....73
ව්‍යවහාරික විද්‍යා පීඨය..... 74
පීඨය විසින් පිරිනමනු ලබන උපාධි.....75
අධ්‍යාපනය හා සංවර්ධනය.....75
යටිතල පහසුකම් සංවර්ධනය.....76
2022 හා 2023 යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය.....76
ශිෂ්‍ය හා සම්පත් විස්තරය 77
අධ්‍යයන කාර්යය මණ්ඩලය - 2023.....78
සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන - 2023 79
කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය 80
පීඨය විසින් පිරිනමන උපාධි ,පශ්චාද් උපාධි, ඩිප්ලෝමා ,ශ්‍රාස්ත්‍රපති ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා සහතිකපත්‍ර පෘඨමාලා - 2023.....81
ඉගෙනීම, අධ්‍යාපනය සහ සේවා නියුක්ති කුසලතා සංවර්ධනය 82
යටිතල පහසුකම් සංවර්ධනය 83
පර්යේෂණ හා සංවර්ධනය (සම්මන්ත්‍රණ ඇතුළුව).....84
කාර්මික සහයෝගීතාව 85
මානව සම්පත් සංවර්ධනය (විද්වතුන්, විද්වත් නොවන පුද්ගලයින්, ශිෂ්‍යයින්).....88
ප්‍රජා සේවා, සමාජ වගකීම, සහ ජාතික සංවර්ධනය 89
2022 හා 2023 වර්ෂ වල ප්‍රතිඵල සන්සන්දනය 89
දේශීය සිසුන් පිළිබඳ විස්තර - 2023.....91
කාර්යය මණ්ඩල විස්තරය.....91
ස්ථිර අධ්‍යයන කාර්යය මණ්ඩලය 92
පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2023.....92
වෛද්‍ය විද්‍යා පීඨය 93

පීඨය මඟින් පිරිනමන උපාධි හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා 94
ඉගෙනීම සහ අධ්‍යාපනය 95
පර්යේෂණ හා සංවර්ධනය.....95
යටිතල පහසුකම් සංවර්ධනය 96
2022 හා 2023 වසර වල ප්‍රතිඵල සැසඳීම 97
දේශීය ශිෂ්‍ය විස්තරය 2023 98
අනධ්‍යයන කාර්යය මණ්ඩලය - 2023 98
අධ්‍යයන කාර්යය මණ්ඩලය 98
පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2023 99
පශ්චාද් උපාධි පීඨය 100
තාක්ෂණ පීඨය 106
පීඨය විසින් පිරිනමනු ලබන උපාධි සහ ඩිප්ලෝමා 107
අධ්‍යාපනය හා සංවර්ධනය 108
පර්යේෂණ හා පර්යේෂණ සමූළු.....109
2022 හා 2023 වසර වල ප්‍රතිඵල සැසඳීම 109
ශිෂ්‍ය සම්පත් විස්තරය 2023.....110
අධ්‍යයන කාර්යය මණ්ඩලය 110
පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2023 111
ඉන්ජිනේරු පීඨය 112
පීඨය මඟින් ප්‍රදානය කරනු ලබන උපාධි 112
2022 හා 2023 වසර වල ප්‍රතිඵල සැසඳීම.....113
ශිෂ්‍ය සම්පත් විස්තරය - 2023 113
දේශීය සිසුන් පිළිබඳ විස්තරය - 2022 113
අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය 114
පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2023.....114
සම සෞඛ්‍ය පීඨය - 2023 115
පීඨය මගින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා.....116
පර්යේෂණ හා ප්‍රකාශන.....116
ශිෂ්‍ය හා සම්පත් විස්තරය 2023.....116
දේශීය සිසුන් පිළිබඳ විස්තරය 117
අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය 2023 117
පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2023 118
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය 118
පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි.....119
ශිෂ්‍ය හා සම්පත් විස්තරය 2023.....119
පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2023.....120
නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය 120

පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි....121
අධ්‍යයන වැඩසටහන්....121
පර්යේෂණ හා බාහිර ක්‍රියාකාරකම්....121
ජාත්‍යන්තර සහයෝගිතා....122
ප්‍රජාව/සමාජයීය වගකීම හා ජාතික දායකත්වය....122
ශිෂ්‍ය සම්පත් විස්තරය 2023....122
පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2023....123
පරිගණක පීඨය 124
ශාරීරික අධ්‍යාපන ඒකකය 125
තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය (CITS) 129
පුස්තකාලය 130
බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය 131
විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය 137
පර්යේෂණ සභාව 138
උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන (AHEAD) මෙහෙයුම් වේගවත් කිරීම සඳහා ලෝක බැංකුව අරමුදල් සපයන ලදී 146
(ආර්ථික සංවර්ධනය උදෙසා ප්‍රමුඛතා විෂයයන් යටතේ උසස් අධ්‍යාපනය සඳහා බඳවා ගැනීම් වැඩි කිරීම) 149
වාර්ෂික ගිණුම් වාර්තා 159
2023 වර්ෂයේ පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තරය....159
මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය පීඨ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය 2023 (අභ්‍යන්තර උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්)....160
ප්‍රාග්ධන වියදම් 2020 - 2023....160
මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2023 161
පූර්ව වසර 05 ක මූල්‍ය සුවිශේෂිතා (සංඛ්‍යා රු. ‘000 දක්වා ඇත)....161
පූර්ව වසර 05 ක මූල්‍ය ප්‍රදාන ලැබීම් පිළිබඳ විශේෂ තොරතුරු (සංඛ්‍යා රු. ‘000දක්වා ඇත 161
පූර්ව වසර 05 ක මූල්‍ය වියදම් පිළිබඳ විශේෂ තොරතුරු (සංඛ්‍යා රු. ‘000 දක්වා ඇත)....162
2023 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා මූල්‍ය කාර්යය සාදනය සඳහා වන ප්‍රකාශය 163
2023.12.31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය....166
2023.12.31 වන දිනෙන් අවසන් වන වසර සඳහා ප්‍රාග්ධනය වෙනස් වීමේ ප්‍රකාශය....167
2023.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 169
සටහන් 189
2023.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 233
විගණන වාර්තාවට අනුකූලව ගන්නා ලද ක්‍රියාමාර්ග 240

විශ්වවිද්‍යාලය



කොළඹ නගර මධ්‍යයේ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය දීර්ඝ හා කීර්තිමත් ඉතිහාසයකට හිමිකම් කියයි. 1959 දී ගංගොඩවිල ආරම්භ කළ එහි මූලාරම්භය 1873 දී අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් මාලිගාකන්දේ ස්ථාපිත කරන ලද විද්‍යෝදය පිරිවෙන දක්වා දිව යයි. අද විශ්වවිද්‍යාලය වසර 63 ක ඉතිහාසය පසුකරන අතරම වසර 150 ක ගමනට උපහාර පුදකරයි.

ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ පුනර්ජීවනයේ හරය වූයේ විද්‍යෝදය පිරිවෙන නමින් අතීතයේ හැඳින්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයි. එය ශ්‍රී ලංකාවේ දෙවන පැරණිතම විශ්වවිද්‍යාලය වන අතර ස්වාධීන ලංකාවේ ස්ථාපිත ප්‍රථම විශ්වවිද්‍යාලය වේ.

අද විශ්වවිද්‍යාලය පීඨ නවයකින් සමන්විත වේ, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, වෛද්‍ය විද්‍යා පීඨය, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයකින්ද ශක්තිමත්ව පවතී. තාක්ෂණ පීඨය, ඉංජිනේරු පීඨය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය සහ එහි නවතම එකතු කරන ලද දන්ත වෛද්‍ය පීඨයකින්ද ශක්තිමත්ව පවතී. විශ්වවිද්‍යාලය උපාධි අපේක්ෂකයින් 16,000 කට අධික සංඛ්‍යාවක් සහ පශ්චාත් උපාධි සිසුන් 3500 කට අධික සංඛ්‍යාවකට නිවහන වේ. එය ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ජනගහනය අනුව විශාලතම විශ්වවිද්‍යාලය ලෙස සැලකේ.

තවද විශ්වවිද්‍යාලය පර්යේෂණ මධ්‍යස්ථාන 22කට අධික සංඛ්‍යාවකින් යුත් පර්යේෂණ සභාවක් සහ 50කට අධික ව්‍යවසායකයින් සහ පාර්ශවකරුවන් 15කට අධික පේටන්ට් බලපත්‍ර සහිත නව නිපැයුම්, නවෝත්පාදන සහ ව්‍යාපාර නිර්මාණ කවුන්සිලයක් සමඟින් පර්යේෂණ හා නවෝත්පාදනයන් අතින්ද ඉදිරියෙන්ම සිටී.
විශ්වවිද්‍යාලය බොහෝ ජාත්‍යන්තර අධ්‍යාපන ආයතන සමඟ සුහද සබඳතාවක් පවත්වා ඇති අතර පිළිගත් ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් (MoUs) 60 කට අධික ප්‍රමාණයක් අත්සන් කර ඇත. තවද ස්ථාපිත ජාත්‍යන්තර සහ දේශීය සමාගම් සමඟ අවබෝධතා ගිවිසුම් 60කට අධික ප්‍රමාණයක් අත්සන් කර ඇත. එමෙන්ම විශ්වවිද්‍යාලය තම සිසුන්ට ජාත්‍යන්තර අත්දැකීමක් ලබා දීමට උත්සාහ කරන අතර, ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සහ සීමාවාසික පුහුණුව ලබා දෙයි.

වසර ගණනාවක් පුරා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සිය නිම් වළලු පුළුල් කරමින් බොහෝ ක්ෂේත්‍රවල සංවර්ධනයට සමත් වී ඇත. එය අපගේ මාතෘ ජාතියේ සංවර්ධනයට උපකාරී වන බුද්ධිමත්, කාර්යක්ෂම, දක්ෂ සහ වෘත්තීය පුද්ගලයින් බිහි කිරීම සහතික කරන බොහෝ සන්ධිස්ථාන කරා ළඟා වීමේ මෙම ගමන දිගටම කරගෙන යනු ඇත.

2023 වර්ෂයේ ප්‍රගතිය පිළිබඳ උපකුලපතිගේ දළ විශ්ලේෂණය

2023 වර්ෂය තුළ අප රට මුහුණ දුන් අභියෝග මධ්‍යයේ වුවද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි සාධනීය ලෙස බලපෑමක් සිදු කර තිබේ. 2023 ජනවාරි 02 වැනි දින විශ්වවිද්‍යාලය නව වසරේ කටයුතු ආරම්භ කරන ලදි.

2023 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාල සංයුතියට අධ්‍යයන පීඨ 11ක් ඇතුළත් විය. ඒවා නම් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය (FHSS) (1959 දී පිහිටුවන ලදී), ව්‍යවහාරික විද්‍යා පීඨය (FAS) (මුලින්ම එය විද්‍යා පීඨය ලෙස 1961 දී පිහිටුවන ලදී), කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය (FMSC) (1972 දී පිහිටුවන ලදී), වෛද්‍ය විද්‍යා පීඨය (FMS) (1993 දී පිහිටුවන ලදී), උපාධි අධ්‍යයන පීඨය (FGS) (1996 දී පිහිටුවන ලදී), තාක්ෂණ පීඨය (FoT) (2016 දී පිහිටුවන ලදී), ඉංජිනේරු පීඨය (FoE) (2016 දී පිහිටුවන ලදී), සම සෞඛ්‍ය විද්‍යා පීඨය (FAHS) (2019 දී පිහිටුවන ලදී), දන්ත වෛද්‍ය විද්‍යා පීඨය (FDS) (2021 හි පිහිටුවන ලදී) , නාගරික සහ ජලජ ජෛව සම්පත් පීඨය (FUAB) (2022 දී පිහිටුවන ලදී) සහ පරිගණක පීඨය (FoC) (2022 දී පිහිටුවන ලදී).

ඉහතින් සඳහන් කරන ලද පීඨ 11 හැරුණු විට, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සතුව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) තිබේ. උසස් කළමනාකරණ අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන පුද්ගලයින්ට තම වෘත්තීය ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සේවා සපයන්නා වූ අත්‍යවශ්‍ය සම්පතක් ලෙස මෙම ආයතනය සැලකිය හැකිය.

2023 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ හයක් සඳහා පීඨාධිපති පත්වීම් පිරිනමන ලදි. ඒ අනුව මහාචාර්ය ඩී.අයි.උළුවඩුගේ මහතා 2023 වසරේ මාර්තු මස 23 වැනි දින සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ලෙස පත් කරන ලදී. 2023 මැයි 29 වැනි දින කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ පීඨාධිපතිවරයා ලෙස ආචාර්ය ජේ.ඩබ්ලිව්.ඩී. වමින්ද මහතා පත් කරන ලදි. එසේම, 2023 සැප්තැම්බර් 09 වැනි දින, තාක්ෂණ පීඨයේ පීඨාධිපති ලෙස මහාචාර්ය ඒ.එච්.එල්.ආර්. නිල්මිණි මිය දෙවැනි වරටත් නැවත පත් කරන ලදී. ඉංජිනේරු පීඨයේ පීඨාධිපති ලෙස ආචාර්ය එම්. එන්. ධර්මවීර මහතා 2023 සැප්තැම්බර් 20 වැනි දින පත් කරන ලදී. තවද, උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා ලෙස මහාචාර්ය පී.පී.ආර්. පෙරේරා මයා 2023 නොවැම්බර් 13 වන දින පත් කරන ලද අතර, වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙස මහාචාර්ය එම්.ඒ.එම්.එන්.ගමගේ මහතා 2023 නොවැම්බර් 17 වන දින පත් කරන ලදී.

මීට අමතරව, 2023 වර්ෂයේ දී වෙබොමෙට්‍රික්ස් (Webometrics) ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාවේ 3 වන හොඳම විශ්ව විද්‍යාලය බවට පත් විය. පර්යේෂණ නිමැවුම් සහ විශ්ව විද්‍යාලයේ සියලුම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහයෝගීතාවය මෙම ශ්‍රේණිගත කිරීම සඳහා ඉමහත් දායකත්වයක් ලබා දී ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පවත්නා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ උත්සාහයක් ලෙස, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය (FHSS) සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය (FMSC) සඳහා බහුකාර්ය ගොඩනැගිලි දෙකක් ඉදිවෙමින් පවතී. මීට අමතරව කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ අලුතින් ඉදිකරන ලද ශිෂ්‍ය මණ්ඩපයක් 2023 ජුනි 14 වැනි දින හිටපු උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා අතින් විවෘත කෙරිණි.

අධ්‍යයන ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වයට සමගාමීව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය දේශීය හා ජාත්‍යන්තර ක්‍රීඩා ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු ලෙස අඛණ්ඩව කටයුතු කරමින් සිටී. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ දී (SLUG) අඛණ්ඩව තෙවැනි වරටත් සමස්ත ශූරතාව දිනා ගැනීමට විශ්වවිද්‍යාලයට හැකි විය. මඩකලපුව පිහිටි ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය, මෙවර ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ (SLUG) සත්කාරකත්වය දැරූ අතර අවසන් මහා තරගය 2023 සැප්තැම්බර් මාසයේදී පැවැත්විණි. තවද,

සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කැපවීම ඇගයීමට ලක් කරමින් 2023 ජුනි 09 වන දින 46 වන වර්ණ ප්‍රදානෝත්සවය පවත්වන ලදී. මෙම උත්සවයේදී සම්මාන 500කට වැඩි ප්‍රමාණයක් ප්‍රදානය කෙරිණි.

විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරනු ලබන තවත් සුවිශේෂී උත්සවයක් වන්නේ උපාධි ප්‍රදානෝත්සවයයි. 49 වැනි උපාධි ප්‍රදානෝත්සවය ඔක්තෝබර් 06, 07 සහ 08 යන තෙදින තුළ කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පැවැත්විණි. විශ්ව විද්‍යාලයේ 2023 උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධිධාරීන් 3000 කට අධික සංඛ්‍යාවක් සඳහා උපාධි ප්‍රදානය කරන ලදී.

වැඩබලන උපකුලපති මහාචාර්ය උපුල් සුබසිංහ මහතාගේ ධුරකාලයෙන් පසුව, එවකට උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති ලෙස කටයුතු කළ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පද්මලාල් මහතා 2023 ජූලි 28 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස පත් කරන ලදී.

2022 වර්ෂයේ දී විශ්ව විද්‍යාලය බඳවා ගත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව 15129 ක් වූ අතර 2023 වර්ෂයේ බඳවා ගත් සංඛ්‍යාව 16215 ක් බවට වාර්තා වී ඇත. 2023 වර්ෂය තුල වැඩි වූ ශිෂ්‍ය ජනගහනය සඳහා පහසුකම් සැලසීම දුෂ්කර කර්තව්‍යයක් වුවද, එම වර්ෂය තුළ අපගේ තරුණ තරුණියන්ට ගුණාත්මක උසස් අධ්‍යාපන අත්දැකීමක් ලබාදීමට අප විශ්වවිද්‍යාලය සමත් විය. 2023 දෙසැම්බර් 31 වන දිනට, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුළු අඩුවීමක් වාර්තා විය. එනම් 2022 දී 737 ක් වූ කාර්ය මණ්ඩලය 2023 දී 733 දක්වා සුළු වශයෙන් අඩු විය.

අභියෝග හමුවේ වුවද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 2023 වසර තුළ එම අභියෝගවලට ශක්තිමත්ව මුහුණදීම තුළින් සාර්ථක අධ්‍යයන විශිෂ්ටත්වයක් අත්කර ගැනීමට විශ්ව විද්‍යාලය සමත් විය. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම සඳහා විශ්වවිද්‍යාලය සිය කාර්ය මණ්ඩල, සිසුන් සහ සමස්ත විශ්ව විද්‍යාල ප්‍රජාව සමග සහයෝගීත්වයෙන් යුතුව දැඩි අධිෂ්ඨානයකින් කටයුතු කරයි..

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්. පද්මලාල්
උප කුලපති


2023 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ නිලධාරී මණ්ඩලය

කුලපති	ඉත්තෑපානේ ධම්මාලංකාර මහ නායක නාහිමි
උප කුලපති	ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එම්.එම්.පත්මලාල් මහතා (28.07.2023 සිට) මහාචාර්යය එස්.එම්.සී.යූ.පී. සුභසිංහ මහතා (වැඩ බලන) (24.12.2022 සිට - 27.07.2023 දක්වා)

පීඨාධිපතීන්

මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය	මහාචාර්යය එස්.සී.බී.හීන්කෙන්ද මහතා
ව්‍යවහාරික විද්‍යා පීඨය	මහාචාර්යය එස්.එම්.සී.යූ.පී. සුභසිංහ මහතා
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය	ආචාර්යය ජේ.ඩබ්ලිව්.ඩී චාමින්ද මහතා
වෛද්‍ය විද්‍යා පීඨය	මහාචාර්යය එම්.ඒ.එම්.එන් ගමගේ මහත්මිය
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය	මහාචාර්යය පී.පී.ආර්.පෙරේරා
ඉන්ජිනේරු පීඨය	ආචාර්යය එම්.එන්.ධර්මවීර
තාක්ෂණ පීඨය	මහාචාර්යය ඒ.එච්.එල්.ආර්. නිල්මිණි මහත්මිය
සම සෞඛ්‍ය පීඨය	මහාචාර්යය ඩී.අයි.උළුවඩුගේ මහත්මිය
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එස්.ජී.යසවර්ධන මහත්මිය
නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය	ජ්‍යෙෂ්ඨ මහාචාර්යය පී.පී.එම් ජයවීර මහතා
පරිගණක පීඨය	මහාචාර්යය ප්‍රසාද් එම්. ජයවීර

ලේඛකාධිකාරී	ඩබ්ලිව්.එම්.ආර්.ඒ.බී. වැලිවිට මහතා
පුස්තකාලාධිපති	අචාර්යය ඩබ්ලිව්.ඩී.ඒ.එන්.ඩි. විජයසුන්දර මහත්මිය
මූල්‍යාධිකාරී	කේ.ටී.සී.ප්‍රියංගනි මහත්මිය



PIM - පශ්චාද් උපාධි කළමනාකරණ ආයතනය

FHSS - මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය

FAS - ව්‍යවහාරික විද්‍යා පීඨය

FMSC	-	කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
FMS	-	වෛද්‍ය විද්‍යා පීඨය
FGS	-	පශ්චාද් උපාධි පීඨය
FT	-	තාක්ෂණ පීඨය
FE	-	ඉන්ජිනේරු පීඨය
FAHS	-	සම සෞඛ්‍ය පීඨය
FOD	-	දන්ත වෛද්‍ය පීඨය
FUAB	-	නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය
FOC	-	පරිගණක පීඨය
DR	-	නියෝජ්‍ය ලේඛකාධිකාරී
SAR	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
AR	-	සහකාර ලේඛකාධිකාරී
DB	-	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
SAB	-	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
SAL	-	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලායාධිපති
AL	-	සහකාර පුස්තකාලායාධිපති

විශ්වවිද්‍යාලයේ පාලන බල මණ්ඩල

පාලක සභාව

1985 අංක 7 දරන විශ්වවිද්‍යාල සංශෝධන පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ VII වැනි වගන්තියේ 44 වැනි ඡේදය යටතේ විශ්වවිද්‍යාල සභාව 2023 වර්ෂයේදී පහත සඳහන් සමාජිකයිනගෙන් සමන්විත විය.

නිල බලයන්

උපකුලපති (සභාපති)



ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එම්.එම්.පත්මලාල් මහතා
(28.07.2023 සිට)
Ph.D. (Japan)
B. Sc. (USJP), M.Sc. (Japan)



මහාචාර්යය එස්.එම්.සී.යූ.පී.සුභසිංහ මහතා
(වැඩ බලන උපකුලපති)
(24.12.2022 සිට - 27.07.2023 දක්වා)
B.Sc. (Hons), Ph.D. (Wales), C.I.Biol (Sri Lanka)

ලේඛකාධිකාරී (ලේකම්)



ඩබ්ලිව්.එම්.ආර්.ඩබ්ලිව්. වැලිවිට මහතා
B.Sc. (USJP) M.Sc. (USJP)
MAAT

පීඨාධිපතිවරුන්

මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය



මහාචාර්යය එස්.සී.බී.හීන්කෙන්ද
BA (Hons); PGD in Statistics (USJ);
MSSc (Kelaniya); MA (GRIPS-Tokyo);
PhD (Nagoya)

ව්‍යවහාරික විද්‍යා පීඨය



මහාචාර්යය එස්.එම්.සී.යූ.පී.සුභසිංහ
B.Sc. (USJP), Ph.D. (Wales)
C.I. Biol (Sri Lanka)

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා



ආචාර්යය ජේ.ඩබ්ලිව්.ඩී චාමින්ද මහතා
B.Sc in Marketing (Special) (SJP)
MSc (SJP),PhD (Australia)

වෛද්‍ය විද්‍යා පීඨය පීඨය



මහාචාර්යය එම්.ඒ.එම්.එන් ගමගේ මහත්මිය
MD (Paediatrics) & DCH (COL)

පශ්චාද් උපාධි පීඨය



මහාචාර්යය පී.පී.ආර් පෙරේරා මහතා
MBBS (USJP) Phd (USJP)

තාක්ෂණ පීඨය



මහාචාර්යය ඒ.එච්.එල්.ආර්.නිල්මිණි මහත්මිය
B.Sc., PhD (Cardiff)

ඉන්ජිනේරු පීඨය



අචාර්යය එම්.එන්.ධර්මවීර මහතා
P.hd (Monash, Australia)

සම සෞඛ්‍ය පීඨය




මහචාර්යය ඩී.අයි.උළුවඩුගේ මහත්මිය
Bsc Hons (USJP), P.hd (USJP)

දන්ත වෛද්‍ය විද්‍යා පීඨය



ජ්‍යෙෂ්ඨ මහාචාර්යය. එස්.ජී.යසවර්ධන මහත්මිය
MBBS (University of Colombo),
Ph.D. (University of Colombo)

නාගරික හා ජලජ පෙළව සම්පත් පීඨය



ජ්‍යෙෂ්ඨ මහාචාර්යය.පී.පී.එම්.ජයවීර මහතා
B.Sc. (SJP), Ph.D. (Belfast),
M.I.Chem.C.

පරිගණක පීඨය



මහාචාර්යය ප්‍රසාද් එම්. ජයවීර මහතා
B.Sc. (Hons), Ph.L. and Ph.D. (Stockhol

සනාතන සහා නියෝජිතයින්



ජ්‍යෙෂ්ඨ මහාචාර්යය මයුර සමරකෝන් මහතා
සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්යය
BA (Hons), MA (USJ)



මහාචාර්යය එස්.ටී.ඩබ්.එස් යාපා මහතා
MBA (PIM- SJP); PhD (Sheffield Hallam)
BSc Industrial Management (Special) (Kelaniya)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද පාලක සභා නියෝජිතයන්



අචාර්යය කිරින්දේ අස්සජී හිමි
Ph.D. University of India
M.A of Arts (India Delhi)
ගංගාරාම විහාරස්ථානයේ විහාරාධිපති



අචාර්යය බලංගොඩ සෝභිත හිමි
Ph.D (SJP) රාජකීය පණ්ඩිත
MPhil (Col) BAT (Col)



අචාර්යය ඒ.එම්.මුබාරක් මහතා
Bsc. Chemistry (Hons) UOM PhD
හිටපු අධ්‍යක්ෂ, ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ (CISIR)ආයතනය



අචාර්යය රවි ලියනගේ
B.Sc.(SJP), MBA(Col), Ph.DMft(USA)
Mktg (SL), CGEM (MOR)
FSLIM, MAAT සභාපති, රයිගම් සමූහ ව්‍යාපාරය



සුජීව රාජපක්ෂ මහතා
ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරී
MBA (PIM) මහජන බැංකු සභාපති



රෝලන්ඩ් මුණසිංහ මහතා
Attorney at Law



ඒ.ඒ.ආරියරත්න මහතා
B.Sc. In Estate Mng. &Val
Dip in Personnel Mgt
Diploma in General Admin
උප සභාපති - මාර්ග සංවර්ධන අධිකාරිය



දර්ශනා සේනානායක මහත්මිය
M.A. in Econ (COL) M.A.in Buddhist Studies (KEL) B.A. (Special) Economics (SJP), විශ්‍රාමික SLAS නිලධාරිනි



මහින්ද රණසිංහ මහතා
B.Sc.Applied Science (SJP)
කළමනාකරණ අධ්‍යක්ෂ, ෆින්ගල් ලංකා පුද්ගලික සමාගම
(12.01.2023 දක්වා)



අශෝක හෙට්ටිගොඩ මහතා
MBA Bus Mgt. (PIM), B.Sc. Computer Science (Northwestern Uni)
කළමනාකරණ අධ්‍යක්ෂ, හෙට්ටිගොඩ සමූහ ව්‍යාපාර (12.01.2023 දක්වා)



එච්.ටී.කමල් පත්මසිරි මහතා
Master of Pub. Adm.
හිටපු පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්
(12.01.2023 දක්වා)



සිරි රණසිංහ මහතා
B.A.Vidyodaya
ප්‍රධාන කතෘ - ලංකාදීප පුවත්පත
(12.01.2023 දක්වා)



ඩබ්ලිව්.කේ.එච්.වගපිටිය මහතා
Master of Business Administration (M.B.A.)
PIM B.Sc. (SJP)
සභාපති - ලාෆ් හොල්ඩින්ස් සමාගම
(12.01.2023 දක්වා)



සම්මානිත මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා
D.Litt. (SJP), D.Litt. (VPA), Ph.D.
Sinhala (vidyodaya)
(12.01.2023 දක්වා)



ප්‍රදීප් යාපාරත්න මහතා
B.A (Special) (USJP)
PG Dip (USJP)
M.A (Socialogy) (USJP)
ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශීය කටයුතු
හා පළාත් පාලන අමාත්‍යාංශය.
(24.01.2023 සිට)



සජීව මැදවත්ත මහතා
B.A (Special) (USJP)
PG Dip (USJP) (Criminology)
M.A (Criminology) (USJP)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
(24.01.2023 සිට)



අචාර්යය අතුල පතිනායක මහතා
Attorney at Law
Legal Practitioner (Victoria)
Phd, LLM, MBA
විදුහල්පති, ශ්‍රී ලංකා නීති විද්‍යාලය
(24.01.2023 සිට)



ඉන්ජිනේරු අනුර ගුණරත්න මහතා
Bsc.Eng.
Consultant MEP Engineer
ASG
(24.01.2023 සිට)



සම්මානිත මහාචාර්යය අරියරත්න කළුආරච්චි මහතා
BFA (Kelaniya), MAQ (USJP)
MA (Kalkata)
හිටපු උපකුලපති
සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය
(24.01.2023 සිට)



එච්.සී.ඩී.එල්.සිල්වා මහතා
MPM, Bsc.Pub.Admin (Hon)
FPFA, CBA, MAAT, CIPFA
අධ්‍යක්ෂ ජෙනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම්
දෙපාර්තමේන්තුව
(24.01.2023 සිට)

පාලක සභාවේ අනු කමිටු

(i) **විශ්වවිද්‍යාල මූල්‍ය කමිටුව**

සභාපති	-	උපකුලපති
ලේකම්	-	මූල්‍යාධිකාරී
සමාජිකයින්	-	පාලක සභා නියෝජිතයින් 04 දෙනෙකු
		ලේඛකාධිකාරී
		සියලුම පීඨ වල පීඨාධිපතිවරුන්
ආරාධිත	-	නියෝජ්‍ය මූල්‍යාධිකාරී **(**වැටුප්**)**
		නියෝජ්‍ය මූල්‍යාධිකාරී **(**තාක්ෂණ පීඨය**)**
		නියෝජ්‍ය මූල්‍යාධිකාරී **(**සැපයුම්**)**
		නියෝජ්‍ය මූල්‍යාධිකාරී **(**මානව ශාස්ත්‍ර පීඨය**)**
		ජ්‍යෙෂ්ඨ සහාකාර මූල්‍යාධිකාරී **(**වෛද්‍ය පීඨය**)**
		ජ්‍යෙෂ්ඨ සහාකාර මූල්‍යාධිකාරී **(**කළමනාකරණ පීඨය**)**
		ජ්‍යෙෂ්ඨ සහාකාර මූල්‍යාධිකාරී **(**ගෙවීම්**)**
		ජ්‍යෙෂ්ඨ සහාකාර මූල්‍යාධිකාරී **(**ව්‍යවහාරික විද්‍යා පීඨය**)**
		සහාකාර මූල්‍යාධිකාරී **(** බාහිර විභාග**)**
		ජ්‍යෙෂ්ඨ සහාකාර අභ්‍යන්තර විගණක

(ii) නිවාඩු සහ ප්‍රදාන කමිටුව

සභාපති	-	උපකුලපති
ලේකම්	-	නියෝජ්‍ය ලේඛකාධිකාරී **(**අධ්‍යයන ආයතන අංශය**)**
සමාජිකයින්	-	ලේඛකාධිකාරී
		සියලුම පීඨ වල පීඨාධිපතිවරුන්

(iii) විගණන හා කළමනාකරණ කමිටුව

සභාපති	-	නම් කරන ලද පාලක සභා නියෝජිතයකු
සමාජිකයින්	-	නම් කරන ලද පාලක සභා නියෝජිතයින් 04 දෙනෙකු
ආරාධිත	-	උපකුලපති
		ලේඛකාධිකාරී
		මූල්‍යාධිකාරී
කැඳවුම්කරු	-	ජ්‍යෙෂ්ඨ සහාකාර අභ්‍යන්තර විගණක
නිරීක්ෂක	-	විගණන අධිකාරී – ජාතික විගණන කාර්යයාලය
		ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

(iv) සැලසුම් හා සංවර්ධන කමිටුව

සභාපති	-	උපකුලපති
සමාජිකයින්	-	ලේඛකාධිකාරී
		මූල්‍යාධිකාරී
		සියලුම පීඨ වල පීඨාධිපතිවරුන්
		අධ්‍යනාංශපති/ සිවිල් ඉන්ජිනේරු අධ්‍යයනාංශය
		අධ්‍යනාංශපති / යාන්ත්‍රික ඉන්ජිනේරු අධ්‍යයනාංශය
		අධ්‍යනාංශපති / විදුලි හා විද්‍යුත් ඉන්ජිනේරු අධ්‍යයනාංශය
		වැඩ ඉන්ජිනේරු
		ව්‍යාපෘති ඉන්ජිනේරු **(**ප්‍රාග්ධන හා සැලසුම් අංශය**)**
කැඳවුම්කරු	-	නියෝජ්‍ය ලේඛකාධිකාරී **(**ප්‍රාග්ධන හා සැලසුම් අංශය**)**
නිරීක්ෂක	-	නම් කරන ලද පාලක සභා නියෝජිතයකු

සනාතන සභාව

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 වැනි ඡේදය යටතේ පත්කළ සාමාජිකයන්ගෙන් සනාථන සභාව සමන්විත වේ.

සනාතන සභාවේ අනු කමිටු

(i) බාහිර උපාධි කමිටුව

(ii) පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුව

(iii) පරිගණක කමිටුව

2023 වර්ෂයේ පැවති රැස්වීම්

පාලක සභාව, සනාථන සභාව ඇතුළු නම් කරන ලද කමිටු ඇතුළු අනෙකුත් බලධාරීන් 2023 වර්ෂය තුළ පහත පරිදි රැස්වී ඇත

රැස්වීම	රැස්වීම් ගණන
පාලක සභා	15
සනාතන සභා	12
මුදල් හා ප්‍රාග්ධන කිමිටු	12
නිවාඩු හා ප්‍රදාන කමිටු	12
පර්යේෂණ සභා කමිටුව	12
බාහිර විභාග කමිටුව	12
සැලසුම් සහ සංවර්ධන කමිටුව	12
විගණන සහ කළමනාකරණ කමිටුව	06

යෙදවුම්

මානව ප්‍රාග්ධනය

ශිෂ්‍යයින්
කාර්ය මණ්ඩලය



හවුල්කාරිත්වය සහ ජාල සහයෝගීතාව

සේවා යෝජකයින්
ආදි විද්‍යාර්ථීන්



මූල්‍ය ප්‍රාග්ධනය

මුළු වත්කම්
රුපියල් බිලියන 29 යි
සමුච්චිත අරමුදල්
රුපියල් බිලියන 22 යි



යටිතල පහසුකම්
විශ්වවිද්‍යාල යටිතල
පහසුකම්
තාක්ෂණ



ස්වභාවික ප්‍රාග්ධනය

අපගේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සිදු කිරීමේදී පරිභෝජනය කරන ස්වභාවික සම්පත් එනම් බලශක්තිය, කඩදාසි, විමෝචන සහ අපද්‍රව්‍ය



අපගේ පාර්ශවකරුවන්ගේ ප්‍රයෝජනය උදෙසා උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ

අවස්ථා සඳහා පහසුකම් සැලසීම පිණිස ලෝක මට්ටමේ අධ්‍යයන පරිසරයක් නිර්මාණය කිරීම

දක්ෂ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ අධ්‍යයන විශිෂ්ටත්වය පිළිබඳ වාර්තාවක් සහිත විශේෂඥ සංචිතයක් තබා ගැනීම.

ආරාධිත දෙසුම් හරහා කර්මාන්තයේ ප්‍රවීණයන් විසින් අදාළ කර්මාන්ත/ක්ෂේත්‍ර දැනුම ලබාදීම.

වර්තමාන දේශීය හා ගෝලීය අභියෝග සහ ගැටළු විසඳීම කෙරෙහි පර්යේෂණවල අවධානය යොමු කිරීම. එමගින් සමාජයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීම

සිසුන්ගේ දැනුම නුවමාරුව සහ පර්යෙයේෂණවල නියැලීම සහතික කිරීම සඳහා නවීන සහ පර්යේෂණ මූලික ඉගැන්වීම් ශිල්පීය ක්‍රම ක්‍රියාත්මක කිරීම

මූලිකව රජයේ ප්‍රදාන හරහා අරමුදල් සපයනු ලැබේ. එමෙන්ම උපකාරක පන්ති ගාස්තු, පරිත්‍යාග සහ ආයෝජන ආදායම හරහාද ආදායම් උත්පාදනය කරනු ලැබේ.

ප්‍රජාව මුහුණ දෙන අභියෝග/ප්‍රශ්න විසඳීමට සහ උපාධිධාරීන් සඳහා අවශ්‍ය කුසලතා අවශ්‍යතා සහ සිසුන්ගේ අධ්‍යයන අවශ්‍යතා සඳහා හඳුනාගැනීම සඳහා පාර්ෂවකරුවන් සමඟ එක්ව කටයුතු කිරීම.

ප්‍රතිදාන

ශිෂ්‍යයින්ගේ තෘප්තිමත් බව

- සියලුම විෂයයධාරා හරහා තම අදාළ පාඨමාලා සඳහා තරඟ වදින ඉහළ සිසුන් සංඛ්‍යාවක් සිටීම.

- ශිෂ්‍ය තෘප්තිමත් බව පිළිබඳ සමීක්ෂණයේ විශිෂ්ට ලකුණු ලැබීම

උපාධියේ ගමනාන්ත

- වෘත්තීය ක්ෂේත්‍රයේ උපාධිධාරී රැකියා සඳහා ඉහළ අනුපාත සහතික කිරීම හෝ උසස් අධ්‍යයන කටයුතුවල අඛණ්ඩව නියැලීම.

පර්යේෂණ නිමැවුම්

- පර්යේෂණ ප්‍රකාශන වැඩි සංඛ්‍යාවක් පළකිරීම.

- පර්යේෂණ ප්‍රදාන වැඩි වශයෙන් වෙන් කිරීම.

කීර්තිය

- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ පුරෝගාමියෙකු ලෙස පිළිගැනීමට ලක්වීම.

- ජාත්‍යන්තර සහයෝගීතා වැඩි ප්‍රමාණයක් හරහා ගෝලීය අවධානය වැඩි කිරීම.

- ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල ඉහළට පැමිණීම.

මූල්‍ය ස්ථාවරත්වය

- **විශිෂ්ට ඉගැන්වීම් සහ ඉගෙනුම් අත්දැකීමක් ලබාදීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පවතින බවට සහතික කිරීම සඳහා ශක්තිමත් ශේෂ පත්‍රයක් සකස් කිරීම.**

ප්‍රතිඵල

මානව ප්‍රාග්ධනය

ශිෂ්‍යයින්

- **සිසුන්ගේ පසුබිම නොතකා ඔවුන්ට අවස්ථා ලබාදීම**

- **විශිෂ්ට සම්පත් සමඟ ගුණාත්මක ඉගෙනුම් අත්දැකීමක් ලබාදීම**

කාර්ය මණ්ඩලය

- ඔවුන්ගේ විශේෂඥතාව සහ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා වෘත්තීය සංවර්ධන අවස්ථා ලබා දීම.

- ආකර්ශනීය වේතන ලබාදීම.

හවුල්කාර සංවිධාන

- අමතර වටිනාකමක් ලබා ගැනීම සඳහා සේවා යෝජකයන් සහ අනෙකුත් විශ්ව විද්‍යාල සමඟ සමීප හවුල්කාරිත්වයන් ගොඩනගාගැනීම සහ වර්ධනය කිරීම

ආදි සිසුන්

- **වෘත්තීය රැකියා අවස්ථා හෝ අනාගත අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් උපාධිධාරීන්ට සහාය ලබා දීම. වෘත්තීන්හි නියැලී සිටින ආදි සිසුන්ගේ ගෝලීය ජාලයක් වත්වාගෙන යාම.**

ප්‍රාදේශීය ප්‍රජාව

- ප්‍රජාව සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නිපුණතා සහිත දක්ෂ උපාධිධාරීන් බිහි කිරීම.

- රැකියා අවස්ථා ලබා දීම.


- වත්මන් දේශීය හා ගෝලීය අභියෝග හා ගැටලු විසඳීම කෙරෙහි පර්යේෂණවල අවධානය යොමු කිරීම.

අරමුදල් සපයන්නන් සහ නියාමකයින්

- රජයේ අරමුදල් සහ පරිත්‍යාග වගකීමෙන් යුතුව භාවිතා කිරීම.

- ධනාත්මක සමාජ ප්‍රතිඵලවල සාක්ෂාත් කර ගැනීමට සහය දැක්වීමට අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සබඳතාවයක් පවත්වාගෙන යාම.

ආයතනික පාලන රාමුව



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආයතනික පාලනය

2018 වර්ෂය තුළ සිදු කරන ලද සියලුම කාර්යයන්හි ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව යහ පාලන පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලය කැපවී සිටී. මෙමගින් අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට අනුකූල වීම, ගනුදෙනුවල විනිවිදභාවය, වගවීම සහ රජයේ අරමුදල් පිළිබඳ වගකීම වැඩි දියුණු කරයි.

1) අංක 16 1978 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූල වීම.

- කවුන්සිලය, සනාතන සභාව සහ පීඨ මණ්ඩල සංයුතිය පනත මගින් තීරණය කර ඇති අතර ඒ අනුව විශ්වවිද්‍යාල පාලන ආයතන සඳහා සියලුම පත්වීම් විශ්වවිද්‍යාල පනතේ දක්වා ඇති විධිවිධාන අනුව සිදු කර ඇත.

- විශ්වවිද්‍යාල කවුන්සිලය විශ්වවිද්‍යාලයේ විධායක සහ පාලන අධිකාරිය ලෙස ක්‍රියා කරයි. සාමාන්‍ය පරිපාලන, අධ්‍යයන සහ මූල්‍ය ප්‍රතිපත්ති තීරණ ගනු ලබන්නේ සෙනෙට් සභාවේ, මූල්‍ය කමිටුවේ සහ විශ්වවිද්‍යාලයේ අනෙකුත් අනු කමිටුවල නිර්දේශයෙනි.

- විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධිකාරිය ලෙස සෙනෙට් සභාව පත් කර ක්‍රියා කරයි .සෙනට් කවචයට විශ්වවිද්‍යාලයේ උපදෙස්, අධ්‍යාපනය, පර්යේෂණ සහ විභාග පාලනය සහ සාමාන්‍ය මඟ පෙන්වීම යනාදිය ඇතුළත්ය.

- කවුන්සිලයේ සහ සෙනෙට් සභාවේ ගණපූරණය, පැවැත්විය යුතු අවම රැස්වීම් සංඛ්‍යාව, කවුන්සිලයෙහි කාලසීමාව, සභා බලතල විෂය පථය සහ මණ්ඩලවල කාර්යයන් ද පනතේ දක්වා ඇත. විශ්වවිද්‍යාලය නිශ්චිත අවශ්‍යතාවලට අනුකූල වී ඇත.

- සාමාන්‍ය පරිපාලන, අධ්‍යයන පරිපාලන සහ මූල්‍ය පරිපාලන පනතේ විධිවිධාන අනුව සිදු කෙරේ

- සියලුම උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වෙන් කරන ලද අතර සියලුම උපාධි වැඩසටහන් සඳහා විෂයමාලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති අයවැය ප්‍රතිපාදන සහ වියදම් වාර්ෂික අයවැයේ දක්වා ඇති නිශ්චිත අයවැය රේඛාව ලෙස සලකා වියදම් දරා ඇත.

2) රජයේ මූල්‍ය රෙගුලාසි සහ රජයේ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම.

ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයන රාජ්‍ය ආයතනයක් ලෙස, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ගිල්ඩ් ලයින් සහ චක්‍රලේඛවලට අනුකූලව විශ්වවිද්‍යාලයේ සියලුම මූල්‍ය ගනුදෙනු සිදු කර වාර්තා කරනු ලැබේ.

3) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල වීම.

ශ්‍රී ලංකාවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව 2018 වර්ෂය තුළ සියලුම භාණ්ඩ හා සේවා, වැඩ, ඉදිකිරීම් සහ උපදේශන ලබාගෙන ඇත. උපකුලපතිවරයාගේ නිර්දේශය ඇතිව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ප්‍රසම්පාදන කමිටු පත් කරනු ලැබේ. ප්‍රසම්පාදන කමිටුවල නිර්දේශ ඇතිව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කෙරේ. ලංසු ලේඛන සකස් කිරීම, ලංසු විවෘත කිරීම, ලංසු ලියකියවිලි,

ලංසු ඇගයීම, ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු සංයුතිය, කමිටු වෙත ගෙවීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධාන අනුව සිදු කෙරේ.

4) ආයතන සංග්‍රහය සහ බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල වීම.

වැටුප්, පත්වීම්, උසස්වීම්, වර්ධක, නිවාඩු, විනය ක්‍රියාමාර්ග ඇතුළු සියලුම කාර්ය මණ්ඩල කටයුතු විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ සහ බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන මගින් පාලනය කරයි. කිසියම් කරුණක් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයෙන් ආවරණය නොවන්නේ නම්, එය ශ්‍රී ලංකාවේ රජයේ ආයතන සංග්‍රහය වෙත යොමු වේ. වැටුප් හා දීමනා ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ මගින් වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සම්මත කරනු ලැබේ.

5) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS), ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS)

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කෙරේ. ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් රාජ්‍ය අංශයේ ගනුදෙනු හඳුන්වා දී නොමැති අවස්ථාවල ගනුදෙනු වාර්තා කිරීම සඳහා භාවිත වේ.

6) අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන මගින් ආවරණය නොවන සහ ව්‍යවස්ථාපිත විධිවිධාන මගින් දක්වා ඇති විෂය පථය තුළ, සභාවේ අනුමැතිය ඇතිව අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සම්මත කර ඇත. උදා:- රාජකාරි වෙන් කිරීම, අනුමැතිය, අවසරය සහ සහතික කිරීමේ සීමාවන් ආදිය.

විගණන කමිටු වාර්තාව

හැඳින්වීම

යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයේ 07.4.1 ඡේදයේ විධිවිධාන යටතේ 2023 වසර සඳහා පත් කරන ලද විගණන කමිටුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (USJ) විධායක නොවන, ස්වාධීන පාලක සභා සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

2023 වර්ෂයේදී, ලේඛකාධිකාරීවරයා, මුදල් භාරකරු සහ අදාළ පරිපාලන කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් විගණන කමිටු රැස්වීම් හයක් (06) පවත්වන ලදී. ශ්‍රී ලංකා විගණකාධිපතිවරයාගේ නියෝජිතයා වන විශ්වවිද්‍යාල විගණන අධිකාරීවරයා ද මෙම අවස්ථාවට සහභාගී විය. මීට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණකවරයාද මෙම රැස්වීමට සහභාගි විය. යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශවල දක්වා ඇති විෂය පථයට අනුව විගණන කමිටුව විසින් සිය රාජකාරි ඉටු කරනු ලබන අතර මූල්‍ය කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහාත් විශ්වවිද්‍යාලයේ පරිපාලන ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සඳහාත් අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.

ප්‍රගතිය

සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටුව විසින් පහත සඳහන් කරුණු ඇතුළුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියාවලි ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරමින්, නිර්දේශ, උපදෙස් සහ යෝජනා කිහිපයක් ඉදිරිපත් කර ඇත.

(අ) මූල්‍ය ප්‍රකාශනයේ විශ්වසනීයත්වය සහතික කිරීම

(ආ) විශ්ව විද්‍යාලයට සිය වත්කම් සුරක්ෂිත කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් තිබෙන බව සහතික කිරීම.

(ඇ) අදාළ ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ඇතුළුව නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බව අධීක්ෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාලය මගින් ක්‍රවේදයක් පවත්වාගෙන යන බවට සහතික කිරීම

(ඈ) අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධයෙන් සමස්ත අධීක්ෂණයක් සිදු කිරීම සහ අදාළ වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීම,

සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද වැදගත් කාර්යයන් පහත පරිදි සාරාංශ කර ඇත

- සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාල අභ්‍යන්තර විගණන අංශය මගින් පීඨ හතට අදාළව නිකුත් කරන ලද වාර්තා ඇතුළු අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කර ඇගයීමට ලක් කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- විගණකාධිපතිවරයාගේ නියෝජිතයා සමඟ සම්බන්ධ වී විගණකාධිපතිවරුන්ගේ විගණන විමසුම් සහ වාර්තාවල පෙන්වා දී ඇති දුර්වලතා සහ අඩුපාඩු පිළිබඳ පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීමට නිලධාරීන්ට සහ විශ්වවිද්‍යාල අභ්‍යන්තර විගණකවරයාට උපදෙස් ලබා දීම.
- විගණන විමසුම් සහ එහි පසු විපරම් කටයුතු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රතිචාර අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී.
- බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම් හේතුවෙන් අතපසු වූ අයවීම් නැවත අය කර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව අධීක්ෂණය කිරීම
- සමාලෝචන කටයුතු සහ ඇගයීම් කටයුතු සිදු කිරීමෙන් අනතුරුව මානව සම්පත් සංවර්ධනය, සේවකයින්ගේ පැමිණීම, භාණ්ඩ ලේඛනය සත්‍යාපනය කිරීම, නේවාසිකාගාර ගාස්තු සහ හිඟ මුදල්, ප්‍රාග්ධන කොන්ත්‍රාත්තු පරිපාලනය, පර්යේෂණ ප්‍රදාන, ප්‍රසම්පාදන, වැටුප් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, වත්කම් කළමනාකරණය, ගිවිසුම්ගත සේවා, බඳවා ගැනීම්, උසස්වීම්, විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම, බැඳුම්කර සහ ගිවිසුම්

උල්ලංඝනය කිරීම, පාරිසරික කළමනාකරණය යනාදිය සම්බන්ධයෙන් පවත්නා පද්ධති වැඩි දියුණු කිරීම සඳහාත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද සකස් කිරීම සඳහාත් නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

- අභ්‍යන්තර විගණන අංශය, පහත සාරාංශගත කර ඇති ආකාරයට 2023 වර්ෂය සඳහා එහි අනිවාර්ය සාමාන්‍ය පූර්ව විගණන ක්‍රියාකාරකම් සිදු කිරීමට අමතරව එහි වාර්ෂික විගණන සැලැස්ම සකස් කර ඇත.

විස්තරය	**ගොනු සංඛ්‍යාව**
විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල (ස්ථිර)	102
විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල (තාවකාලික)	452
විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීම	72
විශ්‍රාම වැටුප් ප්‍රතිස්ථාපනය	66
බැඳුම්කර සහ ගිවිසුම් ගණනය කිරීම	73
හිඟ වැටුප්	24
ඉදි කිරීම් කොන්ත්‍රාත්තු සඳහා ගෙවීම	134
ගිවිසුම්ගත සේවා සඳහා ගෙවීම් සිදු කිරීම (ආරක්ෂක සේවා, පිරිසිදු කිරීමේ සේවා, මුරකරු සහ සනීපාරක්ෂක කම්කරුවන්, උද්‍යාන නඩත්තු සේවාව, ගලි සේවාව)	154

රාජ්‍ය විගණන විමසුම් සඳහා පිළිතුරු

විගණකාධිපතිවරයාගෙන් ලැබුණු සියලුම විගණන විමසුම් සඳහා කාලෝචිතව ප්‍රතිචාර දක්වා ඇත.

අභ්‍යන්තර විගණන විෂය පථය ආවරණය කිරීම

අභ්‍යන්තර විගණන අංශ විසින් අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම ඉක්මවා සිය විගණන කටයුතු පුළුල් කර ඇත. වර්තමානයේ අභ්‍යන්තර විගණන අංශය විශ්වවිද්‍යාලයේ පමණක් නොව පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ (PIM) ද අභ්‍යන්තර විගණන කටයුතු දක්වා පුළුල් කර ඇත.

ඉදිරි ප්‍රගතිය

විශ්ව විද්‍යාලයේ පද්ධති සහ පාලන කටයුතු අඛණ්ඩව වැඩිදියුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, එහි මූල්‍ය හා පරිපාලන ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සඳහා පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් පද්ධති සහ පාලන සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විගණන කමිටුව සිය අරමුණු තවදුරටත් පුළුල් කිරීමට සැලසුම් කරමින් සිටී.

සුජීව රාජපක්ෂ

සභාපති, විගණන කමිටුව

අත්සන ඉංග්‍රීසි ලේඛනයේ සඳහන් වේ

පැවති ආර්ථික පසුබෑම මධ්‍යයේ වුවද, 2023 වසර තුළ විශ්ව විද්‍යාලය එහි තිරසාර ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවන ලදී. දුෂ්කරතා මධ්‍යයේ වුවද විශ්ව විද්‍යාලය තිරසාරත්වය කෙරෙහි සිය ප්‍රමුඛ අවධානය යොමු කළ අතර කාබන් උදාසීන කිරීම සඳහා ද පියවර ගන්නා ලදී. ව්‍යාපෘතියක සඵලතාවය තක්සේරු කිරීමේදී සහ එහි තිරසාරභාවය පිළිබඳව වාර්තා කිරීමේදී අපි සැමවිටම එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) 17 ට අනුකූලව කටයුතු කරන්නෙමු. වෙනත් සෑම අවස්ථාවකටත් වඩා, 2023 වර්ෂයේදී පුළුල් පරාසයක විභිදුණු අරමුණු පිළිබඳව වාර්තා කිරීමට සහ ප්‍රතීතනය ලබා ගැනීමට CFSට හැකි විය. ව්‍යාපෘති ප්‍රතිඵල සහ ප්‍රගතිය යාවත්කාලීන කිරීම පිළිබඳ තොරතුරු පහත වාර්තාවේ සවිස්තරව දැක්වේ.

පසුගිය වසරවල මෙන්ම, ප්‍රධාන උපායමාර්ගික තිරසාර ක්ෂේත්‍ර අරමුණු හයක් මෙම වාර්තාව මගින් ඉදිරිපත් කරනු ලබන අතර "තිරසාරභාවය පිළිබඳ ඉදිරි අපේක්ෂාවන්: 2019 දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය" හි දක්වා ඇති ක්‍රමවේදයට අනුකූලව මෙම වාර්තාව සකස් කර ඇත.

1. ඉගෙනුම හා අධ්‍යාපනය
2. පර්යේෂණ හා සංවර්ධන: පර්යේෂණ, ප්‍රකාශන, මහජන සහභාගීත්වය. නිර්මාශීලිබව සහ නවෝත්පාදනය
3. මහජනතාව
4. යටිතල පහසුකම්
5. විශිෂ්ට ශිෂ්‍ය අත්දැකීම්
6. යාව ජීව ප්‍රජාව, සමාජ වගකීම, ජාතික සංවර්ධනය සහ ගෝලීය/කලාපීය

සියලුම උපාය මාර්ගික ඉලක්ක තුලින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක 17න් එකක් හෝ කිහිපයක් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිතය. එක් එක් උපායමාර්ගික ඉලක්ක මගින් ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගත් ආකාරය පිළිබඳ සාක්ෂි සහ නිදසුන් මෙන්ම බලපෑම් ශ්‍රේණිගත කිරීම් (Impact Rankings) පිළිබඳ යාවත්කාලීන තොරතුරු සහ 2023 වර්ෂයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා අපගේ විශ්ව විද්‍යාලය විසින් අනුගමනය කරනු ලබන අනෙකුත් ක්‍රම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවට ඇතුළත් කර තිබේ.

1. ඉගෙනුම් හා අධ්‍යාපනය

තෝරාගත් මූලික අරමුණු:

1.1 අධ්‍යාපනයේ සෑම අංශයකම ගුණාත්මක බව සහතික කිරීම සහ ගෝලීය මට්ටමේ ප්‍රතීතනය ලබා ගැනීම.


1.2 විමසාබැලීම සහ සක්‍රීය ඉගෙනුම් ක්‍රමවේද තුළින් ඉගෙනුම ලැබීම සඳහා සෑම සිසුවෙකුගේම ශක්‍යතාව වර්ධනය කිරීම.

2023 බලපෑම් ශ්‍රේණිගත කිරීම්වලදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය කැපී පෙනෙන ප්‍රගතියක් අත් කර ගෙන තිබේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ටයිම්ස් උසස් අධ්‍යාපන (**THE)** බලපෑම් ශ්‍රේණිගත කිරීම්වල දී(**Times Higher Education (THE) Impact Rankings**) කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කරමින් සමාජ වගකීම් සහ තිරසාර සංවර්ධනය සඳහා විශ්ව විද්‍යාලය කැපවී ඇති ආකාරය විදහා දක්වයි.

නවතම ශ්‍රේණිගත කිරීම් වලදී, විශ්ව විද්‍යාලයේ ස්ථාවර ඉදිරි ගමන් මග විද්‍යමාන වේ :

2021 වර්ෂයේ ශ්‍රේණිගත කිරීමේ දී විශ්ව විද්‍යාලය **801-1000** පරාසය තුළ පැවැති අතර එය සැලකිය යුතු ජයග්‍රහණයක් සනිටුහන් කළේය. **2022** වර්ෂයේ දී, විශ්ව විද්‍යාලය සිය ස්ථානය **801-1000** පරාසය තුළ පවත්වා ගෙන ගිය අතර එමගින් ස්ථාවර කාර්ය සාධනයක් පෙන්නුම් කරයි. **2023** වර්ෂයේ දී, විශ්ව විද්‍යාලය **601-800** පරාසය අතර ස්ථානයක් ලබා ගනිමින් ඉදිරියට ගොස් ඇති අතර, එමගින් විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ කැපවීම සහ උත්සාහය විදහා දක්වයි.



ශ්‍රේණිගත කිරීම් සඳහා පදනම් කර ගෙන ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දක්වා ඇති නිශ්චිත තිරසාර සංවර්ධන ඉලක්ක (**SDGs)** සාක්ෂාත් කර ගැනීමේ දී විශ්ව විද්‍යාලයීය කාර්ය සාධනයයි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ප්‍රධාන තිරසාර සංවර්ධන ඉලක්ක (**SDGs**) කිහිපයක් සාක්ෂාත් කර ගනිමින් විශිෂ්ටත්වයට පත්ව ඇත.


තිරසාර සංවර්ධන ඉලක්ක අංක 7 (SDG 7) (දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය): දැරිය හැකි සහ පිරිසිදු බලශක්ති විසඳුම් භාවිතය, පාරිසරික තිරසාරභාවයට දායකවීම සහ දේශගුණික විපර්යාසවලට එරෙහිව සටන් කිරීම හේතුවෙන් විශ්ව විද්‍යාලය 74.1 ක ගෝලීය ශ්‍රේණියක් ලබා ගෙන ඇති අතර, එමගින් විශ්ව විද්‍යාලය ඒ සඳහා කැපවී ඇති ආකාරය පෙන්නුම් කරයි.

තිරසාර සංවර්ධන ඉලක්ක අංක 1 (SDG 1) **(**දරිද්‍රතාවය නොමැත): දරිද්‍රතාවය තුරන් කිරීම සහ වඩාත් සාධාරණ සමාජයක් බිහි කිරීමේ අරමුණින් සැමට සහභාගීත්ව අවස්ථා නිර්මාණය කිරීම සඳහා ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 60.3 ක ගෝලීය ශ්‍රේණියක් ලබා ගනිමින්, විශ්ව විද්‍යාලයට කිර්තියට පත්ව ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක අංක 2 (SDG 2) **(**කුසගින්නෙන් තොර): ආහාර සුරක්ෂිතතාව සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා දරන ලද නොපසුබට උත්සාහයක් වෙනුවෙන් විශ්ව විද්‍යාලය **48.3** ක ආකර්ෂණීය ගෝලීය ශ්‍රේණියක් ලබාගෙන තිබෙන අතර කුසගින්න තුරන් කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගවලින් සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක අංක 17 (SDG 17) (ඉලක්ක සඳහා හවුල්කාරිත්වය): එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අර්ථවත් සහයෝගීතා සහ හවුල්කාරිත්වයන් ගොඩනගා ගනිමින් විශ්ව විද්‍යාලය සිය සාර්ථකත්වය සනාථ කර ඇති අතර 45.3 ගෝලීය ශ්‍රේණියක් ලබා ගැනීමට විශ්ව විද්‍යාලය සමත්ව ඇත.

බලපෑම් ශ්‍රේණිගත කිරීමේ දී (Impact Rankings) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ස්ථාවර ප්‍රගතිය සමාජය, පරිසරය සහ ආර්ථිකය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම සඳහා දරනු ලබන උත්සාහයන් පිළිබඳව අවධාරනය කරනු ලබයි. නව්‍ය පර්යේෂණ, ප්‍රජා සහභාගීත්වය සහ වගකීම් පරිචයන් හරහා, විශ්ව විද්‍යාලය දේශීය හා ගෝලීය ප්‍රජාවන් තුළ තිරසාර වෙනසක් ඇති කිරීමට ආදර්ශයක් සපයයි.



2. පර්යේෂණ සහ සංවර්ධනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJ) තිරසාරත්වය සඳහා කටයුතු කරමින් පාරිසරික, සමාජීය සහ ආර්ථික ස්ථාවරත්වය ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වැඩි දියුණු කරයි. ගත වූ මාස කිහිපය තුළ, ව්‍යවහාරික විද්‍යා, වෛද්‍ය, තාක්ෂණ, ඉංජිනේරු, කළමනාකරණ සහ උපාධි අධ්‍යයන පීඨවල පර්යේෂකයන් විසින් Elsevier Scopus මගින් සුවිගත කරන ලද සඟරාවල සිය ප්‍රකාශන එළි දක්වන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ (USJ) අධ්‍යයන අංශ කිහිපයක පර්යේෂකයන් පනස් දෙදෙනෙකු මෙම ජයග්‍රහණයට දායකත්වය ලබා දුනි.

2023 (ජාතික කුසලතා සම්මාන උළෙලේ දී) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය උපාධි අපේක්ෂකයින්ගේ NeuroX සඳහා SLASSCOM කුසලතා සම්මානය හිමි විය | විප්ලවීය



ස්නායු රෝග විනිශ්චය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් විසින් සංවර්ධනය කරන ලද NeuroX ව්‍යාපෘතිය, 2023 SLASSCOM ජාතික කුසලතා සම්මාන උළෙලේ දී (National Ingenuity Awards 2023) ඇගයීමට ලක් විය. හොඳම නව්‍ය නිෂ්පාදන/ව්‍යාපෘතිය ලෙස විශ්වවිද්‍යාල කාණ්ඩයේ ජාතික මට්ටමේ අනුශූරතාව දිනා ගැනීමට මෙම ව්‍යාපෘතියට හැකි වූ අතර පළාත් මට්ටමේ ජයග්‍රාහකයා ලෙස ද සම්මානයට පාත්‍ර විය. NeuroX යනු ස්නායු ආබාධ හඳුනාගැනීම සඳහා රේඛා ඇඳීමේ තාක්ෂණය සහ මොඩියුලීකරණය කරන ලද වේදිකාවක් යොදා ගන්නා උපකරණයකි. ග්‍රැෆික් ටැබ්ලටයක් මත (graphic tablet) ඉලෙක්ට්‍රොනික පෑනක් භාවිතයෙන් නිර්මාණය කරන ලද එක් ඉරකින් චිත්‍ර ඇඳීම (single stroke of art) මගින් ස්නායු රෝග හඳුනා ගැනීමට එයින් හැකියාව ලැබේ. රෝගියා සහ වෛද්‍යවරයා අතර මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියා කරමින්, ලබාගත් ප්‍රතිඵල මත පදනම්ව පරිශීලකයාගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව නිගමනවලට එළඹීමට මෙම උපාංගය මගින්

දෙපාර්ශවයටම හැකියාව ලැබේ. ටීම් අයිඩියල් ලැබස් ආයතනයේ (Team IdeaLabs) වෙනුර ප්‍රනාන්දු මහතා ප්‍රමුඛ කණ්ඩායම සහ එහි සාමාජිකයන්ගේ, සහ විශේෂයෙන්ම ආචාර්ය රවිමල් බණ්ඩාර, ආචාර්ය රවීන්ද්‍ර ද සිල්වා සහ මහාචාර්ය ලසිත් ගුණවර්ධන යන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ අමිල සහයෝගය ඔවුන්ගේ සාර්ථකත්වයට හේතු විය. 2023 SLASSCOM ජාතික කුසලතා සම්මාන උළෙලෙහි (National Ingenuity Awards) අරමුණ වන්නේ කර්මාන්තය තුළ කැපී පෙනෙන දක්ෂතා සහ නවෝත්පාදනයන් පිළිගැනීමට ලක්කිරීමයි. මෙම සම්මාන ප්‍රදානෝත්සවය ජුනි 15 වැනිදා ෂැංග්‍රිලා හෝටලයේදී පැවැත්විණි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJ)කැපී පෙනෙන නවෝත්පාදන පිළිගැනීමට ලක් කරයි: " ශ්‍රී ලංකා IIVCC නවෝත්පාදන සම්මාන" (“IIVCC Innovate Sri Lanka Awards”)

ශ්‍රී ලංකා නවෝත්පාදන (Innovate Sri Lanka) 2021/2022 සම්මාන ප්‍රදානෝත්සවය පසුගියදා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සෙනට් මණ්ඩල ශාලාවේදී පවත්වන ලද අතර එය නවෝත්පාදන, නව නිපැයුම් සහ ව්‍යාපාර නිර්මාණ සභාව (IIVCC) විසින් සංවිධානය කරන ලදී. මෙම උත්සවය මගින් විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය කුසලතා ඇගයීමට ලක් කරන ලදි. සැලකිය යුතු දක්ෂතා පෙන්වමින් මුලින් ඉදිරිපත් කළ නවෝත්පාදන යෝජනා 202ක් සමඟින්, සූක්ෂම තෝරා ගැනීමේ ක්‍රියාවලියකින් පසු ව්‍යාපෘති 59ක් දෙවැනි වටයට පිවිසියේය. IIVC සභාව මගින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ නවෝත්පාදන ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති 31ක් සඳහා අරමුදල් සපයන ලද අතර, නිර්මාණකරුවන්ට ඔවුන්ගේ අදහස් යථාර්තයක් බවට පත් කර ගැනීමට එමගින් ට හැකි විය.

මෙම තරඟය විශේෂ උනන්දුවක් දක්වන කණ්ඩායම් (SIGs) 10 ක් අතර පවත්වන ලද අතර, එක් එක් SIG ජයග්‍රාහකයින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව විසින් නම් කරන ලද ස්වාධීන මණ්ඩලයක් විසින් විනිශ්චය කරනු ලබන අවසන් වටයක් සඳහා තේරී පත් විය. IIVC සභාව සහ නවෝත්පාදන ශ්‍රී ලංකා තරගය නිර්මාණය කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කටයුතු කළ අතර එතුමා ඇතුළු සම්භාවනීය අමුත්තන් මෙම සම්මාන උළෙලේදී පිළිගනු ලැබීය. වැඩබලන උපකුලපති මහාචාර්ය උපුල් සුබසිංහ මහතා, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රධාන විධායක නිලධාරී එන්.එම්.දොලවත්ත, පීඨාධිපතිවරුන් සහ IIVC සභාවේ සාමාජිකයින් ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

IIVCC හි නිර්මාතෘවරුන් ලෙස මහාචාර්ය සම්පත් අමරතුංග මහතා, මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද මහතා සහ මහාචාර්ය ඒ.එච්.එල්.ආර්. නිල්මිණි මහත්මිය යන අය විසින් ලබා දුන් දායකත්වය මෙම උත්සවයේදී ඇගයීමට ලක් කරන ලදි. පොදු වැසිකිළි කළමනාකරණය සඳහා "Sani-Fly" ව්‍යාපෘතිය නමින් වූ විශිෂ්ටතම නවෝත්පාදනය කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ සිසුන් විසින් සංවර්ධනය කරන ලදී. දෙවන ස්ථානයට පත් වූ ව්‍යාපෘතිය මගින් නව යෝගට් නිෂ්පාදනයක් කෙරෙහි අවධානය යොමු කළ අතර තුන්වන ස්ථානය ලැබූ ව්‍යාපෘතිය මගින් නයිට්‍රයිට් රහිත ශාකසාර සොසේජස් නිෂ්පාදනය කිරීම සඳහා අවධානය යොමු කර ඇත.

නවෝත්පාදන ශ්‍රී ලංකා යන්නෙහි දෙවන සංස්කරණය සනිටුහන් කරමින්, විශ්වවිද්‍යාලය තුළ නවෝත්පාදනයන් වැඩි දියුණු කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ වේදිකාවක් ලෙස එහි ස්ථාවරය පිළිබඳව මෙම උත්සවය තහවුරු කරන ලදි. මේ සඳහා අනුග්‍රහය දක්වන ලද්දේ ඉංජිනේරු පීඨයේ I රසායනාගාර ප්‍රදානය මගිනි. එම පීඨය සඳහා STHRDP ව්‍යාපෘතිය, IIVC සභාව මගින් අරමුදල් සපයන ලැබේ. , මහාචාර්ය ලසිත් ගුණවර්ධන සහ ආචාර්ය නිලූෂි නුගාරා යන මහත්ම මහත්මීන්ගේ එම ආයතනවල සම සභාපතිත්ව උසුලන ලද අතර තරඟය සහ සම්මාන ප්‍රදානෝත්සවය ඉදිරියට ගෙන යාම සඳහා ඔවුන් විසින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදි. වඩා යහපත් අනාගතයක් උදෙසා නවෝත්පාදන සංස්කෘතියක් ඇති කිරීම සඳහා විශ්ව විද්‍යාලයේ කැපවීම මෙම උත්සවය තුලින් නිරූපනණ කරයි.

3. පුද්ගලයින්

අරමුණු

3.1 සේවා සැපයීම සහ අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා හිතකර සහ ආකර්ෂණීය ස්ථානයක් බවට විශ්ව විද්‍යාලය පත් කිරීම සඳහා කටයුතු කරන කාර්ය මණ්ඩලයේ පූර්ණ හැකියාවන් අගය කිරීම, සහාය දීම, සංවර්ධනය කිරීම සහ යොදා ගැනීම.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර ආරම්භක මධ්‍යස්ථානය (Startup Hub) සහ ජාතික ව්‍යවසාර සංවර්ධන අධිකාරියේ (NEDA) වත්මන් උපාධි අපේක්ෂක ව්‍යවසායකත්ව වැඩසටහන 2023

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) සමඟ එක්ව "උපාධිධාරී ව්‍යාපාරය උදානය 2023" නමින් තෙදින පුහුණු සැසියක් සංවිධානය කරන ලදි. අවසාන වසරේ නිබන්ධනය/ පත්‍රිකා /ව්‍යාපෘතිවල සුවිශේෂී සංකල්ප සඳහා අරමුදල් සපයා ගනිමින් උපාධි අපේක්ෂකයින් සහ මෑත කාලීන උපාධිධාරීන් අතර ව්‍යවසායකත්ව මානසිකත්වය සහ කුසලතා ප්‍රවර්ධනය කිරීම මෙම උත්සවයේ අරමුණ විය.

ව්‍යාපාර අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පවත්වන ලද වැඩසටහනක් සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සිය සත්කාරකත්වය සපයන ලද අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය සිසුන්, සම්භාවනීය අමුත්තන් සහ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) නියෝජිතයින් මෙම අවස්ථාවට සහභාගී විය. මෙම උත්සවය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) ව්‍යාපෘතියේ "උපාධිධාරී ව්‍යවසායක උදානය" වැඩසටහනේ කොටසක් වූ අතර එය සිසුන් සහ වෘත්තිකයන් ව්‍යාපාරික අංශය වෙත ආකර්ෂණය කර ගැනීම අරමුණින් පවත්වන ලද්දකි. මෙම අවස්ථාවට මහාචාර්ය උපුල් සුබසිංහ, මහාචාර්ය හිරාන් අමරසේකර යන මහත්වරුන් ඇතුළුව විවිධ ආයතනවල නියෝජිතයින් සහභාගීවිය.

4. යටිතල පහසුකම්

තිරසාරභාවය සහ තාක්ෂණික දියුණුව උදෙසා කටයුතු කිරීමේ අරමුණින්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ තිරසාරත්වය සඳහා වූ මධ්‍යස්ථානය Center for Sustainability (CFS), දැව සැකසුම් සහ නවෝත්පාදන මධ්‍යස්ථානය Timber Process and Innovation Center (TPIC), තාක්ෂණ පරිවර්තන කාර්යාල Tech Transfer Office යන කාර්යාල නව හරිත ගොඩනැගිල්ල වෙත ගෙන යන ලදි.

2023 අගෝස්තු 24 වැනි දින, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය පද්මලාල් මානගේ මහතා, ව්‍යවහාරික විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය උපුල් සුබසිංහ, දැව සැකසුම් සහ නවෝත්පාදන මධ්‍යස්ථානයේ (TPIC අධ්‍යක්ෂ මහාචාර්ය හිරාන් අමසසේකර මහතා, තිරසාරත්වය සඳහා වූ මධ්‍යස්ථානයේ (CFS) අධ්‍යක්ෂ ආචාර්ය තිලක් චන්ද්‍රතිලක, සහ තාක්ෂණ පරිවර්තන කාර්යාලයේ (Tech Transfer Office) අධ්‍යක්ෂ ආචාර්ය චමීර උඩවත්ත යන මහත්ම මහත්මීන් ඉදිරියේ මෙම සමාරම්භක උත්සවය පැවැත්විණි.

තිරසාරත්වය සඳහා වූ මධ්‍යස්ථානය (CFS), විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකරණ ඒකකය (UBL), තාක්ෂණ හුවමාරු කාර්යාලය සහ දැව සැකසුම් සහ නවෝත්පාදන මධ්‍යස්ථානය (TPIC) යන සියල්ල මෙම පොදු කාර්යාල අවකාශයේ පිහිටා ඇත.

AHEAD ව්‍යාපෘතිය, ICE ප්‍රදානය සහ වේවැල්, පිත්තල, මැටි භාණ්ඩ, ගෘහභාණ්ඩ සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලැබුණු TPIC ප්‍රදානය වැනි ප්‍රදාන මගින් ලබා දුන් අමිල සහයෝගය මෙම ජයග්‍රහණය ලබා ගැනීම සඳහා මහෝපකාරී විය.

වසරේ ආරම්භ කරන ලද මෙම UBL-ඒකකය සහ තාක්ෂණ පරිවර්තන කාර්යාලය (Tech Transfer Office) මහාචාර්ය ප්‍රියාන් පෙරේරා මහතාගේ දූරදර්ශී නායකත්වය යටතේ ක්‍රියාත්මක වූ අතර මෙම

ජයග්‍රහණය ලබා ගත් මොහොත දක්වාම විවිධ වෙනස්කම්වලට බඳුන් වී ඇත. AHEAD වැඩසටහනේ ප්‍රමුඛ ශාස්ත්‍රීය විශේෂඥ මහාචාර්යවරයකු වන තුසිත අබිතුංග මහතාගේ විසින් ඥානාන්විත මඟපෙන්වීම සහ මහාචාර්ය හිරාන් අමරසේකර මහතාගේ උපාය මාර්ගික දැක්ම තුලින් මෙම ප්‍රයත්නය යථාර්තයක් කර ගැනීමට හැකි විය.

නව ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කටයුතු සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පත්මලාල් මානගේ, හිටපු උපකුලපති මහාචාර්ය සුදන්ත ලියනගේ, සහ මහාචාර්ය උපුල් සුබසිංහ යන මහත්වරුන් විසිද් කළ මැදිහත්වීම ප්‍රශංසනීයය.

ව්‍යාපෘතියේ අරමුදල්වලින් 60% කට වැඩි ප්‍රමාණයක් AHEAD අරමුදල්වලින් ලබා ගැනීම සඳහා මහාචාර්ය හරේන්ද්‍ර කාරියවාස, ආචාර්ය කැළුම් ගමගේ සහ ආචාර්ය ඉසුරු මානවඩු යන මහත්වරුන් විසින් දරන ලද ප්‍රයත්නය ඉමහත්ය.

5. කැපී පෙනෙන ශිෂ්‍ය අත්දැකීම්

2023 වර්ෂයේ පැවැති 14 වැනි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ (SLUG) කිරුළ හිමිකර ගැනීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමත් විය.

2023 වසරේ පැවති 14 වැනි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ (SLUG) සමස්ත ශූරතාව දිනා ගැනීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමත් වූ අතර, එහිදී විශ්ව විද්‍යාලය සිය විශිෂ්ට දක්ෂතා සහ අධිෂ්ඨානශීලීබව ප්‍රදර්ශනය කළේය. පිරිමි, කාන්තා සහ සමස්ත ඉසව්වලින් සියළු තරඟකරුවන් අභිබවා 411.5ක සමස්ත ලකුණු සංඛ්‍යාවක් හිමි කර ගනිමින් අඛණ්ඩව තෙවැනි වරටත් ශූරතාව දිනා ගැනීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමත්විය. තරග ඉසව් 24 කින් සමන්විත මෙම තරගාවලියේදී පිරිමි ඉසව්වලින් ලකුණු 228.5ක් සහ කාන්තා ඉසව්වලින් ලකුණු 183ක් රැස්කර ගැනීමට ඔවුන් සමත් විය.

බැඩ්මින්ටන්-කාන්තා, ක්‍රිකට්, එල්ලේ-පිරිමි, කබඩි-පිරිමි, මැරතන් ධාවන තරඟය, රග්බි, පිහිනුම්-කාන්තා, ටෙනිස්-කාන්තා, ධාවන පථ සහ ක්ෂේත්‍ර-කාන්තා, පිහිනුම්-සමස්ත ආදී විවිධ ඉසව් තුලින් කැපී පෙනෙන ජයග්‍රහණ අත් කරගනිමින් ශූරතාව දිනා ගැනීමට ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමත්විය. විවිධ ක්‍රීඩා හැකියාවන් සහ මනා පළපුරුද්දක් සහිත මලල ක්‍රීඩකයින් වැඩි දියුණු කිරීම සඳහා විශ්ව විද්‍යාලය දරන මහත් කැපවීම මෙමගින් විද්‍යමාන වේ.



5. යාව ජීව ප්‍රජා, සමාජ වගකීම, ජාතික සංවර්ධනය සහ ගෝලීය/කලාපීය බලපෑම.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් ඉරාමුස් (Erasmus) සමඟ එක්ව TESS: ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන පුහුණුව වැඩි දියුණු කිරීමේ වැඩසහටන දියත් කරනු ලැබේ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ අධ්‍යයනාංශය, අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලය සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ එක්ව අපද්‍රව්‍ය කළමනාකරණය සහ චක්‍රීය ආර්ථිකය සම්බන්ධයෙන් ඉතාමත් ඵලදායී පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩසටහන TESS (ශ්‍රී ලංකාවේ තාක්ෂණික-ආර්ථික-සමාජ තිරසාර සංවර්ධන පුහුණුව) ව්‍යාපෘතියේ කොටසක් ලෙස පවත්වන ලද අතර එය 2023 මාර්තු 27 සිට 31 දක්වා ගාලු මුවදොර හෝටලයේ දී පැවැත්විණි. රුහුණ සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් පැමිණි TESS ව්‍යාපෘති සාමාජිකයින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය මෙහි දී දැක ගැනීමට හැකි විය.

මෙම සමාරම්භක උත්සවයට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය උපුල් සුබසිංහ මහතා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ පීඨාධිපති මහාචාර්ය චාමර කුරුප්පු මහතා, අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලයේ TESS ප්‍රාථමික සම්බන්ධීකාරක, යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා සහ මාලදිවයින් නියෝජිත කණ්ඩායමේ සහයෝගීතා අංශයේ වැඩසටහන් කළමනාකරු, සහ මහාචාර්ය අනිල් ප්‍රනාන්දු මහතා සහ මහාචාර්ය කෙනඩි ගුණවර්ධන මහතා ඇතුළු කැපී පෙනෙන විද්වතුන් සමගින් කීර්තිමත් පුද්ගලයින් රැසක් සහභාගී විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව තුළ තාක්ෂණික-ආර්ථික-සමාජ තිරසාර සංවර්ධන පුහුණුව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර සමූහයේ (TESS) සාමාජිකයෙන් ලෙස කටයුතු කරයි. යුරෝපා සංගමයේ Erasmus+ Capacity Building in Higher Education වැඩසටහන යටතේ සම-මූල්‍ය පහසුකම් සපයන්නා වූ මෙම සමූහයට අග්නිදිග නෝර්වේ විශ්ව විද්‍යාලය, Nova De Lisboa විශ්ව විද්‍යාලය, Essex විශ්වවිද්‍යාලය යනාදී කීර්තිමත් ආයතන, සහ ශ්‍රී ජයවර්ධනපුර, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ රුහුණු විශ්වවිද්‍යාලය සහ ලාභ නොලබන කීර්තිමත් සංවිධානයක් වන ජනතාක්ෂන් (Janthakshan GTE) විශ්ව විද්‍යාලය ඇතුළු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ විශ්ව විද්‍යාල පහක් ඇතුළත් වේ.

ඉත්තෑපාන කඩොලාන වනාන්තරය ප්‍රතිස්ථාපනය කිරීම: ශ්‍රීජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ CFS සහ ලීනියා ඇක්වා පුද්ගලික සමාගම (LINEA AQUA) අතර තිරසාර හවුල්කාරිත්වයක්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වන විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශයේම කොටසක් වන තිරසාරභාවය සඳහා වන මධ්‍යස්ථානය (CFS), ඉත්තෑපාන කඩොලාන සංරක්ෂණ වනාන්තරයේ අක්කරයක ප්‍රමාණයේ කොටසක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා MAS Active සමඟ අවබෝධතා ගිවිසුමක් (MOU) පසුගියදා අත්සන් කළේය. මෙම අවබෝධතා ගිවිසුම 2023 අප්‍රේල් 18 වන දින උපකුලපතිවරයාගේ කාර්යාල මණ්ඩල කාමරයේදී අත්සන් කරන ලද අතර, ආයතනය වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ වැඩබලන උපකුලපති මහාචාර්ය උපුල් සුබසිංහ මහතා ඊට අත්සන් තැබීය.

ලීනියා ඇක්වා පුද්ගලික සමාගමේ (LINEA AQUA (PVT) LTD) මානව සම්පත් හා පරිපාලන, අනුකූලතාව, සහ තිරසාරභාවය පිළිබඳ සාමාන්‍යාධිකාරී ලලිත් හේරත් මහතා, අනුකූලතා සහ තිරසාරභාවය පිළිබඳ සහකාර කළමණාකාර ගැමුණු ඉරෝෂණ මහතා, පරිසර තිරසාරභාවය පිළිබඳ විධායක නිලධාරී දේවක ද සිල්වා යන මහත්වරු ඇතුළු නියෝජිතයෝ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ විශේෂ අවස්ථාවට සහභාගි වූහ. තිරසාරභාවය සඳහා වන මධ්‍යස්ථානය (CFS) නියෝජනය කරමින් එම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ආචාර්ය තිලකවංශ වන්ද්‍රතිලක මහතා සහ CFS කණ්ඩායමේ සාමාජිකයින් වන කෞෂානි විමලසිරි මෙනවිය, විමුක්ති ප්‍රතාප් ප්‍රනාන්දු මහතා, සකුන්ත හිරිමුතුගොඩ යන මහත්ම මහත්මීහු ද සහභාගි මෙම අවස්ථාවට වූහ.

අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ මූලික අරමුණ වන්නේ ඉත්තෑපාන කඩොලාන සංරක්ෂණ වනාන්තරයේ අක්කරයක ප්‍රමාණයක භූමි ප්‍රතිස්ථාපනය කිරීමයි. විශ්ව විද්‍යාලය මගින් පාලනය කරනු ලබන කඩොලාන වනාන්තරය තුළ පිහිටා ඇති මෙම පරිහානියට පත් ඉඩම, තිරසාරභාවය සඳහා වන මධ්‍යස්ථානය (CFS) සහ LINEA AQUA ආයතනයේ ඒකාබද්ධ සහයෝගීතාවය යටතේ දේශීය කඩොලාන විශේෂ යොදා ගනිමින් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

විශේෂයෙන්ම පුද්ගලික අංශයේ ආයතන සමඟ ඇති කර ගනු ලැබූ හවුල්කාරිත්වය තුලින් තිරසාරත්වයට අදාළ දැනුම සහ පරිචයන් ප්‍රවර්ධනය කිරීම සහ බෙදා දීම සම්බන්ධයෙන් ලබා ඇති සාර්ථකත්වය සනාථ කිරීම සඳහා සකස් කළ වාර්තාවක් තිරසාරභාවය සඳහා වන මධ්‍යස්ථානය (CFS) CFS සතුව ඇත. තිරසාරභාවය සඳහා වන මධ්‍යස්ථානය (CFS) CFS විසින් ආරම්භ කරන ලද, භායනයට ලක් වූ කඩොලාන වනාන්තර අක්කරයක් ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යනු තිරසාර කර්මාන්ත-විශ්ව විද්‍යාල හවුල්කාරිත්වයක් සඳහා ඉදිරිපත් කළ හැකි තවත් එක් සාර්ථක උදාහරණයක් වන අතර, පාරිසරික තිරසාරභාවය සඳහා LINEA AQUA ආයතනය දක්වන මහත් කැපවීම එමගින් විදහා දක්වයි.

අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම තුලින් විශ්ව විද්‍යාලය සහ LINEA AQUA යන දෙඅංශම වැදගත් ඉදිරි පියවරක් සනිටුහන් කරයි. මන්දයත් පාරිසරික තිරසාරභාවය සහ ස්වාභාවික සම්පත් ප්‍රතිස්ථාපනය හා සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ හවුල් කැපවීම එමගින් පෙන්නුම් කරන බැවිනි. හානයට පත් භූමිය ප්‍රතිෂ්ඨාපනය කිරීමට අමතරව අවට ප්‍රජාවට සහ පුළුල් පරිසරයට ප්‍රයෝජනවත් වන හිතකර පරිසර පද්ධතියක් ද මෙම ව්‍යාපෘතිය මගින් නිර්මාණය කරනු ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය දකුණු ආසියාවේ ප්‍රථම කාබන් උදාසීන විශ්වවිද්‍යාලය බවට පත්වෙයි

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සිය හරිතාගාර වායු විමෝචනය සම්බන්ධයෙන් කාබන්-ඉන්සෙට් ® මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කරමින් ‘‘දකුණු ආසියාවේ ප්‍රථම කාබන් උදාසීන විශ්වවිද්‍යාලය’’ බවට පත්ව ඇති බව සාඩම්බරයෙන් ප්‍රකාශ කරනු ලැබේ. දේශගුණික ක්‍රියාකාරකම්වල වැදගත්කම හඳුනා ගනිමින්, ලොව පුරා බොහෝ ප්‍රමුඛ පෙළේ විශ්ව විද්‍යාල කාබන් ඉවත් කිරීම සහ අවශෝෂණය කිරීම වැනි යාන්ත්‍රණයන් භාවිතා කරමින් වායුගෝලයට කාබන් ඩයොක්සයිඩ් ශුද්ධ ලෙස මුදා හැරීමක් සිදු නොකරන බව තහවුරු කරමින් කාබන් උදාසීන විශ්ව විද්‍යාලයක් බව පත්වීම සඳහා ප්‍රතිඥා ලබා දී ඇත. මේ අනුව, USJ 2022 ඔක්තෝම්බර් මාසයේදී ISO 14064-1 ප්‍රමිතියට අනුව සිය GHG විමෝචනය වාර්තා කළ දකුණු ආසියාවේ පළමු විශ්ව විද්‍යාලය බවට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය පත්විය. විශ්ව විද්‍යාලය මගින් පුත්තලම දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනු ලබන කරුවලගස්වැව පිහිටි අක්කර 1000ක වන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට පසුගියදා ISO 14064-2:2019 සහතිකය පිරිනමන ලදී. මෙම සහතිකය පිරිනැමීමත් සමඟ Carbon-Inset® මාර්ගෝපදේශයේ නිර්දේශවලට අනුකූලව කටයුතු කරමින්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රමිතීන්ට අනුව කටයුතු කරනු ලබන කාබන්-ඉන්සෙට්® ආයතනයක් ලෙස දැන් පිළිගෙන තිබේ. මෙම ජයග්‍රහණය ලබා ගැනීම හේතුවෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය දකුණු ආසියාවේ සහ ආසියාවේ ප්‍රමුඛතම ‘‘හරිත විශ්ව විද්‍යාලයක්’’ ලෙස ස්ථානගත කර ඇති අතර ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල අතරින් පාරිසරික තිරසාරභාවය සඳහා නව ප්‍රමිතියක් සකස් කිරීමට එමගින් හැකියාව ලැබී ඇත. " කාබන් උදාසීන ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය " ව්‍යාපෘතිය, වන විද්‍යා හා පාරිසරික විද්‍යා දෙපාර්තමේන්තුවේ තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය විසින් 2019 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර, විශ්ව විද්‍යාල GHG භාණ්ඩ ලේඛනය පිළිබඳව වාර්තා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා කාබන් කළමනාකරණ කණ්ඩායමක් පිහිටුවීම යනාදිය මෙම කාබන් උදාසීනබව සඳහා අනුගමනය යුතු ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය. අක්කර 1000ක වනාන්තර භූමිය යළි ස්ථාපිත කිරීම තුලින් විශ්ව විද්‍යාලයේ හරිතාගාර වායු (GHG)විමෝචනය අඩු කිරීම සඳහා කාබන් අවශෝෂක සංවර්ධනය කිරීමේ කටයුතු මෙහෙයවනු ලැබුවේ මහාචාර්ය ප්‍රියාන් පෙරේරා (අධ්‍යක්ෂක, CFS), කෝසල ගුණවර්ධන මහතා (වනාන්තර කළමනාකරු), ඔෂාන් රත්නපාල මහතා සහ රාජිත රූපසිංහ මහතා වන අතර ඒ සඳහා වන විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ ශිෂ්‍යයන් රැසක් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූහ. හරිතාගාර වායු (GHG) භාණ්ඩ ලේඛනයේ සහ වන වගා ව්‍යාපෘතියේ තෙවන පාර්ශ්ව සත්‍යාපන කටයුතු සිදු කරන ලද්දේ ජාත්‍යන්තර ප්‍රතීතන සංසදය (IAF) විසින් ප්‍රතීතනය කර ඇති ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වලංගු කිරීමේ සහ සත්‍යාපනය කිරීමේ ආයතනයක් වන තිරසාර අනාගත සමූහය (Sustainable Future Group) විසිනි. විශ්වවිද්‍යාලයීය කාබන් පා සලකුණ අඩු කිරීමේ අරමුණින්, වන විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයන අංශයේ තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය විසින් විශ්වවිද්‍යාලය තුළ ඉදිරි ‘‘හරිත ක්‍රියාමාර්ග’’ ක්‍රියාවට නැංවීම සඳහා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය ප්‍රජාවේ පූර්ණ සහයෝගය, තවදුරටත් අපේක්ෂා කරනු ලැබේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මේ වන විට ‘‘Carbon-Inset® Institution’’ ලාංඡනය භාවිතා කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති අතර එය විශ්වවිද්‍යාලය හා අනුබද්ධ වෙබ් අඩවි, අත්පත්‍රිකා, ප්‍රචාරණ සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ නිල ලේඛනවලට ඇතුළත් කරන ලෙසට දිරිමත් කරනු ලැබේ.

<u>තිරසාරත්වය පිළිබඳ අනාගත සැලසුම්</u>

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තිරසාරත්වය උපසෝ කැපවීමෙන් කටයුතු කරන අතර, එහි තිරසාර ඉලක්ක ඉදිරියට ගෙන යාම සඳහා ඉදිරි වසර සඳහා උපායමාර්ගික ක්‍රියාමාර්ග කිහිපයක්ම සැලසුම් කර තිබේ.

කාබන් උදාසීනතාව සහ හරිත බලශක්ති ප්‍රසාරණය

"දකුණු ආසියාවේ ප්‍රථම කාබන් උදාසීන විශ්ව විද්‍යාලය" බවට පත්වීම තුලින් මෑතකාලීනව ලද ජයග්‍රහණ පදනම් කර ගනිමින්, 2030 වන විට අමතර වනාන්තර අක්කර 500 ක් ආවරණය වන පරිදි කාබන් සින්ක් ව්‍යාපෘති ව්‍යාප්ත කිරීමට අප විශ්ව විද්‍යාලය සැලසුම් සකස් කරමින් සිටී. මීට අමතරව, 2030 වන විට, විශ්ව විද්‍යාලයේ බලශක්ති අවශ්‍යතාවයෙන් 10% ක් පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් (සූර්ය පැනල) මගින් ලබා ගැනීම අපගේ ඉලක්කය වේ.

2030 වන විට විශ්ව විද්‍යාලය අපද්‍රව්‍ය ශූනය ස්ථානයක් බවට පත් කිරීම

ප්‍රතිචක්‍රීකරණය, කොම්පෝස්ට් පොහොර නිපදවීම සහ එක් වරක් භාවිත කළ හැකි ප්ලාස්ටික් අවම කිරීම වැනි අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම තුලින් 2030 වන විට ශූන්‍ය අපද්‍රව්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට අප විශ්ව විද්‍යාලය බලාපොරොත්තු වේ. අපද්‍රව්‍ය අවම කිරීම සහ චක්‍රීය ආර්ථික මූලධර්ම පිළිබඳව කාර්ය මණ්ඩලය සහ සිසුන් දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ග ද හඳුන්වා දීමට ද අපි බලාපොරොත්තු වෙමු.

තිරසාර පර්යේෂණ සහ සංවර්ධනය

2030 වන විට, විශේෂයෙන් දේශගුණයට අනුවර්තනය වීම, පෙව විවිධත්ව සංරක්ෂණය සහ තිරසාර නාගරික සැලසුම් කෙරෙහි අවධානය යොමු කරමින් තිරසාරත්වයට අදාළ පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව 10% කින් ඉහළ නැංවීම අපගේ ඉලක්කය වේ. ගෝලීය තිරසාර කතිකාවට දායකත්වය ලබා දීමේ අරමුණ පෙර දැරි කරගනිමින් අපි ජාත්‍යන්තර ආයතන සමඟ අපගේ සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් පුළුල් කිරීමට බලාපෙරොත්තු වෙමු.

අධ්‍යාපනයේ තිරසරබව

2030 වන විට උපාධි ලබන සෑම ශිෂ්‍යයකු තුලම තිරසාර සංවර්ධන පරිචයන් පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති කිරීම සහතික කිරීම සඳහා විවිධ විෂයයන් හරහා තිරසාරභාවය කේන්ද්‍රීය මොඩියුල අපගේ විෂයමාලාවට ඒකාබද්ධ කිරීමට කටයුතු කිරීමට අපේක්ෂිතය. තිරසාරභාවය සහ හරිත තාක්ෂණයන් කෙරෙහි අවධානය යොමු කරන නව උපාධි වැඩසටහන් 2026 වන විට හඳුන්වා දෙනු ලැබේ.

ප්‍රජා සහභාගීත්වය සහ හවුල්කාරීත්වය

පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ හවුල්කරුවන් සමඟ සහයෝගීතාවයෙන් යුතුව සිය ව්‍යාප්ති වැඩසටහන් පුළුල් කිරීමට විශ්ව විද්‍යාලය සැලසුම් කරමින් සිටී. 2025 වන විට, දැනුම හුවමාරුව තුළින් ප්‍රාදේශීය ප්‍රජාවන් සවිබල ගැන්වීම, තිරසාර කෘෂිකර්මය, පුනර්ජනනීය බලශක්තිය සහ පාරිසරික ප්‍රතිසංස්කරණය හා සම්බන්ධ නව ප්‍රජා ව්‍යාපෘති 10ක් ආරම්භ කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු.

තිරසාර යටිතල පහසුකම් සංවර්ධනය

2030 වන විට, විශ්ව විද්‍යාලයේ තිබෙන සියලුම නව ගොඩනැගිලි හරිත ගොඩනැගිලි ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි නිර්මාණය කරනු ලබන අතර, වර්තමාන ප්‍රමිතීන්ට සාපේක්ෂව බලශක්ති පරිභෝජනය 30% කින් සහ ජල පරිභෝජනය 20% කින් අඩු කිරීමට ඉලක්ක කර තිබේ. බලශක්ති කාර්යක්ෂමතාව සහ ජල සංරක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා පැරණි ගොඩනැගිලි නැවත සකස් කිරීම ප්‍රමුඛතාවයක් සේ සලකා කටයුතු කරනු ඇත.

තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA)

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය රාජ්‍ය ආයතනයක් වන බැවින් එහි ගුණාත්මකභාවය සහ නියමිත ප්‍රමිතීන් උසස් මට්ටමින් පවත්වාගෙන යාමේ වගකීම විශ්ව විද්‍යාලය වෙත පැවරී තිබේ. තත්ත්ව සහතිකය යනු විශ්ව විද්‍යාලයක් මගින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ දැනුම උත්පාදනය ආදිය ප්‍රමිතියකින් යුක්තව පවත්වා ගෙන යන බවට විශ්වාසයෙන් සහ නිශ්චිතව සහතික කළ හැකි ක්‍රමවේදයයි.

මෙම පසුබිම තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ සභාව (QAC) විසින් නියම කර ඇති ජාතික තත්ත්ව සහතික රාමුවට අනුකූලව තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA) වෙත පැවරී තිබේ. මහාචාර්ය ආර්.බී.මාරසිංහ මහතා විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ/(CQA) අධ්‍යක්ෂ ලෙස අඛණ්ඩව කටයුතු කළ අතර ආචාර්ය එස්.වීරසිංහ මහතා 2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ/(CQA) නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේය.

2023.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ආචාර්ය සමීත්‍රා සමරසේකර මිය ඉංජිනේරු පීඨයේ (QA Cell) තත්ත්ව සහතික ඒකකයේ සම්බන්ධීකාරක ලෙස පත් කරන ලදී. තාක්ෂණ පීඨයේ තත්ත්ව සහතික ඒකකයේ (QA Cell) භිටපු සම්බන්ධීකාරකවරයා ලෙස කටයුතු කල ඉංජිනේරු රවී ද මෙල් මහතාගේ සේවා කාලය 2022 ජූලි මාසයේදී අවසන් වූ බැවින් ආචාර්ය සංඛ විදිසිංහ මහතා 2023.08.17 දින සිට බලපැවැත්වෙන පරිදි තාක්ෂණ පීඨයේ තත්ත්ව සහතික ඒකකයේ (QA Cell) සම්බන්ධීකාරකවරයා ලෙස පත් කරන ලදී. ආචාර්ය පී.ඒ.එන්.එස්.අනුරාධ මහතා 2023.10.04 දින සිට බලපැවැත්වෙන පරිදි කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ තත්ත්ව සහතික ඒකකයේ (QA Cell) සම්බන්ධීකාරකවරයා ලෙස පත් කරන ලදී.

2023 වර්ෂය තුළ තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA) මගින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

1. විෂයමාලා සමාලෝචන කමිටුව (CRC):

මෙම කමිටුව සෙනෙට් සභාවේ උප අනුකමිටුවක් ලෙස ස්ථාපිත කරන ලද අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විෂයමාලා සමාලෝචන කමිටුව මගින් SLQF මාර්ගෝපදේශයන්ට අනුව බොහෝ උපාධි, පශ්චාත් උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත් පාඨමාලා සමාලෝචනය කර ඇත. එමෙන්ම නව පීඨ මෙන්ම නව අධ්‍යයන අංශ පිහිටුවීම සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනා මෙම විෂයමාල සමාලෝචන කමිටුව (**CRC**) මගින් ඇගයීමට ලක් කෙරේ. **2023** වර්ෂය තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විෂයමාලා සමාලෝචන කමිටුව (**CRC)** මගින් සමාලෝචනය කරන ලද අධ්‍යයන පාඨමාලා පහත දැක්වේ.

අ.අ	අධ්‍යයන පාඨමාලාවේ නම	**SLQF** මට්ටම	අදාළ පීඨය	තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ සහතිකය ලබා දුන් දිනය
නව උපාධි පාඨමාලාවේ විෂය මාලාව:				
	විද්‍යාපති/කලා/ MBA උපාධිය			
1	අධීක්ෂණය සහ ඇගයීම පිළිබඳව විද්‍යාපති උපාධිය	10 වැනි මට්ටම	උපාධි අධ්‍යයන පීඨය	2023.06.22

2	අධීක්ෂණය සහ ඇගයීම පිළිබඳව විද්‍යාපති උපාධිය	10 වැනි මට්ටම	උපාධි අධ්‍යයන පීඨය	2023.08.17
3	මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය	10 වැනි මට්ටම	උපාධි අධ්‍යයන පීඨය	2023.09.21
4	අපද්‍රව්‍ය කළමනාකරණය සහ චක්‍රීය ආර්ථිකය පිළිබඳ විද්‍යාපති උපාධිය	10 වැනි මට්ටම	උපාධි අධ්‍යයන පීඨය	2023.10.19
5	කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	10 වැනි මට්ටම	කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍ය විද්‍යා පීඨය	2023.10.19
6	මානව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	10 වැනි මට්ටම	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය	2023.12.21
7	විශේෂිත ක්ෂේත්‍ර යේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය	10 වැනි මට්ටම	කළමනාකරණය අධ්‍යයන සහ වාණිජ්‍ය විද්‍යා පීඨය	2023.10.19
	විද්‍යාපති උපාධිය (සංශෝධිත විෂය නිර්දේශය)			
1	පොලිමර් විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය	10 වැනි මට්ටම	උපාධි අධ්‍යයන පීඨය	2023.07.20
	වාණිජ්‍ය පශ්චාත් උපාධිය (සංශෝධිත විෂයමාලාව)			
1	වාණිජ පශ්චාත් උපාධියේ සංශෝධිත විෂයමාලාව	SLQF 10 වැනි මට්ටම	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය	2023.12.21
	පශ්චාත් උපාධි			
1	මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය	9 වැනි මට්ටම	උපාධි අධ්‍යයන පීඨය	21.09.2023
2	ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය	9 වැනි මට්ටම	කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍ය විද්‍යා පීඨය	2023.10.19
3	ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධිය	9 වැනි මට්ටම	කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍ය විද්‍යා පීඨය	2023.11.23
	විද්‍යාවේදී උපාධි (ගෞරව)			
1	ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය	6 වැනි මට්ටම	ඉංජිනේරු පීඨය	2023.10.19
2	ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය	6 වැනි මට්ටම	ඉංජිනේරු පීඨය	2023.10.19
3	ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - විදුලි හා ඉලේකට්‍රොනික ඉංජිනේරු අධ්‍යයන අංශය	6 වැනි මට්ටම	ඉංජිනේරු පීඨය	2023.10.19

4	ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - පරිගණක විද්‍යා අධ්‍යයන අංශය	6 වැනි මට්ටම	ඉංජිනේරු පීඨය	2023.10.19
	ශාස්ත්‍රවේදී උපාධි			
1	නිර්මාණාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය	05 වැනි මට්ටම	බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකය (EDECU) - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය	17.02.2023
2	සංගීතය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය	05 වන මට්ටම	බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකය (EDECU) - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය	2023.02.17
	වෛද්‍යවේදී උපාධිය (සංශෝධිත විෂය මාලාව)			
1	වෛද්‍යවේදී උපාධිය ශල්‍යවේදය පිළිබඳ උපාධිය	06 වන මට්ටම	වෛද්‍ය විද්‍යා පීඨය	2023.06.22
	ඩිප්ලෝමා පාඨමාලා			
1	රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	03 වන මට්ටම	කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍ය විද්‍යා පීඨය	2023.02.17
2	කළමනාකරණ ඩිප්ලෝමාව - Fall-back විකල්පය	03 වන මට්ටම	කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍ය විද්‍යා පීඨය	2023.12.21

2. කළමනාකරණ මාර්ගෝපදේශය (පරිපාටි අත්පොත) :

2017 වසරේ පැවති ආයතනික සමාලෝචනයේදී (IR) විශ්වවිද්‍යාලය තුළ කළමනාකරණ මාර්ගෝපදේශයක් (ක්‍රියා පටිපාටි අත්පොත) පවත්වාගෙන නොතිබීම සම්බන්ධයෙන් සමාලෝචන මණ්ඩලය සිය අදහස් ඉදිරිපත් කර ඇත. 2018 වසරේ කේ.ජී. බ්‍රිටෝ මහතා විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා ලෙස කටයුතු කළ සමයේ දී කළමනාකරණ මාර්ගෝපදේශයක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. 2021 වර්ෂයේ දී ඒ.බී. වැලිවිට මහතා රෙජිස්ට්‍රාර්වරයා ලෙස වැඩ භාර ගැනීමෙන් අනතුරුව නැවතත් එම කටයුතු ආරම්භ කරන ලදී. වයඹ විශ්වවිද්‍යාලයේ හිටපු ලේඛකාධිකාරී ලෙස කටයුතු කළ වැලිවිට මහතාගේ මගපෙන්වීම යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කොන්ත්‍රාත් පදනම මත සේවය කළ ජී. පියරත්න මහතා විසින් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහය අනුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විවිධ චක්‍රලේඛ සහ ආයතනික ලිපි පදනම් කර ගනිමින් කළමනාකරණ මාර්ගෝපදේශය (ක්‍රියාපටිපාටි අත්පොත) සකස් කරන ලදී.

3. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආයතනික සමාලෝචනය **(IR):**

ආයතනික සමාලෝචනය (IR) පැවැත්වීමට පෙර ස්වයං ඇගයීම් වාර්තාවක් (SER) සකස් කිරීම අනිවාර්ය බැවින්, SER හි එක් එක් නිර්ණායක සකස් කිරීම සඳහා කමිටු දහයක් (10) පත් කිරීමට තීරණය කරන ලදී. එක් එක් කමිටුවේ සභාපතිවරයා සහ සාමාජිකයින් පහත සඳහන් වේ. කාරකසභා සභාපතිවරුන්ගේ සහ සාමාජිකයින්ගේ නිර්ණය විෂය (TOR) අමුණා ඇත.

නිර්ණායක අංක 1 - පාලනය සහ කළමනාකරණය

1) ජ්‍යෙෂ්ට මහාචාර්ය කේ.ඩී. ගුණවර්ධන– FMSC (නියෝජිත) (සභාපති)
2) මහාචාර්ය ඒ.එම්.බී. ප්‍රියදර්ශනී– FAHS (නියෝජිත)
3) ආචාර්ය ජනිත වල්පිට – FUAB (නියෝජිත)
4) නිශාන්ති පළඟසිංහ මෙය, SAR/විභාග

5) ඒ.ඒ.කේ.එන්. රණසිංහ මෙය, DB/මූල්‍ය
6) වී.බී. ලැබ්රෝයි මෙය – FOC (නියෝජිත)
7) එච්.එල්.එල්. ඩිලංකර මයා – PEU (නියෝජිත)

නිර්ණායක අංක 2 - කාර්ය මණ්ඩලයේ ප්‍රමාණය සහ කාර්ය මණ්ඩලයේ ගුණාත්මකබව

1) මහාචාර්ය එස්.ටී.ඩබ්.එස්.වයි. යාපා– SDC (නියෝජිත) (සභාපති)
2) ආචාර්ය එරන්දි පතිරණ –FUAB (නියෝජිත)
3) ආචාර්ය සකුරා බෝගොඩ – FOT (නියෝජිත)
4) නිරෝෂා මධුවන්ති මිය – CGU (නියෝජිත)

නිර්ණායක අංක 3 – විෂයමාලාව සැලසුම් කිරීම සහ පාඨමාලා සංවර්ධනය

1) මහාචාර්ය දිනිති පීරිස් – FAS (නියෝජිත) (සභාපති)
2) ආචාර්ය තිලිණි කළුආරච්චි – FMS (නියෝජිත)
3) ආචාර්ය තිලිණි කළුආරච්චි – FMS (නියෝජිත)
4) ආචාර්ය දුලිණි මුදුන්කොටුව FOE (නියෝජිත)
5) ආචාර්ය ප්‍රියංක පලිපාන –FOD (නියෝජිත)

නිර්ණායක අංක 4 - ඉගැන්වීම - ඉගෙනීම

1) ආචාර්ය මහීකා සෙනෙවිවික්‍රම – FMS (නියෝජිත) (සභාපති)
2) ආචාර්ය චන්දන හේවගේ – FMS (නියෝජිත)
3) ආචාර්ය ධනුෂ්ක උදයංග – FOT (නියෝජිත)
4) බී.එන්.එම්.පෙරේරා මයා – PEU (නියෝජිත)

නිර්ණායක අංක 5 – ඉගෙනුම් මූලාශ්‍ර, ශිෂ්‍ය සහාය සහ ප්‍රගතිය

1) මහාචාර්ය බී.ඩබ්.ආර්. දමයන්ති – FHSS (නියෝජිත) (සභාපති)
2) ආචාර්ය මනෝජා සමරදිවාකර - පුස්තකාලය (නියෝජිත)
3) ශිරානි රණසිංහ මෙය – පුස්තකාලය (නියොජිත)
4) චතුරංගනී තෙන්නකෝන් මිය –CGU (නියෝජිත)
5) එන්.එන්.විදානගේ මිය – PEU (නියෝජිත)
6) ජේ.එම්.ආර්.එම්. කුලතිලක මිය–PEU (නියෝජිත)

නිර්ණායක අංක 6 – ශිෂ්‍ය ඇගයීම සහ ප්‍රදාන

1) මහාචාර්ය එම්.ඒ.කේ. ශ්‍රියාලතා – FMSC (නියෝජිත) (සභාපති)
2) ආචාර්ය සමුදි කළුබෝවිල – FOD (නියෝජිත)
3) ආචාර්ය සුරනි චතුරිකා – FUAB (නියෝජිත)

නිර්ණායක අංක 7 – පශ්චාත් උපාධි අධ්‍යයන, පර්යේෂණ, නවොත්පාදන හා වාණිජ්‍යකරණය

1) මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් – FGS (නියෝජිත) (සභාපති)
2) මහාචාර්ය රසික පෙරේරා – FGS (නියෝජිත)
3) ආචාර්ය නිලූෂි නුගාරා – FGS (නියෝජිත)
4) ආචාර්ය එල්.ජී.ඩී.ඩී. දර්ශන – FAHS (නියෝජිත)

නිර්ණායක අංක 8 – දුරස්ථ අධ්‍යාපනය

1) ආචාර්ය ශාන්ත විජේසිංහ – FHSS (නියෝජිත) (සභාපති)
2) ආචාර්ය ප්‍රබානි ලියනගේ – FOT (නියෝජිත)
3) ආචාර්ය ඩී.ජී.එන්.ඩී. ජයරත්න – FOC (නියෝජිත)
4) ජේ.ජී. චාන්දනී – පුස්තකාලය (නියෝජිත)

නිර්ණායක අංක 9 – ප්‍රජා සහභාගීත්වය, උපදේශනය සහ සහභාගිත්ව (Outreach) වැඩසටහන්

ආචාර්ය නිශාන් ධර්මවීර – FOE (නියෝජිත) (සභාපති)

1) ආචාර්ය වයනිකා පදුමදාස– FAS (නියෝජිත)
2) තුෂාරි මල්කාන්ති මෙය (DR/සුබසාධන)
3) ශෂිකා නිරෝෂණී මිය –CGU (නියෝජිත)

නිර්ණායක අංක 10– තත්ත්ව සහතිකය

1) මහාචාර්ය කේ.පී.එල්. චන්ද්‍රලාල් – FMSC (නියෝජිත) (සභාපති)
2) ආචාර්ය සශී වීරසිංහ – DD-CQA/FAS (නියෝජිත)
3) ආචාර්ය ඒ.එච්.ටී.එස්. කුලරත්න – FOE – (නියෝජිත)
4) ආචාර්ය ආර්.එම්.ටී.බී. අබේරත්න – FAHS – (නියෝජිත)

4. විභාග ක්‍රියාපටිපාටියේ ප්‍රමිති සකස් කිරීම (SOP) (විභාග ක්‍රියා පටිපාටි පිළිබඳ අත්පොත):

විවිධ පීඨවල අනුමත විභාග ක්‍රියා පටිපාටි කිහිපයක් ක්‍රියාත්මක වුවද, සමස්ත විශ්වවිද්‍යාලයටම පොදු විභාග ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව පිළිබඳව මෙහිදී අදහස් පළ විය. මේ අනුව, පහත සඳහන් කමිටුව විසින් විභාග ක්‍රියා පටිපාටිය පිළිබඳ පොදු ප්‍රමිතියක් (**SOP) (**විභාග ක්‍රියාපටිපාටි අත්පොත) සකස් කරන ලදී.

1. මහාචාර්ය චාර්මලී නාහල්ලගේ, මහාචාර්ය, මානව විද්‍යා අංශය, FHSS – සභාපති
2. මහාචාර්ය දිනිති පීරිස්, මහාචාර්ය, සත්ත්ව විද්‍යා අංශය, FAS
3. මහාචාර්ය දුෂ්‍යන්ත කුලතුංග, මහාචාර්ය, තොරතුරු තාක්ෂණ අංශය, FMSC
4. මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන්, මහාචාර්ය, භූගෝල අධ්‍යයන අංශය, FHSS
5. මහාචාර්ය එම්.ඩී. පුෂ්පකුමාරි, නියෝජ්‍ය අධ්‍යක්ෂ, ලියාපදිංචි කිරීම සහ විභාග /EDECU
6. ආචාර්ය වරුණි ජයසූරිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ, තත්ත්ව සහතික මධ්‍යස්ථානය (Centre for Quality Assurance)
7. ආචාර්ය තුෂාරි දිසානායක, ජ්‍යෙෂ්ට කථිකාචාර්ය, ක්ෂුද්‍ර ජෛව විද්‍යා අධ්‍යයන අංශ්‍ය, FMS
8. ආචාර්ය නුවන් අසංක වීරසේකර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිවිල් හා පාරිසරික තාක්ෂණ අධ්‍යයන අංශය, FOT
9. ආචාර්ය දුලානි මුදුන්කොටුව, ජෙෂ්ඨ කථිකාචාර්ය, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශය, FOE
10. ආචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඖෂධවේදය හා ඖෂධ විද්‍යා අධ්‍යයන අංශය, FAHS
11. ආචාර්ය ප්‍රියංක පලිපාන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය
12. ආචාර්ය එරන්දි පතිරණ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජලජ ජෛව සම්පත් අධ්‍යයන අංශය, FUAB
13. සන්ධ්‍යා ගුණසිංහ මෙය, නියෝජ්‍ය ලේඛකාධිකාරී, අධ්‍යයන ප්‍රකාශන හා විභාග අංශය

5. කාර්ය සාධන ඇගයීම් පද්ධතිය සකස් කිරීම:

2022 දී අධ්‍යයන ආචාර ධර්ම සහ වගවීම පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීමෙන් අනතුරුව, අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදුකරනු ලබන කාර්යයන් ඇගයීම සඳහා කාර්ය සාධන ඇගයීම් පද්ධතියක් සකස් කිරීමේ අවශ්‍යතාවය මතු විය. අවසානයේ දී, පහත සඳහන් කමිටුව විසින් කාර්ය සාධන ඇගයීම් පද්ධතියක් සකස් කරන ලදී.

1. මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන් – උපාධි අධ්‍යයන පීඨය – සභාපති
2. ආචාර්ය. සමීර සමරසේකර – ඉංජිනේරු පීඨය - ලේකම්

3. මහාචාර්ය දිනිති පිරිස්, ව්‍යවහාරික විද්‍යා පීඨය
4. මහාචාර්ය එස්.ටී.ඩබ්.එස්. යාපා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
5. ඉංජිනේරු ඩබ්.ආර්. ද මෙල්, තාක්ෂණ පීඨය
6. මහාචාර්ය තමරා අමරසේකර, සම සෞඛ්‍ය විද්‍යා පීඨය
7. ආචාර්ය ශාන්ත විජේසිංහ, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
8. ආචාර්ය හේමන්ත අමරසිංහ, දන්ත වෛද්‍ය පීඨය
9. ආචාර්ය මහීකා සෙනෙවිවික්‍රම –වෛද්‍ය විද්‍යා පීඨය
10. ආචාර්ය එරන්දි පතිරණ – නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය
11. ආචාර්ය ශෂී වීරසිංහ, නියෝජ්‍ය අධ්‍යක්ෂ/තත්ත්ව සහතික මධ්‍යස්ථානය (Centre for Quality Assurance)

6. කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යාන්ගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රතිපත්තිය:

කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රතිපත්තියක් කඩිනමින් සකස් කළ යුතු බව සාකච්ඡාවට බඳුන් විය. එවැනි ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වගකීම පහත සඳහන් කමිටුව වෙත භාර දෙන ලදී. සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා වෙන වෙනම ප්‍රතිපත්ති දෙකක් සකස් කිරීම සඳහා කමිටුව විසින් තීරණය කරන ලදි. 2023 වර්ෂයේ දී කාරක සභාව විසින් සිසුන්ගේ දුක්ගැනවිලි මෙහෙයවීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් සකස් කරන ලදී. (ඇමුණුම **V)**. මේ වන විට කාර්ය මණ්ඩලයේ දුක්ගැනවිලි මෙහෙයවීම සඳහා වෙනමම ප්‍රතිපත්තියක් සකස් කිරීමේ ක්‍රියාවලියක් කමිටුව විසින් ක්‍රියාත්මක කරමින් සිටී.

1. ආචාර්ය ශෂී වීරසිංහ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, තත්ත්ව සහතික මධ්‍යස්ථානය (Centre for Quality Assurance) - සභාපති
2. පූජ්‍ය මහාචාර්ය පී. සංඝසුමන**,** අධ්‍යක්ෂ**/EDECU**
3. ආචාර්ය තුසිත අබේසේකර, අධ්‍යක්ෂ/ ස්ත්‍රී පුරුෂ සාධරණත්වය හා සමානතා මධ්‍යස්ථානය
4. මහාචාර්ය ජයන්ත විජයරත්න, අංශාධිපති, **තත්ත්ව සහතික සහ ප්‍රතීතන අංශය (**Quality Assurance and Accreditation Division**)**, PIM
5. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය යසංගලී ජයතිලක, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මානව විද්‍යා අධ්‍යයන අංශය, FHSS
6. ආචාර්ය ජේ.ඩබ්. දුෂාන් චමින්ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අලෙවිකරණ කළමනාකරණ අධ්‍යයන අංශය, FMSC
7. මහාචාර්ය උෂා හෙට්ටිආරච්ඡි, මහාචාර්ය, ජීව රසායන විද්‍යා අධ්‍යයන අංශය, FMS
8. මහාචාර්ය සුනේත්‍රා තෙන්නකෝන්, මහාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යයන අංශය , FHSS
9. ඉංජිනේරු රවි ද මෙල්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ද්‍රව්‍ය හා කාර්මික තාක්ෂණ අධ්‍යයන අංශය, FOT
10. ආචාර්ය නිලාන් වීරකෝන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය, FOE
11. ආචාර්ය එච්.එම්.කේ. අකලංක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මූලික විද්‍යා අධ්‍යයන අංශය, FAHS
12. ආචාර්ය ප්‍රියංක පලිපාන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, FDS
13. ආචාර්ය එරන්දි පතිරණ, ජලජවිද්‍යා ජෛව සම්පත් අධ්‍යයන අංශය, FUAB
14. සමන්තා ගීගනගේ මෙය – නියෝජ්‍ය ලේඛකාධිකාරී, FHSS

7. පාඨමාලා සමාලෝචනය:

(i) බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකය **(EDECU):**

පහත දැක්වෙන උපාධි පාඨමාලා පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂාව 2023.02.09 වන දින පවත්වන ලදි.

1. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ (සාමාන්‍ය) ශාස්ත්‍රවේදී බාහිර උපාධිය
2. සමාජ විද්‍යා සහ පාරිසරික හා සංවර්ධන අධ්‍යයනය පිළිබඳ (සාමාන්‍ය) ශාස්ත්‍රවේදී බාහිර උපාධිය

3. ඉංග්‍රීසි (සාමාන්‍ය) ශාස්ත්‍රවේදී බාහිර උපාධිය

(ii) ව්‍යවහාරික විද්‍යාව පීඨය :

පහත දැක්වෙන උපාධි පාඨමාලා සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාව 2023.03.27-28 යන දිනවල පැවැත්විය.

පොකුර	**පාඨමාලා**
A පොකුර	ක්ෂුද්‍ර ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
	ශාඛ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
	ශාක ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
	ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
	සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

8. **CQA මඟින් පවත්වන ලද වැඩමුළු:**

අ.අං	දිනය	මාතෘකාව	සම්පත් දායකයා	සහභාගීවූවන්
1	2023.01.17	**ලේඛන උඩුගත කිරීම සඳහා මධ්‍යම ගොනු ගබඩාව** (Central File Repository)	ජ්‍යෙෂ්ට මහාචාර්ය ආර්.ජී.එන්. මීගම	සියළුම පීඨ සම්බන්ධීකාරවරුන් සහ CQA කාර්ය මණ්ඩල
2	2023.10.10	SER – IR 2023 සකස් කිරීම පිළිබඳ වැඩමුළුව	මහාචාර්ය කල්‍යාණී පෙරේරා	SER රචනා කිරීමේ කණ්ඩායම්

ශිෂ්‍ය හා සම්පත් විස්තරය

පීඨය	අධ්‍යයනාංශ සංඛ්‍යාව	මුළු උපාධි අපේක්ෂකසංඛ්‍යාව (අභ්‍යන්තර))	මුළු අධ්‍යයන සේවක සංඛ්‍යාව		පීඨය
			ස්ථිර සේවක සංඛ්‍යාව	කොන්ත්‍රාත් සේවක	
මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය	16	3842	153	71	56
ව්‍යවහාරික විද්‍යා පීඨය	11	2725	147	114	131
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය	12	5152	201	43	89
වෛද්‍ය විද්‍යා පීඨය	17	1091	101	22	135
තාක්ෂණ පීඨය	5	1670	61	62	63
ඉන්ජිනේරු පීඨය	5	593	18	50	43
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	5	688	36	18	34
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය*	9	60	8	4	2
නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය	3	187	5	10	1
පරිගණක පීඨය	3	137	3	3	1

දේශීය සිසුන් පිළිබඳ තොරතුරු

උපාධි පාඨමාලාව/පීඨය	නව ලියාපදිංචි සංඛ්‍යාව	මුළු ලියාපදිංචි සංඛ්‍යාව	උපාධිධාරීන් ගණන
අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින්			
මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය	1118	3842	879
ව්‍යවහාරික විද්‍යා පීඨය	804	2725	713
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය	1306	5152	1170
වෛද්‍ය විද්‍යා පීඨය	195	1081	154
තාක්ෂණ පීඨය	470	1670	279
ඉන්ජිනේරු පීඨය	172	588	108
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	229	688	79
දන්ත වෛද්‍ය පීඨය	28	60	-
නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය	93	187	-

පරිගණක පීඨය	137	137	
බාහිර උපාධි අපේක්ෂකයින්	4552	16130	3382
බාහිර උපාධි අපේක්ෂකයින්			
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය	3215	11581	301
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව (සාමාන්‍ය) බාහිරඋපාධිය	-	5820	351
සමාජ විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය) පාරිසරික හා සංවර්ධන අධ්‍යයනය පිළිබඳ බාහිර උපාධිය	133	923	51
ශාස්ත්‍රවේදි ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය	200	3333	40
විද්‍යාවේදි ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය	-	6442	1054
විද්‍යාවේදි රාජ්‍ය කළමනාකරණ (සාමාන්‍ය) බාහිර උපාධිය	1025	5932	210
වාණිජවේදි (සාමාන්‍ය) බාහිර උපාධිය	984	6440	288
විද්‍යාවේදි ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය	168	537	53
මුළු බාහිර උපාධි අපේක්ෂකයින්	5725	41008	2348
පශ්චාද් උපාධි අපේක්ෂකයින්			
පශ්චාද් සහතික පත්‍ර පාඨමාලාව	0	56	10
පශ්චාද් ඩිප්ලෝමා පාඨමාලාව	73	153	135
පශ්චාද් උපාධි	563	2978	399
දර්ශනපති උපාධි	41	310	29
ආචාර්යය උපාධි	16	295	27
මුළු පශ්චාද් උපාධි	693	3792	600
මුළු සිසුන් සංඛ්‍යාව	**10970**	**60930**	**6330**

විදේශීය සිසුන්ගේ විස්තර

විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2023

(විදේශීය කාණ්ඩය යටතේ තෝරාගත් සිසුන්)

පීඨය	අධ්‍යයන වැඩසටහන	අධ්‍යයන වර්ෂය	බඳවාගත් වර්ෂය	ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව		
				පුරුෂ	ස්ත්‍රී	මුළු ගණන
වෛද්‍ය විද්‍යා පීඨය	එම්.බී.බී.එස්.	පළමු වසර	2021/2022	2	2	4
		දෙවන වසර	2020/2021	3	2	5
		සිව් වන වසර	2018/2019	1	-	1
ඉන්ජිනේරු පීඨය	විද්‍යාවේදී ඉන්ජිනේරු	පළමු වසර	2021/2022	2	-	2
		දෙවන වසර	2020/2021	3	-	3
මුළු සංඛ්‍යාව				**11**	**4**	**15**

විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2023

විදේශ පශ්චාද් උපාධි සිසුන් බඳවා ගැනීම - 2023

අධ්‍යයන වැඩසටහන	රට	ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	මුළු ගණන
ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධිය	චීනය	38	25	63
බෞද්ධ දර්ශනය පිළිබඳ දර්ශනපති උපාධිය	මියන්මාරය		1	1
	චීනය	1		1
බෞද්ධ දර්ශනය පිළිබඳ ආචාර්යය උපාධිය	මියන්මාරය	1	1	2
	කාම්බෝජියාව	1		1
	ඉන්දියාව	1		1
මුළු සංඛ්‍යාව		**42**	**27**	**69**

නව ශිෂ්‍ය ලියාපදිංචිය


විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2020/2021අධ්‍යයන වර්ෂයට අදාල ව බඳවා ගත් අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින් පිළිබඳ තොරතුරු


පීඨය	බඳවා ගැනීමට එකඟ වූ සංඛ්‍යාව	ලියාපදිංචි වූ සංඛ්‍යාව	අධ්‍යයන වර්ෂය ආරම්භ කල දිනය
මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය	980	1118	23.01.2023
ව්‍යවහාරික විද්‍යා පීඨය	902	804	30.05.2023
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය	1260	1306	13.02.2023
වෛද්‍ය විද්‍යා පීඨය	194	195	20.02.2023
තාක්ෂණ පීඨය	472	470	24.07.2023
ඉන්ජිනේරු පීඨය	170	172	27.03.2023
සම සෞඛ්‍ය පීඨය	240	229	20.06.2023
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	30	28	20.02.2023
නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය	100	93	24.04.2023
පරිගණක පීඨය	150	137	19.06.2023
මුළු ගණන	**4498**	**4552**	

පසුගිය වසර පහ තුළ අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින්ගේ නව ලියාපදිංචි කිරීම් පිළිබඳ තොරතුරු

පසුගිය වසර පහ තුල අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින්ගේ නව ලියාපදිංචිය පිළිබඳ තොරතුරු

අධ්‍යයන වර්ෂය	පීඨය									මුළු සංඛ්‍යාව
	මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය	ව්‍යවහාරික විද්‍යා පීඨය	කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය	වෛද්‍ය විද්‍යා පීඨය (සම සෞඛ්‍ය පීඨයද	තාක්ෂණ පීඨය	ඉන්ජිනේරු පීඨය	දන්ත වෛද්‍ය පීඨය	නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය	පරිගණක පීඨය	
2016/2017	877	698	1213	231	321	120	-	-	-	3460
2017/2018	942	743	1223	235	318	121	-	-	-	3582
2018/2019	939	781	1216	248	323	120	-	-	-	3627
2019/2020	984	875	1348	348	491	186	-	-	-	4232
2020/2021	1016	912	1396	430	498	173	32	96	-	4553
2021/2022	1118	804	1306	424	470	172	28	93	137	4552



Internal Undergraduate new registrations
2021/2022
1118
804
1306
424
470
172
28
93
137
2020/2021
1016
912
1396
430
498
173
32
96
2019/2020
984
875
1348
348
491
186
2018/2019
939
781
1216
248
323
120
2017/2018
942
743
1223
235
318
121
0
500
1000
1500
2000
2500
3000
3500
4000
4500
5000
Humanities & Social Sciences
Applied Sciences
Management Studies & Commerce
Medical Sciences (Includes Allied Health Sciences also)
Technology
Engineering
Dental Sciences
Urban and Aquatic Bioresources
Computing


Internal Undergraduate enrolment (Total no. registered) : 2019-2023
18000
16000
14000
12000
10000
8000
6000
4000
2000
0
12982
13758
14762
15129
16145
2019
2020
2021
2022
2023

උපාධිධාරීන් පිළිබඳ තොරතුරු - 2023

පීඨය	පළමු පෙළ	දෙවන පෙළ ඉහල	දෙවන පෙළ පහල	සමත් සාමාර්ථ	මුළු උපාධිධාරීන් සංඛ්‍යාව
මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය	71	521	215	72	879
ව්‍යවහාරික විද්‍යා පීඨය	59	238	151	265	713
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය	182	307	292	389	1170
වෛද්‍ය විද්‍යා පීඨය	8	33	56	57	154
තාක්ෂණ පීඨය	13	84	88	94	279
ඉන්ජිනේරු පීඨය	12	47	41	8	108
සම සෞඛ්‍ය පීඨය	3	21	13	42	79
මුළු ගණන	**348**	**1251**	**856**	**927**	**3382**

සටහන : සම සෞඛ්‍ය පීඨය යටතේ පෙන්වන උපාධිධාරීන්ට වෛද්‍ය විද්‍යා පීඨය මගින් ඔවුන්ගේ උපාධිය පිරිනමා ඇත, මන්දයත් මෙම සිසුන් සම සෞඛ්‍ය පීඨය පිහිටුවීමට පෙර ලියාපදිංචි වී ඇත.




උපාධිධාරී සේවා නියුක්තිය

පීඨය	සේවා නියුක්ති	වෙනත්	සේවා වියුක්ත	මුළු සංඛ්‍යාව
මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය	48.04%	48.37%	3.59%	100%
ව්‍යවහාරික විද්‍යා පීඨය	74.63%	18.84%	6.53%	100%
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය	92.77%	5.92%	1.31%	100%
වෛද්‍ය විද්‍යා පීඨය	89.69%	10.31%	-	100%
තාක්ෂණ පීඨය	54.21%	42.12%	3.66%	100%
ඉන්ජිනේරු පීඨය	66.67%	33.33%	-	100%
සමස්ත	**72.77%**	**24.33%**	**2.90%**	**100%**

සටහන :

(1) ඉහත සංඛ්‍යා පදනම් වී ඇත්තේ **2023** වර්ෂයේ පවත්වන ලද උපාධි ප්‍රධානොත්සවයේදී පවත්වන ලද සේවා නියුක්ති සමීක්ෂණය මතය

(2) වෙනත් කාණ්ඩයට උසස් අධ්‍යාපනයේ යෙදී සිටින උපාධිධාරීන් සහ කිසිදු රැකියාවක් අපේක්ෂා නොකරන සිසුන් ඇතුලත් වේ



ශිෂ්‍ය සුභසාධන පහසුකම්

මහපොළ ශිෂ්‍යාධාර

මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් - 2023 දෙසැම්බර් දක්වා

අධ්‍යයන වර්ෂය	මානව ශාස්ත්‍ර	කළමනාකරණ	වෛද්‍ය විද්‍යා	ඉන්ජිනේරු	තාක්ෂණ	ව්‍යවහාරික විද්‍යා	සම සෞඛ්‍ය	දන්ත වෛද්‍ය	නාගරික හා ජලජ ඉඳෙඩ	පරිගණක	වාර්ෂික වියදම (Rs.)
2017/2018	-	-	78	-	230	153	-	-	-	-	7,927,200.00
2018/2019	649	974	79	61	129	296	41	-	-	-	61,465,600.00
2019/2020	560	961	81	71	366	287	76	-	-	-	71,020,600.00
මුළු සංඛ්‍යාව	**1209**	**1935**	**238**	**132**	**725**	**736**	**117**	**0**	**0**	**0**	**140,413,400.00**
මුළු ගෙවීම්											
2020/2021	599	919	81	63	330	323	101	10	33	-	85,950,900.00

ශිෂ්‍යාධාර

2023 වසර තුළ ශිෂ්‍යාධාර ගෙවීම් පහත දැක්වේ (අධ්‍යයන වර්ෂය හා පීඨ අනුව)

අධ්‍යයන වර්ෂය	මානව ශාස්ත්‍ර හා කළමනාකරණ	වෛද්‍ය විද්‍යා	ඉන්ජිනේරු පීඨය	තාක්ෂණ පීඨය	ව්‍යවහාරික විද්‍යා පීඨය	සම සෞඛ්‍ය පීඨය	දන්ත වෛද්‍ය පීඨය	නාගරික හා ජලජ ඉඳෙඩ සම්පත්	පරිගණක පීඨය
2017/2018	2	-	6	-	10	57	-	-	-	-
2018/2019	73	24	5	6	12	58	19	-	-	-
2019/2020	173	86	3	17	10	135	19	-	-	-
2020/2021	118	84	4	5	21	104	25	1	19	19
Total	366	194	18	28	53	354	63	1	19	19
මුළු ගෙවීම් (රුපියල්)	**18,424,000.00**	**8,964,000.00**	**696,000.00**	**872,000.00**	**2,064,000.00**	**14,716,000.00**	**2,548,000.00**	**60,000.00**	**1,100,000.00**	**1,100,000.00**
අත්තිකාරම් ගෙවීම්										
2021/2022	720	725	41	45	252	292	110	8	47	35
මුළු ගෙවීම් (රුපියල්)	**9,820,000.00**	**11,152,000.00**	**624,000.00**	**712,000.00**	**3,912,000.00**	**3,896,000.00**	**1,640,000.00**	**120,000.00**	**552,000.00**	**512,000.00**

විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබාදීම සහ සිසුන් සඳහා ලබාදී ඇති නවාතැන් පහසුකම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

පීඨය	ස්ත්‍රී	පුරුෂ	එකතුව
මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය	1868	356	2224
ව්‍යවහාරික විද්‍යා පීඨය	376	174	550
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය	1368	440	1808
වෛද්‍ය විද්‍යා පීඨය	212	139	351
සම සෞඛ්‍ය පීඨය	329	76	405
තාක්ෂණ පීඨය	484	704	1188
ඉන්ජිනේරු පීඨය	82	126	208
දන්ත වෛද්‍ය පීඨය	15	06	21
නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය	68	26	94
පරිගණක පීඨය	10	09	19

විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර

මානව ශාස්ත්‍ර හා සාමාජයී	ව්‍යවහාරික විද්‍යා පීඨය	කළමනාකරණ අධ්‍යයන	වෛද්‍ය විද්‍යා පීඨය	සම සෞඛ්‍ය පීඨය	තාක්ෂණ පීඨය	ඉන්ජිනේරු පීඨය	දන්ත වෛද්‍ය	නාගරික හා ජලජ ජෛව සම්පත්	පරිගණක පීඨය	මුළු සංඛ්‍යාව
1883	429	1370	196	228	1188	0	15	54	0	5363

කුලී පදනම මත ලබාගත් නේවාසිකාගාර

මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා	ව්‍යවහාරික විද්‍යා පීඨය	කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය	වෛද්‍ය විද්‍යා පීඨය	සම සෞඛ්‍ය පීඨය	තාක්ෂණ පීඨය	ඉන්ජිනේරු පීඨය	දන්ත වෛද්‍ය පීඨය	නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය	පරිගණක පීඨය	මුළු සංඛ්‍යාව
341	121	438	155	177	0	208	6	40	19	1505

කාර්යය මණ්ඩල විස්තර

කාර්ය මණ්ඩල සාරාංශය (සේවා කාණ්ඩ ලෙස) 2023 දෙසැම්බර් 31 දිනට

සේවා කාණ්ඩය	වැටුප් ක්‍රේතය	අනුමත සේවක ගණන	සැබෑ සේවක ගණන	පුරප්පාඩු
1. ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	U - PL 1	563	288	105
ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු	U - PL 2		74	
ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු	U - PL 3		96	
2 ද්විතියික මට්ටම				
කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන	U - MN 1	610	277	58
කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන	U - MT 1		135	
සහකාර නිලධාරීන් - 2 කොටස	U - MN 2		9	
සහකාර නිලධාරීන් - 1 කොටස	U - MN 3		20	
මාණ්ඩලික සහකාර	U - MN 4		111	
ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සහකාර				
3 තෘතීයික මට්ටම				
තාවකාලික උපදේශක/තාවකාලික ආදර්ශක	Fixed	398	359	39
තාවකාලික උපදේශක / තාවකාලික සහය කථිකාචාර්යය				
තාවකාලික පර්යේෂණ සහකාර/ තාවකාලික කථිකාචාර්යය				
අධ්‍යයන සහාය - 2 කොටස	U -AS 1	41	19	22
කනිෂ්ඨ විධායක / කළමනාකරුවන්	U -EX 1	36	23	13
අධ්‍යයන සහාය - 1 කොටස	U -AS 2	39	30	9
4. ජ්‍යෙෂ්ඨ මට්ටම				
වෛද්‍ය නිලධාරී	U -MO 1	9	7	2
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U -MO 2	0	0	0
මධ්‍යයම මට්ටමේ විධායකයින්	U -EX 2	26	24	2
ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්	U - EX 3	2	2	0
සහකාර පුස්තකාලාධිපති/ කථිකාචාර්යය (පරිවාස)	U - AC 3	1008	793	215
කථිකාචාර්යය / කථිකාචාර්යය (කොන්ත්‍රාත් පදනම)				
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති				

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (කොන්ත්‍රාත් පදනම)				
සහකාර මහාචාර්යවරුන්/ නියෝජ්‍ය පුස්තකාලයාධිපති				
පුස්තකාලයාධිපති	U - AC 4			
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය / පුස්තකාලයාධිපති	U - AC 5			

2023 වර්ෂය තුළ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

අධ්‍යයන, පරිපාලන, අනෙකුත් විධායක සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ විස්තර

	අනුමත සේවක සංඛ්‍යාව	වත්මන් සේවක සංඛ්‍යාව (2021 දෙසැම්බර් 31 දිනට)						අනුමත සේවක සංඛ්‍යාව
		ස්ථිර			කොන්ත්‍රාත් / තාවකාලික			
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	
අධ්‍යයන කාර්යය මණ්ඩලය								
ජ්‍යෙෂ්ඨ මහාචාර්යය	994	25	14	39				203
මහාචාර්යය		83	77	160				
සහාය මහාචාර්යය		3	7	10				
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය I වැනි ශ්‍රේණිය		75	70	145			0	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය II වැනි ශ්‍රේණිය		112	126	238	2	9	11	
කථිකාචාර්යය		21	29	50	17	20	37	
කථිකාචාර්යය (පරිවාස)		35	56	91				
තාවකාලික කථිකාචාර්යය					6	4	10	
තාවකාලික සහාය කථිකාචාර්යය / Tutor/ ප්‍රදර්ශක/ උපදේශක	384				98	244	342	42
පුස්තකාලයාධිපති	1		1	1				
නියෝජ්‍ය පුස්තකාලයාධිපති	1		1	1				
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති I ශ්‍රේණිය	12	1	3	4				2
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති II ශ්‍රේණිය		1	3	4				
සහකාර පුස්තකාලයාධිපති		1	1	2				
තාවකාලික පර්යේෂණ සහකාර	14				0	7	7	7
අධ්‍යයන කාර්ය මණ්ඩල උප එකතුව	**1406**	**357**	**388**	**745**	**123**	**284**	**407**	**254**
පරිපාලන නිලධාරීන්								
ලේඛකාධිකාරි	1	1		1				
මූල්‍යාධිකාරි	1		1	1				
නියෝජ්‍ය ලේඛකාධිකාරි	11	3	4	7			0	1

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි			2	2	1		1	
සහකාර ලේඛකාධිකාරි	13		10	10			0	3
නියෝජ්‍ය මූල්‍යාධිකාරි	7		4	4	1		1	2
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි		2	1	3	1		1	
සහකාර මූල්‍යාධිකාරි	9		5	5				
නියෝජ්‍ය අභ්‍යන්තර විගණක	1	0		0				
නියෝජ්‍ය සහකාර ලේඛකාධිකාරි/ නීති	1		1	1				
සහකාර ලේඛකාධිකාරි/පුස්තකාල සේවා	1			0				1
පරිපාලන කාර්ය මණ්ඩල උප එකතුව	**45**	**6**	**28**	**34**	**3**	**0**	**3**	**7**
අනෙකුත් විධායක කාර්යය මණ්ඩලය								
තොරතුරු පද්ධති කළමනාකරු	1	1		1				
අධ්‍යක්ෂක / ශාරීරික අධ්‍යාපන	1		1	1				
ව්‍යාපෘති කළමනාකරු	1			0			0	
ප්‍රධාන විනයාරක්ෂක	1			0				1
නියෝජ්‍ය විනයාරක්ෂක	1			0				1
ප්‍රධාන ආරක්ෂක නිලධාරී	1	1		1				0
වැඩ ඉන්ජිනේරු	1	1		1				
වැඩහල් ඉන්ජිනේරු	3			0				3
උද්‍යාන පාලක	2	1		1	1		1	0
කෞතුකාගාර පාලක	2	1	1	2				
සංඛ්‍යාලේඛන නිලධාරී	2	1		1				1
අනෙකුත් විධායක කාර්ය මණ්ඩල උප එකතුව	**16**	**6**	**2**	**8**	**1**	**0**	**1**	**6**
වෛද්‍ය නිලධාරීන්								
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී / වෛද්‍ය නිලධාරී	8		2	2	1	3	4	2
දන්ත ශල්‍ය වෛද්‍ය	1	1		1				
වෛද්‍ය නිලධාරීන්ගේ උප එකතුව	**9**	**1**	**2**	**3**	**1**	**3**	**4**	**2**
අධ්‍යයන සහායක								
උපදේශක (පරිගණක තාක්ෂණය) - I ශ්‍රේණිය	21	9		9				6
උපදේශක (පරිගණක තාක්ෂණය) - II ශ්‍රේණිය		4	2	6				
සහකාර සංඛ්‍යාලේඛනඥ - I ශ්‍රේණිය	1	1		1				
සහකාර ජාල කළමනාකරු	6	3		3			0	3
සමාජ වැඩ පිළිබඳ උපදේශක	1	1		1				
වෘත්තීය මාර්ගෝපදේශ උපදේශකවරුන්	4	1	3	4				0

වැඩ සටහන් සහ පද්ධති විශ්ලේෂක - II ශ්‍රේණිය	4	3	1	4				0
ජ්‍යෙෂ්ඨ උපදේශක - ඉංග්‍රීසි භාෂා	1		1	1				
උපදේශක - ඉංග්‍රීසි භාෂා	21	1	1	2				19
ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක - I ශ්‍රේණිය	7		1	1				0
ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක - II ශ්‍රේණිය		4		4		2	2	
උපදේශක	3	2	1	3				
ක්‍රීඩාගාර උපදේශක	2			0	2		2	0
පරිගණක වැඩසටහන්කරු	8	5		5			0	3
විද්‍යාත්මක සහකාර - II ශ්‍රේණිය	1	1		1				0
අධ්‍යයන සහයක කාර්යය මණ්ඩල උප එකතුව	**80**	**35**	**10**	**45**	**2**	**2**	**4**	**31**
මුළු එකතුව	**1556**	**405**	**430**	**835**	**130**	**289**	**419**	**300**

අනධ්‍යයන සේවක කාර්යය මණ්ඩලය

තනතුර		වැටඵුප් ක්ෙතය	අනුමත සේවක සංඛ්‍යාව	වත්මන් සේවක සංඛ්‍යාව (2023 දෙසැම්බර් 31 වන දිනට)						
				ස්ථිර			කොන්ත්‍රාත්/තාවකාලික			
				පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරප්පාඩු
1	විනයාරක්ෂක	U - MN 3	7	7		7				0
2	පූර්ණ කාලීන උප ශාලාධිපති	U - MN 3	14	5	7	12				2
3	උපාධිධාරී භාෂා පරිවර්තක	U - MN 3	1		1	1				0
4	නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරී	U - MN 2	1			0				1
5	වැඩ අධිකාරී	U - MN 2	3			0				3
6	වැඩ අධිකාරී (සිවිල්)	U - MN 2	6	4		4				2
7	වැඩ අධිකාරී (විදුලි)	U - MN 2	1	1		1				0
8	වැඩ අධිකාරී (භූ දර්ශන)	U - MN 2	1	1		1				0
9	විගණන සහකාර	U - MN 1	5	1	4	5				0
10	කළමනාකරණ සහකාර	U - MN 1	305	76	202	278	2	22	24	3
11	කළමනාකරණ සහකාර (පොත් තබන්නා)	U - MN 1	8	5	3	8				0


12	කළමනාකරණ සහකාර (සරප්)	U - MN 1	5	1		1				4
13	කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු)	U - MN 1	8	5		5				3
14	දූරකථන යන්ත්‍ර ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරී	U - MN 1	2		2	2				0
15	පුස්තකාල තොරතුරු සහකාර	U - MN 1	34	14	14	28			0	6
16	ආරක්ෂක පරීක්ෂක	U - MN 1	5	4		4				1
17	පිහිණුම් තටාක අධීක්ෂක	U - MN 1	1			0				1
18	ශිල්පීය නිදර්ශක (යාන්ත්‍රික)	U - MN 1	3	3		3				0
19	වැඩ අධීක්ෂක (සිවිල්)	U - MT 1	5	4		4				1
20	වැඩ අධීක්ෂක (විදුලි)	U - MT 1	3	1		1				2
21	වැඩ අධීක්ෂක (භූ දර්ශ)	U - MT 1	1	1		1				0
22	ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික නිලධාරී	U - MT 1	5	3		3				2
23	දන්ත හෙද නිලධාරි	U - MT 1	1		1	1				0
24	සැලසුම් ශිල්පි	U - MT 1	4	1	1	2				2
25	හෙද නිලධාරි	U - MT 1	11		6	6		1	1	4
26	ඖෂධවේදී	U - MT 1	4	1	1	2	1		1	1
27	භෞත චිකිත්සක	U - MT 1	1			0		1	1	0
28	මහජන සෞඛ්‍ය පරීක්ෂක	U - MT 1	2	2		2				0
29	කාර්මික නිලධාරි	U - MT 1	126	51	53	104	5	1	6	16
30	කාර්මික නිලධාරි (තොරතුරු තාක්ෂණ)	U - MT 1	21	14	5	19			0	2
31	කාර්මික නිලධාරි (සිවිල්)	U - MT 1	4	2	2	4			0	0
32	කාර්මික නිලධාරි (විදුලි)	U - MT 1	3	3		3				0
33	කාර්මික නිලධාරි (යාන්ත්‍රික	U - MT 1	4	2	1	3				1
34	කාර්මික නිලධාරි (X-Ray/Dexa Scan)	U - MT 1	1			0				1
35	රියදුරු	U - PL 3	41	33		33	3		3	5

36	පොත් බඳින්නා	U - PL 3	2	2		2				0
37	විදුලි කාර්මික	U - PL 3	9	9		9				0
38	වඩු කාර්මික	U - PL 3	8	7		7				1
39	සවි කරන්නා (Fitter)	U - PL 3	1			0				1
40	යාන්ත්‍රිකයා	U - PL 3	1			0				1
41	පෙදරේරු	U - PL 3	8	6		6				2
42	යන්ත්‍ර ක්‍රියාකරු	U - PL 3	1	1		1				0
43	ජල නල කාර්මික	U - PL 3	8	7		7	1		1	0
44	ඇලුමිනියම් ෆැබ්රික්ටර්	U - PL 3	1			0				1
45	වෑද්දුම්කරු	U - PL 3	1			0				1
46	පෑස්සුම්කරු	U - PL 3	2	1		1				1
47	ට්‍රැක්ටර් ක්‍රියාකරු	U - PL 2	1			0	1		1	0
48	රෝද දෙකේ ට්‍රැක්ටර් ක්‍රියාකරු	U - PL 2	0			0				0
49	වායු උත්පාදක ක්‍රියාකරු	U - PL 2	1			0				1
50	විද්‍යාගාර සහයක	U - PL 2	102	61	17	78	4	1	5	19
51	විද්‍යාගාර සහයක (ඇදීම්)	U - PL 2	1			0				1
52	සෞඛ්‍ය සේවා උපස්ථායක	U - PL 2	2		1	1				1
53	ජීම්නීසියම් සහයක	U - PL 2	2			0			0	2
54	පට්ටල යන්ත්‍ර ක්‍රියාකරු	U - PL 2	1			0				1
55	පින්තාරුකරු	U - PL 2	3	2		2				1
56	පොලිෂ් කරන්නා	U - PL 2	2	2		2				0
57	පොම්ප ක්‍රියාකරු	U - PL 2	0			0				0
58	එන්ජින් හා පොම්ප ක්‍රියාකරු	U - PL 2	1	1		1				0
59	නිදර්ශක එකතු කරන්නා	U - PL 2	2	1		1			0	1
60	නේවාසිකාගාර භාරකරු	U - PL 2	2	1		1				1
61	ගාඩ්නර්	U - PL 1	2	1		1				1

62	ග්‍රවුන්ඩ්ස්මන්	U - PL 1	1			0				1
63	සෞඛ්‍ය සේවා කම්කරු	U - PL 1	18	9		9				9
64	වැඩ සහයක	U - PL 1	220	174	17	191	19	1	20	9
65	මරණ පරීක්ෂක කම්කරු	U - PL 1	2	1		1				1
66	කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු	U - PL 1	6	6		6				0
67	පුස්තකාල සේවක	U - PL 1	24	8	5	13			0	11
68	ලොරි පවිත්‍රක	U - PL 1	1	1		1				0
69	තණකොළ කපන යන්ත්‍ර ක්‍රියාකරු	U - PL 1	1			0				1
70	ආරක්ෂක නිලධාරී	U - PL 1	88	43		43	15		15	30
71	ගබඩා කරු	U - PL 1	2	1		1				1
72	පිහිනුම් තටාක වැඩ සහයක	U - PL 1	2	2		2				0
එකතුව			**1176**	**592**	**343**	**935**	**51**	**27**	**78**	**163**


තනතුරු අනුව අධ්‍යයන කාර්යය මණ්ඩලය 2019 - 2023


වර්ෂය	ජ්‍යෙෂ්ඨ මහාචාර්යයවරුන්	මහාචාර්යයවරුන්	සහකාර මහාචාර්යවරු	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්යය / ආධුනික කථිකාචාර්යය	එකතුව
2019	30	81	9	372	149	641
2020	36	95	8	403	148	690
2021	41	126	9	395	151	722
2022	38	145	11	399	144	737
2023	39	160	10	383	141	733



විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සුදුසුකම්: 2019 - 2023

වර්ෂය	පළමු උපාධි හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා ලාභීන්	පශ්චාද් උපාධි පශ්චාද් උපාධි	දර්ශනපති උපාධි	MD/MS උපාධි	ආචාර්යය උපාධි ලාභීන්	එකතුව
2019	87	147	42	56	309	641
2020	73	149	43	63	361	689
2021	72	156	41	65	400	734
2022	67	158	41	73	411	750
2023	76	155	40	71	403	745


Academic Staff Qualifications - 2023
First Degrees & PG Dip., 76
Masters , 155
M.Phil, 40
MD/MS, 71
Doctoral Degrees, 403
First Degrees & PG Dip.
Masters
M.Phil
MD/MS
Doctoral Degrees


Doctoral Degrees as a percentage of total staff
60.0%
50.0%
40.0%
30.0%
20.0%
10.0%
0.0%
48.2%
52.4%
54.5%
54.8%
54.1%
2019
2020
2021
2022
2023

විශ්වවිද්‍යාලය පහත සඳහන් පීඨ එකොළහකින් යුක්ත වේ.

1. මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය
2. ව්‍යවහාරික විද්‍යා පීඨය
3. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
4. වෛද්‍ය විද්‍යා පීඨය
5. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
6. තාක්ෂණ පීඨය
7. ඉන්ජිනේරු පීඨය
8. සම සෞඛ්‍ය විද්‍යා පීඨය
9. දන්ත වෛද්‍ය විද්‍යා පීඨය
10. නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය
11. පරිගණක පීඨය



1959 ජනවාරි 01 වැනි දින මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනේ විද්‍යෝදය විශ්වවිද්‍යාලය ආරම්භ වීමත් සමඟ ශාස්ත්‍ර පීඨය ආරම්භ විය. පසුව එම පීඨය ගංගොඩවිල වත්මන් පරිශ්‍රයට ගෙන යන ලදී. 1979 දී විද්‍යෝදය පිරිවෙන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ලෙස පරිවර්තනය කරන ලද්දේ පුළුල් ප්‍රජාවකට දැනුම බෙදා හැරීමේ තවත් පියවරක් ඉදිරියට යමිනි.

මේ වන විට කලා පීඨය මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය නමින් ස්ථාපිත වී ඇත.

රටේ සංස්කෘතික උරුමය හා ප්‍රජා සංවර්ධනය හා ජාතියේ පුනර්ජීවනය, දැනුම බෙදා හැරීම මගින් වැඩිදියුණු කිරීම මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය එහි දැක්ම අනුව පීඨයේ වගකීමයි.

වාර්ෂිකව සිසුන් 1000 ක් පමණ ඇතුළත් කර ගන්නා විද්‍යාවේදී ගෞරව උපාධිය, ශාස්ත්‍රවේදී උපාධිය සහ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි සඳහා වන උපාධි වැඩසටහන් 34 ක අධ්‍යයන කටයුතු සිදු කෙරේ. පීඨය අධ්‍යයන දෙපාර්තමේන්තු දහසයකින් සමන්විත වේ.

පීඨාධිපති **මහාචාර්යය එස්.සී.බී. හීන්කෙන්ද**

අධ්‍යයනාංශය	**අධ්‍යයනාංශ ප්‍රධාන**
1. සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය	මහාචාර්යය කුසුමලතා ලංකාමුල්ලගේ මහත්මිය
2. ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය	පූජ්‍ය දඹර අමිල හිමි (10.07.2023 සිට) මහාචාර්යය කරුණාසේන හෙට්ටිආරච්චි මහතා (09.07.2023 දක්වා)
3. භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය	ආචාර්යය එච්.එම්.බී.එස්. හේරත් මහත්මිය (06.09.2023 සිට) ආචාර්යය එම්.ඒ.එස්. විජේසිංහ මහතා (05.09.2023 දක්වා)

4. සමාජවිද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්යය ඩබ්ලිව්.ඒ.එස්. විජේකෝන් මහතා
5. මානව විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්යය සී.ඒ.ඩි. නහල්ලගේ මහත්මිය
6. භාෂා , සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසංගික කලා අධ්‍යයනාංශය	මහාචාර්යය ආර්.කේ.ඩී.එන්.කේ. රාජපක්ෂ (13.07.2023 සිට) මහාචාර්යය ඩබ්ලිව්.බී.ඒ. විතාරණ (12.07.2023 දක්වා)
7. ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්යය කේ.ජී.ජී. වීරසිංහ
8. ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්යය එච්.පී.ටී.එන්. සිල්වා
9. ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්යය ඩබ්ලිව්.ඒ.කේ.සී.පී. වර්ණපාල මහත්මිය (01.06.2023 සිට) ආචාර්යය එච්.ඒ.ජී. සුජීවා (31.05.2023 දක්වා)
10. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය	මහාචාර්යය එලමල්දෙනියේ සාරානන්ද හිමි
11. දර්ශනය හා මනෝ විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්යය ඩබ්ලිව්.එම් යාපාරත්න මහතා
12. දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය	වී.එස්.සූරියබණ්ඩාර මහත්මිය
13. අපරාධ විද්‍ය හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය	මහාචාර්යය ඩබ්ලිව්.එම්. ධනපාල
14. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය	ඩී.එල්.එස්.ආනන්ද මහතා
15. සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණ අධ්‍යයනාංශය	අචාර්යය කේ.ආර්.පී. තිලකසිරි මහතා (16.03.2023 සිට) මහාචාර්යය ප්‍රදීප් රත්නායක මහතා (15.03.2023 දක්වා)
16. තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අධ්‍යයනාංශය	අචාර්යය බී.ඩබ්ලිව්.ආර්. දමයන්ති මහත්මිය

පීඨය විසින් පිරිනමනු ලබන උපාධි හා ඩිප්ලෝමා - 2023

උපාධි පාඨමාලා

01. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය

02. ශාස්ත්‍රවේදී පුරාවිද්‍යා ගෞරව උපාධිය

03. ශාස්ත්‍රවේදී අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය ගෞරව උපාධිය

04. ශාස්ත්‍රවේදී මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය

05. ශාස්ත්‍රවේදී ආර්ථික විද්‍යා ගෞරව උපාධිය

06. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි ගෞරව උපාධිය

07. ශාස්ත්‍රවේදී දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම ගෞරව උපාධිය

08. ශාස්ත්‍රවේදී භූගෝලවිද්‍යා ගෞරව උපාධිය

09. විද්‍යාවේදී භූ අවකාශ තාක්ෂණ ගෞරව උපාධිය

10. ශාස්ත්‍රවේදී ඉතිහාසය ගෞරව උපාධිය

11. ශාස්ත්‍රවේදී මානාවවිද්‍යා ගෞරව උපාධිය

12. විද්‍යාවේදී තොරතුරු තාක්ෂණ ගෞරව උපාධිය

13. ශාස්ත්‍රවේදී නර්ථනය ගෞරව උපාධිය

  - සීමාසහිත Orel IT (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
  - රිවඩ් පීරිස් සහ PLC සමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
  - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ සීමාසහිත මාස් ලෙගටෝ (Mas Legato) (පුද්ගලික) සමාගම අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම

- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය වෙනුවෙන් සීමාසහිත සෙන්ෆින් සිකියුරිටීස් සමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය වෙනුවෙන් සීමාසහිත එකාටෙරා සිලෝන් (ekaterra Ceylon) (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම.
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය වෙනුවෙන් නෙස්ලේ ලංකා පිඑල්සී සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය වෙනුවෙන් ප්‍රයිස්වෝටර්හවුස් කූපර්ස් ශ්‍රී ලංකා (PwC) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ C.W. Mackie PLC අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
- සීමාසහිත එස්එස්බීසී ඉලෙක්ට්‍රොනික දත්ත සැකසුම් ලංකා (HSBC Electronic Data Processing Lanka) (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
- ඉන්දියාවේ කේරළයේ රාජගිරි ව්‍යාපාරික පාසල සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- ටීජායි ලංකා පිඑල්සී (Teejay Lanka PLC) සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
- ගිණුම්කරණ අධ්‍යන අංශය සහ ප්‍රයිස්වොවර්හවුස් කෝපර්ස් ශ්‍රී ලංකා (Pricewaterhouse Coopers Sri Lanka) (PwC) අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
- වතු කළමනාකරණ සහ තක්සේරු අධ්‍යයන අංශය සහ තක්සේරුකරුවන් සහ ලියාපදිංචි තක්සේරුකරුවන්ගේ පදනම අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ සීමාසහිත මාස් කැපිටල් (MAS CAPITAL) (පුද්ගලික) සමාගම අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ සීමාසහිත ඇකුයිටි නොලේජ් පාර්ට්නර්ස් ලංකා (Acuity Knowledge Partners Lanka) (පුද්ගලික) සමාගම අතර අවබෝධතා ගිවිසුමක්
- ගිණුම්කරණ අධ්‍යයන අංශය සහ සීමාසහිත ටොයොටා ලංකා (Toyota Lanka) (පුද්ගලික) සමාගම අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම.
- ගිණුම්කරණ අධ්‍යයන අංශය සහ එක්ස්පෝලංකා සමාගම් සමූහය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ ජායිපූරියා කළමනාකරණ ආයතනය අතර ඇති කර ගත අවබෝධතා ගිවිසුම
- වතු කළමනාකරණ සහ තක්සේරු අධ්‍යයන අංශය සහ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම අලුත් කිරීම
- නිශ්චල දේපල අධ්‍යයන මධ්‍යස්ථානය සහ ඊබීඑස්සීඕ පබ්ලිෂිං ඉන්ක් (EBSCO Publishing Inc) අතර ඇති කර ගත්ගිවිසුම.
- තිරසාර නිෂ්පාදන සැලසුම් කිරීම, සංවර්ධනය සහ වාණිජකරණය සඳහා අයි ලැබ් (i-lab) ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ඉංජිනේරු පීඨය සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය අතර ඇති කර ගත් ගිවිසුම
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වතු කළමනාකරණ සහ තක්සේරු අධ්‍යයන අංශය සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පිහිටි එස්ටේට් මාස්ටර් පුද්ගලික සමාගම (Estate Master Pty Limited) අතර ඇති කර ගත් බලපත්‍ර ගිවිසුම

- සීමාසහිත කාගිල්ස් රිටේල් (පෞද්ගලික) සමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අනාවරණය නොකිරීමේ ගිවිසුම
- ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ අධ්‍යයන අංශය සහ මැලේසියාවේ ඉන්ටි (INTI) ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් අන්‍යෝන්‍ය සහයෝගිතාව

මානව සම්පත් සංවර්ධනය (විද්වතුන්, විද්වත් නොවන පුද්ගලයින්, ශිෂ්‍යයින්)

- පීඨයේ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන යටතේ 2023 වර්ෂයේ දී ඔවුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයේ කොටසක් ලෙස විද්වතුන් සඳහා වැඩමුළු තුනක් සංවිධානය කරන ලදී:
  - "සෙන් සතිමත්බව සහ පාරිසරික තිරසාරත්වය: සිංගප්පූරුවේ සිද්ධි අධ්‍යයනය"
  - “අධ්‍යාපනික සහ ඇගයුම් මෙවලම් නවෝත්පාදන”
  - " ක්‍රමානුකූල සාහිත්‍ය සමාලෝචනය සහ වීඕඑස්විවර් (VOSviewer) භාවිතය: ප්‍රායෝගික ප්‍රවේශයක්
- අදාළ වර්ෂය තුළ, පර්යේෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රවල අධ්‍යයන ජයග්‍රහණ 10 කට වඩා වාර්තා කිරීමට පීඨය සමත්ව ඇත. 2023 විද්‍යාත්මක පර්යේෂණ සඳහා වූ ජනාධිපති සම්මාන උළෙලේදී (PASR) ආචාර්ය ආර්. ලලිතා එස්. ප්‍රනාන්දු, ආචාර්ය අජන්තා සිසිර කුමාර සහ ආචාර්ය නුවන් ගුණරත්න යන පීඨ සාමාජිකයින් තිදෙනා සම්මානයට පාත්‍ර වූ අතර, ඔවුන් විසින් එළි දක්වන ලද විශිෂ්ට පර්යේෂණ ප්‍රකාශන වෙනුවෙන් ඔවුන් ඇගයීමට ලක් කරන ලදි. ඒ පහත පරිදිය:
  - ජ්‍යෙෂ්ට මහාචාර්ය ආර්. ලලිතා එස්. ප්‍රනාන්දු - රාජ්‍ය පරිපාලන අධ්‍යයන අංශය **(ප්‍රදාන එකයි)**
    - *“ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය: ක්‍රියාත්මක කිරීමේ විශ්ලේෂණයක්" (2019) අපද්‍රව්‍ය කළමනාකරණය, වෙළුම 84, 194-203”*

  - **මහාචාර්ය අජන්තා සිසිර කුමාර** - රාජ්‍ය පරිපාලන අධ්‍යයන අංශය **(ප්‍රදාන දෙකයි)**
    - *තමාගේ පසුම්බියෙන් මුදල් වියදම් කිරීමෙන් තොරව සෞඛ්‍ය සේවා ලබා ගැනීම සඳහා සෞඛ්‍ය සේවා භාවිතය සහ ගෘහ ඒකක අතර සබඳවතාව. නිදහස් සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිපත්තියක් සහිත සංවර්ධනය වන ආර්ථිකයක සාක්ෂි (2019) සමාජ විද්‍යාව සහ වෛද්‍ය විද්‍යාව, වෙළුම 235, 112364*
    - *ශ්‍රී ලංකාවේ ගෘහස්ථ අපද්‍රව්‍ය බැහැර කිරීමේ යාන්ත්‍රණ: අපද්‍රව්‍ය බැහැර කිරීමේ ප්‍රවණතා සහ නිර්ණායක සඳහා ජාතික මට්ටමේ සමීක්ෂණ සාක්ෂි (2020) කසළ කළමනාකරණය, වෙළුම 114, 62-71 (පිළිවෙලින් ආචාර්ය රමණී සමරතුංග සහ ආචාර්ය අසංඛා පල්ලේගෙදර සමඟ සිදු කරන ලද සම-කර්තෘ පත්‍රිකා)*

  - **ආචාර්ය නුවන් ගුණරත්න** - ගිණුම් අංශය **(ප්‍රදාන තුනයි)**
    - *දේශගුණික අවදානමට ලක්විය හැකි සංවර්ධනය වෙමින් පවතින රටවල අඩු කාබන් පාරිභෝගික චර්යා: ශ්‍රී ලංකාව පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්, සම්පත්, සංරක්ෂණය සහ ප්‍රතිචක්‍රීකරණය, 2020, වෙළුම 154, Art No 104592.*
    - *ශ්‍රී ලංකාවේ විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ කර්මාන්තය තුල තිරසාර නාගරික කැණීම් සිදු කිරීමේදී මුහුණ දෙන අභියෝග, Journal of Cleaner Production, 2020, Vol 251, Art No 119641.*

- *තිරසාර (cleaner) නිෂ්පාදන බිහි කිරීමේ උපාය මාර්ග සඳහා පාරිසරික සහ කළමනාකරණ තොරතුරු: පාරිසරික කළමනාකරණ සංවර්ධන දැක්ම, Journal of Cleaner Production, 2019, වෙළුම 237, Art No 117849.*

- FMSC හි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නායකත්ව සහ සන්නිවේදන කුසලතා වැඩිදියුණු කිරීමේ අරමුණින් සීගිරියේ ආලියා නිකේතනයේදී (Aliya Resort) දෙදින වැඩමුළුවක් පවත්වන ලදී.
- තම අධ්‍යයන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීය විභාග සමත්වීම මෙන්ම දේශීය හා ජාත්‍යන්තර තරගවලට සහභාගිවෙමින් සිසුන් 50 කට අධික සංඛ්‍යාවක් විසින් වර්ෂය තුල දී ජයග්‍රහණ අත් කර ගෙන තිබේ.

ප්‍රජා සේවා, සමාජ වගකීම, සහ ජාතික සංවර්ධනය

- පීඨයේ සිසුන් 79 දෙනෙකුට පීඨ දුෂ්කරතා අරමුදල (Faculty Hardship Fund) මගින් මූල්‍ය ආධාර හිමි විය. මූල්‍ය ආධාර සඳහා අධ්‍යයන අංශ විධිවිධාන මගින් ලබා දෙන ලද මෙම අරමුදල මගින්, මූල්‍ය අභියෝගවලට මුහුණ දෙන FMSC සිසුන්ට සැලකිය යුතු සහනයක් ලැබුණි.
- 'අපේ කාලේ ජපුර' ආදි ශිෂ්‍ය සංගමය විසින් කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ (FMSC) ආබාධ සහිත සිසුන් තිදෙනෙකුට රෝද පුටු ප්‍රදානය කර ඔවුන්ගේ මූල්‍ය බර අඩු කර ගැනීම සඳහාත් සිය අධ්‍යයන කටයුතු දැඩි කැපවීමෙන් හා අවධානයෙන් යුතුව සිදු කිරීම සඳහා ඔවුන් සවිබල ගැන්වීමේ අරමුණින් යුතුව ඔවුනට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.
- පීඨයේ (FMSC) ශිෂ්‍ය සංගම් විසින් උසස් පෙළ සිසුන් සඳහා සකස් කරන ලද සම්මන්ත්‍රණ, උසස් පෙළ විභාග කෙරෙහි අවධානය යොමු කරමින් සහ විශ්වවිද්‍යාල ජීවිතය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම ඇතුළුව පාසල් මට්ටමේ වැඩසටහන් 10කට අධික ප්‍රමාණයක් ස්වේච්ඡාවෙන් සංවිධානය කර ඇත.
- පීඨ සාමාජිකයින්, සිසු සහයෝගීත්වය සමග වසර පුරා ප්‍රජා ව්‍යාපෘති 25 කට වැඩි ගණනකට ක්‍රියාකාරීව සහභාගී විය. මෙම ව්‍යාපෘතිවලට රුධිරය පරිත්‍යාග කිරීම, ප්‍රාදේශීය පාසල්වලට පුස්තකාල පොත් පරිත්‍යාග කිරීම, අධ්‍යාපනික පහසුකම් අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සහ පරිසර සංරක්ෂණය ඉලක්ක කරගත් වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් ඇතුළු විවිධ වැඩසටහන් රාශියක් ඇතුළත් විය.
- පීඨයේ (FMSC) විද්වතුන් රූපවාහිනී වැඩසටහන් 20 කට අධික සංඛ්‍යාවක් සඳහා පෙනී සිටීමෙන් ප්‍රජා සහභාගීත්වය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. රූපවාහිනී වැඩසටහන්වලට මෙසේ සහභාගීවීම තුලින්, විවිධ වැදගත් කරුණු පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය ඉහළ නැංවීමෙන් පුළුල් ප්‍රජාව සමඟ ඔවුන්ගේ ප්‍රවීණ දැනුම හා පළපුරුද්ද හුවමාරු කර ගැනීමට ඔවුනට හැකි විය.
- වැඩමුළු සහ සම්මන්ත්‍රණ 10කට වැඩි ප්‍රමාණයක් පැවැත්වීමට සහ සත්කාරකත්වය ලබා දීමට පීඨය කටයුතු කර ඇති අතර, පුළුල් පරාසයක පාර්ශවකරුවන් වෙත දැනුම ව්‍යාප්ත කිරීම සඳහා වටිනා අවස්ථා සලසා දී ඇත. සහභාගිවන්නන් අතර දැනුම, අදහස් හුවමාරු කර ගැනීම සහ සහයෝගීතාව වර්ධනය කර ගැනීම සඳහා මෙම වැඩසටහන් මහෝපකාරී විය.
- වසර පුරා පවත්වනු ලබන විවිධ බාහිර උත්සවවලදී දේශන 5කට වඩා වැඩි ප්‍රමාණයකින් ආරාධිත දේශන පවත්වන ලෙසට පීඨ සාමාජිකයින්ට ආරාධනා කරන ලදී. මෙම වැඩපිළිවෙල මගින් පීඨයේ විද්වතුන්ගේ දැනුම සහ පාඨමාලාවල වැදගත්කම තවදුරටත් පුළුල් කරමින් විවිධ ප්‍රේක්ෂකයින් සමඟ ඔවුන්ගේ ප්‍රවීණ දැනුම සහ ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමට ඔවුන්ට හැකි විය.

2022 හා 2023 වර්ෂ වල ප්‍රතිඵල සන්සන්දනය

උපාධි පාඨමාලාව	පළමු පෙළ		දෙවන පෙළ ඉහළ		දෙවන පෙළ පහළ		සාමාන්‍ය සමත්		සමත් මුළු සංඛ්‍යාව	
	2022 වසර	2023 වසර	2022 වසර	2023 වසර	2022 වසර	2023 වසර	2022 වසර	2023 වසර	2022 වසර	2023 වසර

විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂවේදී)	45	52	54	66	42	51	60	43	201	212
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) විශේෂවේදී	29	20	22	25	21	16	13	13	85	74
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂවේදී)	28	35	66	67	70	57	57	66	221	225
වාණිජවේදී (විශේෂවේදී)	11	9	26	30	24	32	66	47	127	118
විද්‍යාවේදී මෙහෙයුම් තාක්ෂණ කළමනාකරණය (විශේෂවේදී)	8	7	11	17	16	14	15	17	50	55
විද්‍යාවේදී දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂවේදී)	1	1	7	4	4	17	7	31	19	53
විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂවේදී)	5	1	10	5	8	0	34	9	57	15
විද්‍යාවේදී මූල්‍ය කළමනාකරණ (විශේෂවේදී)	31	34	44	35	35	39	47	44	157	152
විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය (විශේෂවේදී))	5	10	23	10	21	18	16	18	65	56
විද්‍යාවේදී ව්‍යාපාර පද්ධති කළමනාකරණය (විශේෂවේදී)	4	3	3	5	11	10	30	27	48	45
විද්‍යාවේදී අලෙවි කළමනාකරණය (විශේෂවේදී)	9	7	17	29	21	24	42	33	89	93
විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂවේදී)	5	3	12	14	17	14	34	41	68	72
මුළු සංඛ්‍යාව	**181**	**182**	**295**	**307**	**290**	**292**	**479**	**389**	**1187**	**1170**

දේශීය සිසුන් පිළිබඳ විස්තර - 2023

උපාධි ඩැඩසටහන් (ඉංග්‍රීසි මාධ්‍යය)	වසර				මුළු උපාධි අපේක්ෂක සංඛ්‍යාව
	1	2	3	4	
කළමනාකරණ පොදු වැඩසටහන	929				929
විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂවේදී)		210	208	202	620
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) විශේෂවේදී		72	66	68	206
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂවේදී)		247	255	236	738
වාණිජවේදී (විශේෂවේදී)	122	128	131	122	503
විද්‍යාවේදී මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණ (විශේෂවේදී)		53	57	50	160
විද්‍යාවේදී දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂවේදී)	67	98	80	54	299
විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂවේදී)		22	29	24	75
විද්‍යාවේදී මූල්‍ය කළමනාකරණ (විශේෂවේදී)		157	156	151	464
විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂවේදී)		51	59	58	168
විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති කළමනාකරණය (විශේෂවේදී)	76	97	74	48	295
විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂවේදී)		95	89	89	273
විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) විශේෂවේදී	113	125	106	78	422
මුළු සංඛ්‍යාව	**1307**	**1355**	**1310**	**1180**	**5152**

කාර්යය මණ්ඩල විස්තරය

අධ්‍යයන කාර්යය මණ්ඩලය		පරිපාලන කාර්යය මණ්ඩලය	අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය	අනධ්‍යයන කාර්යය මණ්ඩලය)
ස්ථිර	තාවකාලික			
201	43	4	11	74

ස්ථිර අධ්‍යයන කාර්යය මණ්ඩලය

අධ්‍යයනාංශය	ජ්‍යෙෂ්ඨ මහාචාර්යය	මහාචාර්යය	සහාය මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය	කථිකාචාර්යය / කථිකාචාර්යය (ප්‍රායෝගික)	මුළු සංඛ්‍යාව
පීඨ කාර්යයාලය	0	0	0	7		7
ව්‍යාපාර පරිපාලන	0	4	0	16	4	24
රාජ්‍ය පරිපාලන	1	2	0	7	2	12
වාණිජ්‍ය		0	0	6	6	12
දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා	2	2	0	3	6	13
ගණකාධිකරණ අධ්‍යයන	2	6	0	10	6	24
අලෙවි කළමනාකරණ	2	2	1	7	2	14
මානව සම්පත් කළමනාකරණ	2	4	1	5	2	14
මූල්‍ය කළමනාකරණ	1	5	0	5	6	17
ව්‍යාපාර ආර්ථික විද්‍යා	1	4	0	9	4	18
තොරතුරු තාක්ෂණ	0	4	0	8	4	16
නීති අධ්‍යයන අංශය	1	3	0	9	5	18
ව්‍යාපාර සන්නිවේදන අංශය	0	2	0	6	4	12
මුළු සංඛ්‍යාව	**12**	**38**	**2**	**98**	**51**	**201**

පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2023

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශයට පත් කරන ලද	විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද
1	තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන			48
2	තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන		25	4
3	සම්මන්ත්‍රණ කටයුතු	සම්පූර්ණ පත්‍රිකා	32	2
		සාරාංශ	36	17
4	ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන		2	5
5	ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන	5.1 ප්‍රකාශකයකු විසින්	3	4
		5.2 කතුවරයා විසින්	1	
මුළු සංඛ්‍යාව			**99**	**80**



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිව්වන පීඨය ලෙස වෛද්‍ය විද්‍යා පීඨය 1993 වසරේ ආරම්භ කරන ලදී. 2023 වසර වන විට පීඨය දෙපාර්තමේන්තු 17 කින් සමන්විත අංග සම්පූර්ණ පීඨයක් දක්වා වර්ධනය වී ඇත.

2023 වර්ෂය තුළ වෛද්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන දෙපාර්තමේන්තු සහ අදාළ අංශ ප්‍රධානීන් පහත පරිදි වේ.

	අධ්‍යයනාංශය	අධ්‍යයනාංශ ප්‍රධානීන්
1.	ව්‍යුහ විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්යය පී.එච්.දිසානායක වෛද්‍ය වී තෙන්නකෝන් (30.09.2023 සිට)
2.	කායික විද්‍යා අධ්‍යයනාංශය	වෛද්‍ය එච්. වෛද්‍යසේකර
3.	ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්යය යූ.පී.කේ. හෙට්ටිආරච්චි මහාචාර්යය පී.පී.ආර්.පෙරේරා (01.10.2023 - 30.11.2023)
4.	පරපෝෂ විද්‍යා අධ්‍යයනාංශය	වෛද්‍ය ටී.ඩී.ජේ.කළුආරච්චි
5.	ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය	වෛද්‍ය ඩී.එම්.බී.ටී. දිසානායක
6.	ව්‍යාධි විද්‍යා අධ්‍යයනාංශය	වෛද්‍ය කේ.එච්.බී.පී.ප්‍රනාන්දුපුල්ලේ
7.	භිෂග්වේද අධ්‍යයනාංශය	වෛද්‍ය ජී.වී.එන්.සඳකුමාරි
8.	ප්‍රජා වෛද්‍ය විද්‍යා අධයයනාංශය	මහාචාර්යය කේ.එල්.එම්.ඩි.සෙනවිවික්‍රම
9.	අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්යය සංජය ආර් හුලන්තුඩුව
10.	වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය	වෛද්‍ය ජී.එන්.ඩී. පෙරේරා

	මහාචාර්යය චමිල් මුනසිංහ (25.03.2023 දක්වා)
11. ප්‍රසව හා නාරීවේද විද්‍යා අධ්‍යයනාංශය	වෛද්‍ය ආර්.සී.හුණුකුඹුරේ වෛද්‍ය එම්.ඒ.එම්.එම් ජයවර්ධන (14.08.2023 දක් දක්වා)
12. ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්යය ඩී.එස්. විජේසේකර මහාචාර්යය එම්.ඒ.එම්.එන්.ගමගේ (16.11.2023 දක්වා) මහාචාර්යය රුවන්ති පෙරේරා (31.07.2023 දක්වා)
13. ශල්‍ය වෛද්‍ය විද්‍යා අධයනාංශය	වෛද්‍ය මලිත් නන්දසේන මහාචාර්යය දීපිකා වීරසේකර (16.11.2023)
14. මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය	වෛද්‍ය එස්.එම්.පී.සෙනවිරත්න ඇලස්
15. පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය	වෛද්‍ය හිරන්ති ද සිල්වා වෛද්‍ය අරුණි ද සිල්වා (31.07.2023- 23.11.2023)
16. වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය	මහාචාර්යය ආර්. බී. මුණසිංහ
17. ප්‍රතිශක්තිකරණ හා අණුක වෛද්‍ය	මහාචාර්යය චන්දිම ජීවන්දර

පීඨය මඟින් පිරිනමන උපාධි හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා

උපාධි

- වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය
- විද්‍යාවේදි මානව ජීව විද්‍යා (විශේෂ) උපාධිය
- විද්‍යාවේදි මානව ජීව විද්‍යා උපාධිය

ඩිප්ලෝමා

- උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා
- අධිකරණ වෛද්‍ය විද්‍යාව හා විෂ වේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

කෙටි කාලීන පෘඨමාලා

- ජෛව සුරක්ෂිතතාව සහ ජෛව ආරක්ෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව

ඉගෙනීම සහ අධ්‍යාපනය

නව මෙහෙවර ප්‍රකාශය

පීඨයේ මෙහෙවර ප්‍රකාශය සංශෝධනය කරන ලදී.

"විවිධ ඉගෙනුම් අවස්ථා හරහා ගෝලීය වශයෙන් සෞඛ්‍ය සේවාව සැපයීමට සහ ඉදිරියට ගෙන යාමට බලය ලත් දක්ෂ සහ සමාජ වගකීම් සහිත වෘත්තිකයන් බිහි කිරීම"

පහත සඳහන් අගයන් හඳුනා ගන්නා ලදී.

1. අනුකම්පාව සහ සංවේදනය
2. අඛණ්ඩතාව සහ අවංකකම
3. ගෞරවය සහ නිහතමානිකම
4. විවිධත්වය සහ ඇතුළත් කිරීම

ශික්ෂණ රෝහල්

වෛද්‍ය සිසුන්ගේ සායනික පුහුණුව සඳහා හෝමාගම මූලික රෝහල සහ අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෝහල අඛණ්ඩව භාවිතා කිරීමට කැබිනට් තීරණය 22/2080/607/087 අනුමැතිය ලබාදී ඇත.

පර්යේෂණ හා සංවර්ධනය

වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICM 2023)

ICM 2023 සමාරම්භක උත්සවය 2023 ජුනි 8 වන දින ව්‍යුහ විද්‍යා ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. වෛද්‍ය විද්‍යා පීඨයේ දේශනය මහාචාර්ය මංජුල වීරසේකර විසින් පවත්වන ලදී.. සම්මන්ත්‍රණය 2023 ජුනි 9 වැනි දින පැවැත්විණි.

පර්යේෂණ සහයෝගිතා

- ජෛව ස්කන්ධ ඉන්ධන නිරාවරණය සහ සෞඛ්‍ය බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සඳහා කායික විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය විද්‍යා පීඨය සහ එක්සත් රාජධානියේ එඩින්බරෝ විශ්ව විද්‍යාලයේ RESPIRE 2 සමූහය අතර පර්යේෂණ සහයෝගීතාවයක් ආරම්භ කරන ලදි . මෙය අධීක්ෂණය කරනු ලැබුවේ මහාචාර්ය එස්.ඩබ්ලිව්.විමලසේකර විසිනි

ආහාරවල ට්‍රාන්ස් මේද සීමාව – 1980 අංක 26 දරන ආහාර පනතට ඇතුළත් කිරීම – ගැසට් නිවේදනය

2024 ජනවාරි සිට බලාත්මක වන ශ්‍රී ලංකා රජය විසින් ගැසට්-ආහාර (ට්‍රාන්ස්-මේද) රෙගුලාසි නිකුත් කිරීමේදී,ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අරමුදල් සපයන ආහාරවල ට්‍රාන්ස් මේදය පිළිබඳ රෙගුලාසි හඳුන්වාදීමේ අරමුණින් වෛද්‍ය විද්‍යා පීඨය (FMS), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලද 'ශ්‍රී ලංකාවේ ආහාරවල ට්‍රාන් මේදය පිළිබඳ භූ දර්ශන විශ්ලේෂණය' පිළිබඳ සහයෝගීතා පර්යේෂණයේ ප්‍රතිඵලය වී ඇත.

මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ FMS හි ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය , ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ආහාර විද්‍යා අධ්‍යනාංශය සහ වෛද්‍ය පීඨයේ ජෛව රසායන විද්‍යා අධ්‍යනාංශය විසින් අවසන් වාර්තාව සම්පාදනය කිරීම සමඟ

සිදු කරන ලදී. ව්‍යාපෘති නායිකාව ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ මහාචාර්ය සාගරිකා ඒකනායක මහත්මිය කටයුතු කරන ලදි.

යටිතල පහසුකම් සංවර්ධනය

ව්‍යුහ විද්‍යා ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණය කිරීම

ව්‍යුහ විද්‍යා ශ්‍රවණාගාරය බහුමාධ්‍ය, ආලෝකකරණ සහ ශබ්ද පද්ධතිවල නවතම දියුණුව සපුරාලන අංගසම්පූර්ණ ශ්‍රවණාගාරයක් ලෙස නවීකරණය කරන ලදී. එහි සිසුන් 300කට අසුන් ගැනීමේ හැකියාව ඇත. විවෘත කිරීමේ උත්සවය 2023 පෙබරවාරි 20 වන දින පැවැත්විණි.

යුහ විද්‍යාව ව්‍යාප්ති ගොඩනැගිල්ල නිම කිරීම

ව්‍යුහ විද්‍යා ව්‍යාප්ති ගොඩනැගිල්ලේ පළමු සහ දෙවන මහල නිම කර ඇති අතර පරපෝෂිත විද්‍යා, ව්‍යාධි විද්‍යා සහ ක්ෂුද්‍රජීව විද්‍යා දෙපාර්තමේන්තු මගින් ප්‍රයෝජනයට ගනු ඇත.

ප්‍රතිශක්තිකරණ දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කරන ලද තුන්වන මහල 2023.12.12 දින සිට භාවිතයට ගෙන ඇත.

සිසුන්ගේ ජයග්‍රහණ

SLCIM අන්තර් පීඨ අභ්‍යන්තර වෛද්‍ය ප්‍රශ්නාවලිය ජයග්‍රාහකයින්

ශ්‍රී ලංකා අභ්‍යන්තර වෛද්‍ය විද්‍යාලය 2023 ඔක්තෝම්බර් 3 වන දින අන්තර් පීඨ අභ්‍යන්තර වෛද්‍ය ප්‍රශ්නාවලියක් සංවිධානය කරන ලදී. 27 වන කණ්ඩායමේ සිසුන් පස් දෙනෙක් වෛද්‍ය විද්‍යා පීඨය නියෝජනය කරමින් එම ඉසව්වේ ශූරයන් බවට පත් වූහ.

ඉංග්‍රීසි සාහිත්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද අන්තර් වෛද්‍ය පීඨ විවාද තරගය

2023 අගෝස්තු 26 වැනි දින ඉංග්‍රීසි සාහිත්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද අන්තර් වෛද්‍ය පීඨ විවාද තරගයේ 3 වැනි ස්ථානය වෛද්‍ය විද්‍යා පීඨයේ විවාද කණ්ඩායම දිනා ගෙන ඇත.

ප්‍රජා ව්‍යාපෘති

24 වැනි දිරිය අරුණ ව්‍යාපෘතිය අනුරාධපුර පහළතලාව කනිෂ්ඨ විද්‍යාලයේ ශිෂ්‍ය සංගමය විසින් සිදු කරන ලදී.

වෙනත් ව්‍යාපෘති

පීඨයේ 30 වැනි සංවත්සරය (1993-2023) පහත සඳහන් සිදුවීම් සමඟින් සමරන ලදී.

• ටැලන්ට් 2023 නොවැම්බර් 6 වැනි දින රාජකීය විද්‍යාලයේ නවරංගහලදී පැවැත්විණි.
• පිරිත් සජ්ඣායනා උත්සවය
• Back to Faculty උත්සවය 2023 දෙසැම්බර් 17 (ඉරිදා) පැවැත්විණි
• වසර 25කට වැඩි කාලයක් පීඨයේ සේවය කර FMS වෙත මගපෙන්වූ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල විශ්‍රාමික සාමාජිකයින් මෙන්ම වත්මන් කාර්ය මණ්ඩලයට උපහාර දැක්වීමේ උත්සවය 2023 දෙසැම්බර් 17 වන දින පැවැත්විණි.

2022 හා 2023 වසර වල ප්‍රතිඵල සැසඳීම

උපාධි පාඨමාලාව	පළමු පෙළ		දෙවන පෙළ ඉහළ		දෙවන පෙළ පහළ		සාමාන්‍ය සාමාර්ථ		මුළු සමත් සංඛ්‍යාව	
	2022 වසර	2023 වසර	2022 වසර	2023 වසර	2022 වසර	2023 වසර	2022 වසර	2023 වසර	2022 වසර	2023 වසර
වෛද්‍යවේදී ශල්‍යවේදී උපාධිය	7	8	36	32	43	56	63	56	149	152
විද්‍යාවේදී මානව ජීව විද්‍යා (සාමාන්‍ය) උපාධිය	-	-	0	1	-	-	0	1	0	2
ඖෂධවේදී ගෞරව උපාධිය	0	3	5	7	5	5	9	16	19	31
විද්‍යාවේදී භෙද ගෞරව උපාධිය	0	0	4	7	5	3	14	16	23	26
විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා ගෞරව උපාධිය	1	0	5	7	7	5	15	10	28	22
විද්‍යාවේදී මානව ජීව විද්‍යා (ගෞරව) උපාධිය	-	-	-	-	-	-	-	-	-	-

*සටහන : 2021 ට පෙර ලියාපදිංචි වූ සම සෞඛ්‍ය සිසුන් සඳහා වන විභාග වෛද්‍ය විද්‍යා පීඨය මඟින් පවත්වා ඇත.*ශිෂ්‍ය හා සම්පත් විස්තරය 2023

පාඨමාලාව	ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන කාර්යය මණ්ඩලය		අනධ්‍යයන කාර්යය
		ස්ථිර	කොන්ත්‍රාත්	
වෛද්‍යවේදී ශල්‍යවේදී	1074	101	22	135
විද්‍යාවේදී මානව ජීව විද්‍යා (විශේෂ) උපාධිය	17			
මුළු සංඛ්‍යාව	**1091**	**101**	**22**	**135**

දේශීය ශිෂ්‍ය විස්තරය 2023

පාඨමාලාව	මාධ්‍යය	සිසුන් සංඛ්‍යාව					උපාධිධාරීන් සංඛ්‍යාව
		1 වන වසර	2 වන වසර	3 වන වසර	4 වන වසර	5 වන වසර	
වෛද්‍යවේදී ශල්‍යවේදී	සිංහල	200	201	195	158 + 162	159	152
විද්‍යාවේදී මානව ජීව විද්‍යා (විශේෂ) උපාධිය		6	4	3	4		2
මුළු සංඛ්‍යාව		**206**	**205**	**198**	**324**	**159**	**154**

අනධ්‍යයන කාර්යය මණ්ඩලය - 2023

පරිපාලන නිලධාරීන්	අධ්‍යයන සහායක නිලධාරීන්	ලිපිකරු, තාක්ෂණික හා ප්‍රාථමික ශ්‍රේණි
3	3	129

අධ්‍යයන කාර්යය මණ්ඩලය

අධ්‍යයනාංශය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	සහාය මහාචාර්යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්යය I ශ්‍රේණිය	ජ්‍යෙෂ්ඨ මහාචාර්යය II ශ්‍රේණිය	කථිකාචාර්යය	කථිකාචාර්යය (ආයුනික)	මුළු සංඛ්‍යාව
ව්‍යුහ විද්‍යා	1	2	0		3	1		7
කායික විද්‍යා	1	2	0	1	4	0	2	10
ජෛව රසායන විද්‍යා	1	4	0	1	0	1	1	8
පරපෝෂ විද්‍යා	1	2		0	1	1	1	6
ක්ෂුද්‍ර ජීව විද්‍යා	1	3	1	1	0	0		6
ව්‍යාධි විද්‍යා	0	4	1	2	2	0	1	10
භිෂග්වේද	0	2	0	0	1	1	0	4
ප්‍රජා වෛද්‍ය	0	3	0	1		1	0	5

අධිකරණ වෛද්‍ය විද්‍යා	0	3	0	2	0	1	0	6
වෛද්‍ය විද්‍යා	1	1	0	3	1	0	0	6
ප්‍රසව හා නාරීවේද	0	2	0	2	1	0	0	5
ළමා රෝග විද්‍යා	0	5	0		1		0	6
ශල්‍ය වෛද්‍ය විද්‍යා	2	3	0	0	2	0	0	7
මනෝ වෛද්‍ය විද්‍යා	0	0	0	2	2	1	0	5
පවුල් වෛද්‍ය විද්‍යා	0	1	0	0	2	1	1	5
වෛද්‍ය අධ්‍යාපන	0	1	0	0	0	0	0	1
ප්‍රතිශක්තිකරණ හා අණුක වෛද්‍ය විද්‍යා		2	0	0	0	0	0	2
වෙනත් මධ්‍යස්ථාන හා	0	0	0	0	0	0	2	2
මුළු සංඛ්‍යාව	**8**	**40**	**2**	**15**	**20**	**8**	**8**	**101**

පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2023

ප්‍රකාශන කාණ්ඩය			සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශයට පත් කරන ලද	විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද
1	තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන		4	82
2	තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන		19	3
3	සම්මන්ත්‍රණ කටයුතු	3.1 සම්පූර්ණ පත්‍රිකා	7	4
		3.2 සාරාංශ	143	31
4	ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන		3	30
5	ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන	5.1 ප්‍රකාශකයකු විසින්	4	
		5.2 කතුවරයා විසින්		
මුළු සංඛ්‍යාව			180	150

පශ්චාද් උපාධි පීඨය



1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 48A වගන්තිය යටතේ 1996 ජනවාරි මස විශ්වවිද්‍යාලය තුළ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය (FGS) ආරම්භ කරන ලදී. පනතට අනුව, පර්යේෂණ ප්‍රවර්ධනය සහ අධ්‍යයන පාඨමාලා උසස් උපාධි සහ අනෙකුත් විශිෂ්ටතා සැපයීම සඳහා වන ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වන්නේමෙම පීඨයයි. පීඨයේ දැක්ම වන්නේ "දිවයින තුළ සහ ඉන් පිටතදීත් උසස් ඉගෙනුම්, පර්යේෂණ සහ ශිෂ්‍යත්ව සඳහා විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ලෙස ස්ථීර වශයෙන්ම ස්ථාපනය වීමයි".

අධ්‍යයන හා පරිපාලන කටයුතු මෙහෙයවන පීඨාධිපතිවරයෙකුගේ අධීක්ෂණය යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය පවතී. සහකාර ලේඛකාධිකාරීවරයෙකු මෙහෙයුම් අංශයේ ප්‍රධානියා වන අතර ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයෙකු මූල්‍ය අංශයේ ප්‍රධානියා වේ.

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි අධ්‍යයන වැඩසටහන් පවත්වනු ලබන්නේ අධ්‍යයන මණ්ඩල 9ක් හරහා වන අතර ඒවා විශ්වවිද්‍යාලයේ අනෙකුත් පීඨ සහ අධ්‍යයන දෙපාර්තමේන්තු සමඟ සමීප සහයෝගිතාවයකින් යුක්ත වේ. මෙම අධ්‍යයන මණ්ඩල මානව ශාස්ත්‍ර, සමාජීය විද්‍යා, ජීව විද්‍යා, භෞතික විද්‍යා, කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ, වෛද්‍ය විද්‍යා, බහුවිධ අධ්‍යයන, ඉංජිනේරු සහ කාර්මික තාක්ෂණය යනාදියයි. පීඨය විසින් පිරිනමනු ලබන වැඩසටහන් අතර සහතික පත්‍ර පාඨමාලා, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, වසරක ශාස්ත්‍රපති උපාධි, පාඨමාලා වැඩ සහ පර්යේෂණ මගින් ශාස්ත්‍රපති උපාධි සහ පර්යේෂණ මගින් පමණක් උසස් උපාධි පාඨමාලා ඇතුළත් වේ. රටේ උසස් අධ්‍යාපනයේ මිණුම් ලකුණක් වන ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව ඔස්සේ සියලුම වැඩසටහන් පෙළගස්වා ඇත .

FGS විසින් පිරිනමනු ලබන පාඨමාලා සඳහා SLQF මට්ටම් සහ ලියාපදිංචිය සඳහා ඔවුන්ගේ සුදුසුකම් නිර්ණායක පහත දැක්වේ

ශ්‍රී ලංකා සුදුසුකම් රාමු මට්ටම	**පිරිනමනු ලබන සුදුසුකම්**	**අධ්‍යයන සම්භාර ගණන / අධ්‍යයන කාලසීමාව**	**යෝග්‍යත්ව**
7	පශ්චාත් උපාධි සහතික පත්‍ර	20	SLQF 5 හෝ 6
8	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	25	SLQF 5 හෝ 6
9	පාඨමාලා කටයුතු අනුව ලබාදෙන ශාස්ත්‍රපති උපාධිය (වසරක්)	30	SLQF 5 හෝ 6
10	පාඨමාලා කටයුතු සහ පර්යේෂණ මඟින් ලබාදෙන ශාස්ත්‍රපති උපාධිය	60	SLQF 5 හෝ 6
11	පර්යේෂණ මගින් ලබාදෙන ශාස්ත්‍රපති	දෙවසරක පූර්ණ කාලීන	SLQF 5 හෝ 6

	උපාධිය (MAR)		
11	දර්ශනපති උපාධිය (M Phil)	දෙවසරක පූර්ණ කාලීන	SLQF 6 සහ ඉහළ
12	ආචාර්ය උපාධිය (PhD)	තෙවසරක පූර්ණ කාලීන	SLQF 6 සහ ඉහළ

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් පිරිනමනු ලබන සියලුම පාඨමාලා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (SLQF – 2015) ගැලපෙන පරිදි සකස් කර ඇත. ඉගෙනීමේ ප්‍රධාන විෂය හතරක්: එනම්, දැනුම, කුසලතා, ආකල්ප සහ මනෝවිභිතිය සහ සුසමාදර්ශය K-SAM ආකෘතිය මඟින් විදහා දැක්වේ. අදාළ ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කරගත හැකි පරිදි සියලු පාඨමාලා සකස් කර ඇත. මූලික ක්ෂේත්‍ර සහ ඉගෙනුම් ප්‍රතිඵල කාණ්ඩ පහත දැක්වේ;

ප්‍රධාන ක්ෂේත්‍රය	**ඉගෙනුම් ඵල කාණ්ඩ**
දැනුම	විෂය / න්‍යායික දැනුම
	ප්‍රායෝගික දැනුම සහ භාවිතය
නිපුණතා	සන්නිවේදන
	කණ්ඩායම් වැඩ සහ නායකත්වය
	නිර්මාණශීලීත්වය සහ ගැටලු විසඳීම
	කළමනාකරණ සහ ව්‍යවසායකත්වය
	තොරතුරු භාවිතය සහ කළමනාකරණය
	ජාලකරණය සහ සමාජ කුසලතා
	අනුවර්තනය වීමේ හැකියාව සහ නම්‍යශීලී බව
ආකල්ප, වටිනාකම්, වෘත්තීයභාවය සහ ජීවිතය සඳහා දැක්ම	ආකල්ප, සාරධර්ම සහ වෘත්තීය දක්ෂතා
	ජීවිතය සඳහා දැක්ම
මනස සකස් කිරීම සහ සුසමාදර්ශය	ස්වයං / යාවජීව අධ්‍යාපනය යාවත්කාලීන කිරීම

පශ්චාද් උපාධි ශිෂ්‍ය තොරතුරු

2023 වර්ෂයට අදාලව පශ්චාද් උපාධි අධ්‍යයන වැඩසටහන් සඳහා සම්බන්ධ වූ සිසුන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

පාඨමාලා	**සිසුන් බඳවා ගැනීම**
සහතික පත්‍ර පාඨමාලා	
ආයතනික පාරිසරික තිරසාරත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	4
ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	52
පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලා	
ලේඛකත්ව හා ජන සන්නිවේදනය පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	10
අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	35
අලෙවි කළමනාකරණ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	21
අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	20
ව්‍යවහාරික මූල්‍ය පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	38
සමාජ විද්‍යා පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	5

සමාජ සංඛ්‍යානය පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	19
විද්‍යාපති පාඨමාලා	
ව්‍යාපාර ආර්ථික විද්‍යාපති	28
ආර්ථික විද්‍යා විද්‍යාපති	63
ව්‍යවසායකත්ව ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති	105
කාර්මික කාබනික රසායනික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති	4
රාජ්‍ය කළමනාකරණපති	1
සමාජවිද්‍යාපති	179
ව්‍යාපාර පරිපාලනපති/ කළමනාකරණ විද්‍යාපති	498
ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති	70
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති	228
මත්ස්‍ය හා ජලජීවී සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති	9
ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති	17
වන විද්‍යා හා පාරිසරික විද්‍යාව පිළිබඳ විද්‍යාපති	93
භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදය පිළිබඳ විද්‍යාපති	219
විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති	150
කාර්මික ගණිතය පිළිබඳ විද්‍යාපති	13
කාර්මික කාබනික රසායනික විද්‍යාව පිළිබඳ විද්‍යාපති	11
බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති	175
දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාපති	47
රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති	17
දේපළ කළමනාකරණ හා තක්සේරුකරණ පිළිබඳ විද්‍යාපති	36
දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති	133
ව්‍යවහාරික මූල්‍ය විද්‍යාපති	78
උපදිෂ්ට ශාස්ත්‍රපති සිංහල	1
උපදිෂ්ට ශාස්ත්‍රපති සංස්කෘතික අධ්‍යයනය	1
උපදිෂ්ට ශාස්ත්‍රපති මනෝ විද්‍යාව	4
උපදිෂ්ට ශාස්ත්‍රපති බෞද්ධ ශිෂ්ටාචාරය	2
උපදිෂ්ට ශාස්ත්‍රපති බෞද්ධ දර්ශනය	1
උපදිෂ්ට ශාස්ත්‍රපති දර්ශනය	3
උපදිෂ්ට ශාස්ත්‍රපති ආර්ථික විද්‍යාව	2
ශාස්ත්‍රපති යෝග්‍යතා පරීක්ෂණය සමාජ විද්‍යාව	2
උපදිෂ්ට ශාස්ත්‍රපති අපරාධ විද්‍යාව	33
දර්ශනපති	
දර්ශනපති පුරාවිද්‍යාව	4
දර්ශනපති ජන සංනිවේදනය	2
දර්ශනපති ව්‍යුහ විද්‍යාව	5
දර්ශනපති මානව විද්‍යාව	2
දර්ශනපති පුරාවිද්‍යාව	6
දර්ශනපති පෛව රසායනය	12
දර්ශනපති උද්භිද විද්‍යාව	6

දර්ශනපති බෞද්ධ සංස්කෘතිය	3
දර්ශනපති ව්‍යාපාර ආර්ථික විද්‍යාව	5
දර්ශනපති රසායන විද්‍යාව	30
දර්ශනපති ප්‍රජා වෛද්‍ය විද්‍යාව	26
දර්ශනපති පරිගණක විද්‍යාව	7
දර්ශනපති අපරාධ විද්‍යාව	5
දර්ශනපති උද්භිද විද්‍යාව	2
දර්ශනපති බෞද්ධ සංස්කෘතිය	5
දර්ශනපති ආර්ථික විද්‍යාව	1
දර්ශනපති ඉංග්‍රීසි	2
දර්ශනපති ඉන්ජිනේරු විද්‍යාව	15
දර්ශනපති ආහාර විද්‍යාව	7
දර්ශනපති වන විද්‍යාව	4
දර්ශනපති භූගෝල විද්‍යාව	7
දර්ශනපති ඉතිහාසය	3
දර්ශනපති ගණිතය	8
දර්ශනපති වෛද්‍ය අධ්‍යාපනය සහ සෞඛ්‍ය විද්‍යාව	11
දර්ශනපති වෛද්‍ය රසායනාගාර විද්‍යාව	1
දර්ශනපති ක්ෂුද්‍ර ජීව විද්‍යාව	17
දර්ශනපති බහුවිෂයික	18
දර්ශනපති සංගීත	1
දර්ශනපති පාලි	1
දර්ශනපති පරපෝෂිත විද්‍යාව	2
දර්ශනපති ව්‍යාධි විද්‍යාව	1
දර්ශනපති ඖෂධවේදය	3
දර්ශනපති දර්ශනය	11
දර්ශනපති භෞතික විද්‍යාව	3
දර්ශනපති කායික විද්‍යාව	4
දර්ශනපති බහු අවයවික විද්‍යාව	1
දර්ශනපති මනෝවිද්‍යාව	2
දර්ශනපති සංස්කෘත භාෂාවෙන්	3
දර්ශනපති සිංහලෙන්	5
දර්ශනපති සමාජ විද්‍යාව පිළිබඳ	2
දර්ශනපති සංඛ්‍යාලේඛන	5
දර්ශනපති තාක්ෂණය	36
දර්ශනපති සත්ත්ව විද්‍යා	16
එකතුව	310
දර්ශනසූරී	
පුරාවිද්‍යාව පිළිබඳ දර්ශණශූරී	3
ජෛව රසායනය පිළිබඳ දර්ශණශූරී	1
උද්භිද විද්‍යාව පිළිබඳ දර්ශණශූරී	2
බෞද්ධ දර්ශනය පිළිබඳ දර්ශණශූරී	1

රසායන විද්‍යාව පිළිබඳ දර්ශණශූරී	3
ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශණශූරී	1
පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශණශූරී	10
අපරාධ විද්‍යාව පිළිබඳ දර්ශණශූරී	41
සංස්කෘතික අධ්‍යයනය දර්ශණශූරී	1
නර්ථනය දර්ශනශූරී	1
ඉංග්‍රීසි භාෂාවෙන් දර්ශණශූරී	1
ඉංජිනේරු විද්‍යාව දර්ශණශූරී	7
ආහාර විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය	13
වන විද්‍යාව සහ පාරිසරික කළමනාකරණය දර්ශණශූරී	4
භූගෝල විද්‍යාව පිළිබඳ දර්ශණශූරී	1
ඉතිහාසය පිළිබඳ දර්ශණශූරී	3
කළමනාකරණය දර්ශණශූරී	164
වෛද්‍ය අධ්‍යාපනය සහ සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ දර්ශණශූරී	5
වෛද්‍ය රසායනාගාර විද්‍යාව දර්ශණශූරී	1
ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ දර්ශණශූරී	3
බහු විෂය පිළිබඳ දර්ශණශූරී	10
සංගීතය පිළිබඳ දර්ශණශූරී	3
පාලි භාෂාව දර්ශනශූරී	1
ෆාමසි සහ ඖෂධ විද්‍යාව දර්ශණශූරී	1
දර්ශනය පිළිබඳ දර්ශණශූරී	1
මනෝචිකිත්සාව දර්ශණශූරී	1
පොලිමර් විද්‍යාව දර්ශණශූරී	1
තාක්ෂණය පිළිබඳ දර්ශණශූරී	4
සත්ව විද්‍යාව පිළිබඳ දර්ශණශූරී	7
මුළු සංඛ්‍යාව	**3032**

උපාධි අධ්‍යයන පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව (ERC)

2023 වසර සඳහා, ERC-AS වෙත අයදුම්පත් හතක් (සහතික හයක් නිකුත් කර ඇති අතර එකක් ක්‍රියාත්මක වෙමින් පවතී), REC-HSS වෙත අයදුම්පත් විසිතුනක් ලැබුණි (සහතික විස්සක් නිකුත් කරන ලදී, අයදුම්කරු හේතුවෙන් අයදුම්පත් දෙකක් අත්හිටුවා ඇත. ඉල්ලීම්), සහ එක් අයදුම්පතක් ප්‍රතික්ෂේප කරන ලදී.

පර්යේෂණ හා ප්‍රකාශන

බහුවිධ ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව - 2023

2024 පෙබරවාරි 6 වන දින, බහුවිධ ප්‍රවේශයන් පිළිබඳ 10 වැනි ජාත්‍යන්තර සමුළුව (iCMA) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලදී. ‘‘බහු විෂය පර්යේෂණ හරහා ගෝලීය දැනුම කරා’’ යන්න සම්මන්ත්‍රණයේ තේමාව විය. සමාරම්භක උත්සවය සෙනෙට් මණ්ඩල ශාලාවේදී පැවැත්විණි.
රධාන ආරාධිතයා වූයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පත්මලාල් (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති) වන අතර ප්‍රධාන කථිකයා වූයේ මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා (කොළඹ විශ්වවිද්‍යාලයීය ජනවිද්‍යාව පිළිබඳ විශිෂ්ඨ මහාචාර්ය) ය. 2023 බහුවිධ ප්‍රවේශයන් පිළිබඳ 10 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ (iCMA) පීඨාධිපති මහාචාර්ය පී.පී. රසික පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

10th ICMA 2023 සඳහා විද්‍යාත්මක සාරාංශ 110ක් ලැබුණු අතර, එය අධ්‍යයන සම්මන්ත්‍රණ කමිටුව විසින් තිරගත කරන ලදී. විශේෂඥයන් විසින් සාරාංශ ඇගයීමට ලක් කරන ලද අතර, ප්‍රකාශයට පත් කිරීම සඳහා පර්යේෂණ පත්‍රිකා 90 ක් තෝරා ගන්නා ලදී. පිළිගත් පත්‍රිකා පහත ලැයිස්තුගත කර ඇති තේමාත්මක අධ්‍යයන මාතෘකා හයට සම්බන්ධ වේ.

1. ඉංජිනේරු, තාක්ෂණ සහ භෞතික විද්‍යා

2. පරිසර දූෂණය සහ ස්වභාවික සම්පත් කළමනාකරණය

3. සෞඛ්‍ය විද්‍යා සහ පෝෂණය

4. මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා සහ අධ්‍යාපනය

5. කළමනාකරණය, වාණිජ, පාලනය සහ කර්මාන්ත සංවර්ධනය

6. ස්වභාවික සහ ජීව විද්‍යාව

බහුවිධ අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර සඟරාව

IJMS පර්යේෂකයන්ට ඔවුන්ගේ බහුවිධ පර්යේෂණ සොයාගැනීම් බෙදා ගැනීමට වේදිකාවක් සපයයි. එය සෑම වසරකම කලාප දෙකක් සහිත ද්විවාර්ෂික ප්‍රකාශනයකි. 10 වන වෙළුම 2023 දී නිකුතු දෙකකින් ප්‍රකාශයට පත් කරන ලදී



විශ්වවිද්‍යාල අතර 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දුන් අ.පො.ස. උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාවට සරිලන පරිදි, රජයේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තාක්ෂණ පීඨය පිහිටුවීම සඳහා ඉදිරිපත් වූ පළමු විශ්වවිද්‍යාලය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයි. යෝජිත තාක්ෂණ විෂයමාලා 2015 සැප්තැම්බර් 23 වැනි දින විශ්වවිද්‍යාල සනාතන සභාවේ අනුමැතිය මත විශ්වවිද්‍යාල සභාවට නිර්දේශ කරන ලදී. 2015 ඔක්තෝබර් 08 වැනි දින කරන ලද නිර්දේශය අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි පාඨමාලා කේන්ද්‍ර කරගත් ක්ෂේත්‍ර 09 ඇතුළු වැඩසටහන් තුනක් සඳහා යෝජිත තාක්ෂණ විෂයමාලාව 2015 නොවැම්බර් 19 වැනි දින අනුමත කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතාගේ හා ඔහුගේ කණ්ඩායමේ අප්‍රමාණ උත්සාහය, කැපවීම හා දැක්ම යථාවත් කරමින් ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2016 ජනවාරි 08 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය (1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ අංක 1948/59 නියෝගය) මගින් තාක්ෂණ පීඨය පිහිටුවීම නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී .

මූලික අදියරේදී තාක්ෂණ පීඨය නුගේගොඩ තාවකාලික පරිශ්‍රයක ස්ථාපිත කර පසුව පිටිපන ටෙක්නෝ පාර්ක් හි ස්ථිර ස්ථානයකට ගෙන යන ලදී. අංගසම්පූර්ණ නව පීඨ පරිශ්‍රය 2020 ජුනි 8 වන දින අතිගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් විවෘත කරන ලදී.
2023 වර්ෂය තුළ දෙපාර්තමේන්තු පහේ පීඨාධිපතිවරු සහ අංශාධිපතිවරු පහත පරිදි වේ.

පීඨාධිපති මහාචාර්යය ඒ.එච්.එල්.ආර්. නිල්මිණි මහත්මිය

	අධ්‍යයනාංශය	**අධ්‍යයනාංශ ප්‍රධාන**
(i)	ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය	අචාර්යය එස්.ඩී. උදයංග
(ii)	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශ	අචාර්යය පී.එල්.එම්.ප්‍රභානි
(iii)	සිවිල් හා පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය	අචාර්යය ඩබ්ලිව්.ජී. සකුරා
(iv)	ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය	ඉන්ජිනේරු ඩබ්ලිව්.ආර්. ද මෙල්
(v)	තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය	අචාර්යය ජී.ජයකොඩි

ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය (BST) ජෛව පද්ධති තාක්ෂණ උපාධිය (BBST) ගෞරව උපාධි වැඩසටහන් පවත්වයි. BBST ගෞරව උපාධි වැඩසටහන ශ්‍රී ලංකා ජාතික ජෛව තාක්ෂණ කර්මාන්ත සංගමය (NBIA) විසින් ප්‍රතිතනය කරනු ලැබේ. ජෛව පද්ධති තාක්ෂණ වැඩසටහන මගින් ආහාර සැකසුම් තාක්ෂණය, කෘෂිකර්මය සහ පරිසර තාක්ෂණය, සහ කාර්මික ජෛව පද්ධති තාක්ෂණය යන කේන්ද්‍රගත ක්ෂේත්‍ර තුනක දක්ෂ උපාධිධාරීන් බිහි කරනු ඇත.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගෞරව උපාධි වැඩසටහන පවත්වයි. මෙම උපාධි වැඩසටහන ශ්‍රී ලංකා පරිගණක සංගමය (CSSL) විසින් ප්‍රතිතනය කරනු ලැබේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වැඩසටහන මඟින් මෘදුකාංග තාක්ෂණය, බහුමාධ්‍ය තාක්ෂණය සහ ජාල තාක්ෂණය යන විශේෂතා තුනෙහි දක්ෂ උපාධිධාරීන් බිහි කරනු ඇත.

සිවිල් හා පාරිසරික තාක්ෂණ අධ්‍යනාංශය 2020 දී ආරම්භ කරන ලද්දේ ලෝක මට්ටමේ සිවිල් සහ පාරිසරික තාක්ෂණ භාවිතය සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාවන්ගෙන් සිසුන් සන්නද්ධ කිරීම සඳහා ය. මෙයින් ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ ගෞරව උපාධි වැඩසටහන පිරිනමයි. ඉංජිනේරු තාක්ෂණ වැඩසටහන මඟින් ඉදිකිරීම් සහ ගොඩනැගිලි සේවා තාක්ෂණය, බලශක්ති සහ පාරිසරික තාක්ෂණය සහ භූ තාක්ෂණය යන විශේෂතා තුනෙහි දක්ෂ උපාධිධාරීන් බිහි කරනු ඇත. සිඩ්නි ගිවිසුමට අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) ඉංජිනේරු තාක්ෂණ උපාධි වැඩසටහන් හඳුනාගැනීමේ අත්පොත මගින් විෂයමාලා මෙහෙයවනු ලැබේ.

ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යනාංශය 2020 දී ආරම්භ කරන ලදී. දෙපාර්තමේන්තුව ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ ගෞරව උපාධි වැඩසටහන පිරිනමයි. ඉංජිනේරු තාක්ෂණ වැඩසටහන මගින් යාන්ත්‍රික තාක්ෂනය, මොටර් රථ තාක්ෂණය , සහ බහු අවයවක සැකසුම් යන විශේෂතා තුනෙහි දක්ෂ උපාධිධාරීන් බිහි කරනු ඇත. සිඩ්නි ගිවිසුමට අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) ඉංජිනේරු තාක්ෂණ උපාධි වැඩසටහන් හඳුනාගැනීමේ අත්පොත මගින් විෂයමාලා මෙහෙයවනු ලැබේ.

තාක්ෂණ විද්‍යා අධ්‍යනාංශය 2020 දී ආරම්භ කරන ලද අතර, උපාධි තුනේ වැඩසටහන් වල පළමු සහ දෙවන අධ්‍යයන වාරයට අදාළ සියලුම වැඩසටහන් පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කර ඇත. අධ්‍යයනයේ පළමු වසර දෙක ප්‍රධාන වශයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ගණිතය සහ මූලික පරිගණක කුසලතා, ඉංග්‍රීසි සහ කළමනාකරණ විෂයයන්ගෙන් සමන්විත වේ. ප්‍රතිතන අත්පොත්වල ඇති මාර්ගෝපදේශවලට අනුව, සිසුන්ට ඔවුන්ගේ පළමු වසර අධ්‍යයන කාලය තුළ කුඩා ව්‍යාපෘතියක නිරත විය යුතුය. කථිකාචාර්යවරුන්ගේ හැසිරීමට අමතරව, පළමු වසරේ සිසුන් සඳහා කුඩා ව්‍යාපෘති පැවැත්වීම සඳහා තාක්ෂණ විද්‍යා දෙපාර්තමේන්තුව වගකිව යුතුය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ හත්වැනි බඳවාගැනීම් සඳහා වූ දිශානති වැඩසටහන 2023 ජූලි 17 වැනි දින පිටිපන, තාක්ෂණ පීඨයේදී ආරම්භ විය.

පීඨය විසින් පිරිනමනු ලබන උපාධි සහ ඩිප්ලෝමා

උපාධි

- ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධි වැඩසටහන
- ජෛව පද්ධති තාක්ෂණ ගෞරව උපාධි වැඩසටහන
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ගෞරව උපාධි වැඩසටහන

ඩිප්ලෝමාව

- බහුඅවයවික සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමාව
- රූපලාවණ්‍ය තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව

අධ්‍යාපනය හා සංවර්ධනය

මෙම පීඨය විසින් ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශයෙන් පොලිමර් සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමාව සහ පෙව පද්ධති තාක්ෂණ දෙ අධ්‍යයනාංශයෙන් රූපලාවන්‍ය තාක්ෂණ ඩිප්ලෝමාව යන නව ඩිප්ලෝමා වැඩසටහන් දෙකක් හඳුන්වා දී ඇත.

පොලිමර් සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමාව

ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය විසින් පිරිනමනු ලබන පොලිමර් සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමාව (SLQF 03/අර්ධකාල/වසර 1) බහු අවයවික සැකසුම් තාක්ෂණයන් සහ ඒ ආශ්‍රිත අධිතාක්ෂණික බහු අවයවක උපකරණ විශ්ලේෂණය පිළිබඳ මූලික කරුණු හඳුන්වා දීම සඳහා නිර්මාණය කර ඇත. මෙය න්‍යායික සහ රසායනාගාර ප්‍රායෝගික සැසි දෙකෙහිම පවත්වනු ලැබේ. න්‍යායික මොඩියුල පොලිමර් තාක්ෂණයේ මූලික ක්ෂේත්‍රවල මූලික දැනුම ලබා දීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර රසායනාගාර සැසි මූලික වශයෙන් අවධානය යොමු කර ඇත්තේ අධි තාක්ෂණික උපකරණ භාවිතයෙන් පොලිමර් සැකසුම් සහ දේපල විශ්ලේෂණය පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ලබා දීමයි

රූපලාවණ්‍ය තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව

රූපලාවණ්‍ය තාක්ෂණ ඩිප්ලෝමාව අධ්‍යයන වැඩසටහන (SLQF 03) පැය 390කට ආසන්න පාඨමාලා වැඩ (න්‍යාය බැර 26), පැය 90ක ප්‍රායෝගික පන්ති, නිබන්ධන, කාර්මික චාරිකා, කුඩා පර්යේෂණ ව්‍යාපෘති සහ තනි පුද්ගල න්‍යායික දැනුමේ ශක්තිමත් පදනමකින් සහ කණ්ඩායම් ඉදිරිපත් කිරීම් අංග දෙකෙන්ම පොහොසත් වේ. මෙම පාඨමාලාවේ අරමුණු වන්නේ රූපලාවණ්‍ය විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ මූලික මූලධර්ම සැපයීම, රූපලාවන්‍ය ද්‍රව්‍ය මාලාවක් සංවර්ධනය කිරීමේ ප්‍රායෝගික අත්දැකීම් සහ ඒවායේ තත්ත්ව පාලන විශ්ලේෂණයන් සැපයීම සහ කුඩා රූපලාවන්‍ය නිෂ්පාදනයක් ආරම්භ කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා නායකත්වය සහ කළමනාකරණ කුසලතා ලබා දීමයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක් විසින් පිරිනමනු ලබන රූපලාවන්‍ය තාක්ෂණය පිළිබඳ එකම ඩිප්ලෝමා පාඨමාලාව මෙය වේ.

රූපලාවණ්‍ය තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහනේ පළමු කණ්ඩායම 2023 ජූලි 1 වන දින ආරම්භ විය. වැඩසටහනේ දෙවන කණ්ඩායම සඳහා දැන් අයදුම්පත් විවෘත කර ඇති අතර 2023 දෙසැම්බර් වන විට අයදුම් කිරීමට අපේක්ෂකයින්ට ආරාධනා කෙරේ.

පර්යේෂණ හා පර්යේෂණ සමුළු

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය විසින් සංවිධානය කරන ලද නවෝත්පාදන සහ නැගී එන තාක්ෂණයන් පිළිබඳ තුන්වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2023 (ICIET 2023) 2023 නොවැම්බර් 23 සිට 24 දක්වා, ආර්ථික ප්‍රතිශක්තිය සඳහා තිරසාර තාක්ෂණ යන තේමාව යටතේ පැවැත්විණි.

තාක්ෂණයේ දියුණුව (Adv. Technol.) යනු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය විසින් 2021 දී ආරම්භ කරන ලද, සැමට ප්‍රවේශ විය හැකි සම-සමාලෝචනය කරන ලද පර්යේෂණ සඟරාවකි. මෙම සඟරාව ව්‍යවහාරික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව සහ අධ්‍යාපනය වැනි ක්ෂේත්‍රවල යෙදීම් සහ තාක්ෂණය පිළිබඳ දැනුම සම්බන්ධ න්‍යායාත්මක හා පර්යේෂණාත්මක පර්යේෂණ කෙරෙහි අවධානය යොමු කරයි. එය 2773-7098 ISSN අංකයක් දරයි. 2023 වර්ෂයේදී, තාක්ෂණයේ දියුණුව සඟරාව, මූලික පර්යේෂණවල සිට ව්‍යවහාරික පර්යේෂණ දක්වා තාක්ෂණ පර්යේෂණවල වැදගත්කම ඉස්මතු කරන ලිපි ඇතුළත් ගැටලු තුනක් ප්‍රකාශයට පත් කළේය.

2022 හා 2023 වසර වල ප්‍රතිඵල සැසඳීම

උපාධි පාඨමාලාව	පළමු පෙළ		දෙවන පෙළ ඉහළ		දෙවන පෙළ පහළ		සමත්		මුළු සමත් සංඛ්‍යාව	
	2022	**2023**	**2022**	**2023**	**2022**	**2023**	**2022**	**2023**	**2022**	**2023**
ජෛව පද්ධති තාක්ෂණ උපාධිය	6	4	36	27	27	25	17	22	86	78
සිවිල් හා ඉංජිනේරු තාක්ෂණ උපාධිය	3	4	27	39	53	51	76	45	159	139
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය	3	5	12	18	22	12	32	27	69	62
මුළු සංඛ්‍යාව	**12**	**13**	**75**	**84**	**102**	**88**	**125**	**94**	**314**	**279**

ශිෂ්‍ය සම්පත් විස්තරය 2023

අධ්‍යයනාංශය	මුළු සිසුන්	අධ්‍යයන කාර්යය මණ්ඩලය		අනධ්‍යයන කාර්යය මණ්ඩලය
		ස්ථිර	කොන්ත්‍රාත්	
ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය	342	21	62	12
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය	356	8		5
සිවිල් හා ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය	252	12		11
ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය	250	15		12
තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය	470	5		2
පීඨ කාර්යයාලය	-			21
මුළු සංඛ්‍යාව	**1670**	**61**	**62**	**63**

අධ්‍යයන කාර්යය මණ්ඩලය

අධ්‍යයනාංශය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	ආධුනික කථිකාචාර්ය	මුළු සංඛ්‍යාව
ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය	-	2	-	18	1	21
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය	-	-		5	3	8
සිවිල් හා ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය	-		2	9	1	12
ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය	-	1	1	8	5	15
තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය	-	-	1	3	1	5
මුළු සංඛ්‍යාව	**0**	**3**	**4**	**43**	**11**	**61**

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශයට පත් කරන ලද	විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද
1	තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන		2	16
2	තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන		5	11
3	සම්මන්ත්‍රණ කටයුතු	3. සම්පූර්ණ පත්‍රිකා	1	
		3.2 සාරාංශ	40	15
4	ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන			5
5	ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන	5.1 ප්‍රකාශකයා විසින්	1	1
		5.2 කතුවරයා විසින්		
	මුළු සංඛ්‍යාව		**49**	**48**

ඉන්ජිනේරු පීඨය



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින රාජ්‍ය විශ්වවිද්‍යාලය සතු නවතම ඉංජිනේරු පීඨය වේ. 2016 ජනවාරි මස පිහිටුවන ලද, එය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන වැඩසටහන් පිරිනැමීමේ වරමක් සහිත අධ්‍යයන දෙපාර්තමේන්තු පහකින් සමන්විත වන අතර එමඟින් ‘‘ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය ’’ ප්‍රදානය කෙරේ.

මෙම ඉංජිනේරු පීඨය පහත සඳහන් පරිදි අධ්‍යයන දෙපාර්තමේන්තු පහකින් සමන්විත වේ

පීඨාධිපති **අචාර්යය එම්.එන්.ධර්මවීර**

	1. අධ්‍යයනාංශ	අධ්‍යයනාංශ ප්‍රධාන
2.	සිවිල් ඉන්ජිනේරු අධ්‍යනාංශය	ආචාර්යය ජී.එන් සමරසේකර මහත්මිය
3.	පරිගණක ඉන්ජිනේරු අධ්‍යනාංශය	අචාර්යය යූ.කේ. විජේනායක
4.	විදුලි හා විද්‍යුත් ඉන්ජිනේරු අධ්‍යනාංශය	අචාර්යය එම්.එන්. ධර්මවීර (වැඩ බලන)
5.	යාන්ත්‍රික ඉන්ජිනේරු අධ්‍යනාංශය	ආචාර්යය එච්.එම්.ඩී.ඩී.වයි.මුදුන්කොටුව
	විෂයාන්තර අධ්‍යයන අධ්‍යනාංශය	ආචාර්යය ඒ.එච්.ටී.එස්. කුලරත්න

පීඨය මඟින් ප්‍රදානය කරනු ලබන උපාධි

උපාධි

1. විද්‍යාවේදී ගෞරව ඉන්ජිනේරු උපාධිය

2022 හා **2023** වසර වල ප්‍රතිඵල සැසඳීම

උපාධි පාඨමාලාව	පළමු පෙළ		දෙවන පෙළ ඉහළ		දෙවන පෙළ පහළ		සමත්		මුළු සමත් සංඛ්‍යාව	
	2022	**2023**	**2022**	**2023**	**2022**	**2023**	**2022**	**2023**	**2022**	**2023**
විද්‍යාවේදී ගෞරව ඉන්ජිනේරු උපාධිය	9	12	47	48	45	40	7	8	108	108

ශිෂ්‍ය සම්පත් විස්තරය - 2023

උපාධි පාඨමාලාව	මුළු සිසුන් සංඛ්‍යාව	අධ්‍යයන කාර්යය මණ්ඩලය		අනධ්‍යයන කාර්යය මණ්ඩලය
		ස්ථිර	කොන්ත්‍රාත්	
විද්‍යාවේදී ගෞරව ඉන්ජිනේරු උපාධිය	593	18	50	43

දේශීය සිසුන් පිළිබඳ විස්තරය - **2022**

උපාධි පාඨමාලාව	මාධ්‍යය	ශිෂ්‍ය ලියාපදිංචිය					ශිෂ්‍ය ලියාපදිංචිය
		1	**2**	**3**	**4**	මුළු ගණන	
විද්‍යාවේදී ගෞරව ඉන්ජිනේරු උපාධිය	ඉංග්‍රීසි	174	162	160	97	593	108
මුළු සංඛ්‍යාව		**174**	**162**	**160**	**97**	**593**	**108**

අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය

අධ්‍යයනාංශය	මහාචාර්යය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය I වශා ශ්‍රේණිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය II වශා ශ්‍රේණිය	කථිකාචාර්යය / කථිකාචාර්යය (අයුනිකා.)	මුළු සංඛ්‍යාව
සිවිල් ඉන්ජිනේරු	1		4	-	5
පරිගණක ඉන්ජිනේරු	-	1	2	-	3
විදුලි හා විද්‍යුත් ඉන්ජිනේරු	-	1	3	1	5
යාන්ත්‍රික ඉන්ජිනේරු	-	-	3	-	3
අන්තර් විෂය අධ්‍යයන	-	-	2	-	2
මුළු සංඛ්‍යාව	1	2	14	1	18

පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2023

	ප්‍රකාශන කාණ්ඩය		**සංඛ්‍යාව**	
			දේශීයව ප්‍රකාශයට පත් කරන ලද	**විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද**
1	තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන			**6**
2	තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන		**1**	**9**
3	සම්මන්ත්‍රණ කටයුතු	3.1 සම්පූර්ණ පත්‍රිකා	**1**	**5**
		3. සාරාංශ	**18**	**5**
4	ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන			**2**
5	ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන	5.1 ප්‍රකාශකයකු විසින්		
		5.2 කතුවරයකු විසින්		
මුළු සංඛ්‍යාව			**20**	**27**

සම සෞඛ්‍ය පීඨය - 2023



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය වර්ෂ 2019 දී ආරම්භ කරන ලද්දේ ජාතික සහ ජාත්‍යන්තර සෞඛ්‍ය සේවා සැපයුම් පද්ධතියේ, සම සෞඛ්‍ය සේවා වෘත්තිකයින් සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීමට සහ සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යාපනය පුළුල් කිරීමේ අරමුණිනි. සම සෞඛ්‍ය විද්‍යා පීඨය යටතේ හෙද විද්‍යා හා සූතිකා අධ්‍යනාංශය , ඖෂධවේදී හා ඖෂධ විද්‍යා අධ්‍යනාංශය, වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශ, මූලික විද්‍යා අධ්‍යනාංශය සහ දෘෂ්ඨීමිතික අධ්‍යනාංශය ලෙස අධ්‍යනාංශ 05ක් පවත්වාගෙන යනු ලබන අතර එහි අලුතින්ම ආරම්භ වූ අධ්‍යනාංශය දෘෂ්ඨීමිතික අධ්‍යනාංශයයි. දැනට සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් අදාළ ක්ෂේත්‍ර සහ වෘත්තීය සංවිධාන විසින් සම්මත කර ඇති ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව, විද්‍යාවේදී හෙද (ගෞරව) උපාධිය, ඖෂධවේදී (ගෞරව) උපාධිය, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය සහ විද්‍යාවේදී දෘෂ්ඨීමිතිය (ගෞරව) උපාධිය ලෙස වසර හතරක කාලයක් තුල පැවැත්වෙන ගෞරව උපාධි 04ක් පිරිනමනු ලබයි.

.

පීඨාධිපති	මහාචාර්යය ඩී.අයි.උළුවඩුගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	ජේ.පී. විමලරත්න මහත්මයා
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	කේ.එම්.ජේ.නන්දන මහතමයා

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වත්මන් අධ්‍යනාංශ සහ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පහත පරිදි වේ.

අධ්‍යනාංශය	**අධ්‍යනාංශ ප්‍රධාන**
හෙද විද්‍යා හා සූතිකා අධ්‍යනාංශය	අචාර්යය එම්.ආර්.එස්.ජයතිලක
ඖෂධවේදී හා ඖෂධ විද්‍යා අධ්‍යනාංශය	මහාචාර්යය එන්. ආර්.සමරනායක
වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශය	මහාචාර්යය ඒ.එම්.බී. ප්‍රියදර්ශනි
මූලික විද්‍යා අධ්‍යනාංශය	ආචාර්යය එම්.එන්. පහළගෙදර
දෘෂ්ඨීමිතික අධ්‍යනාංශය	අචාර්යය එච්.එම්.ඩී.ආර් හේරත්

පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

1. විද්‍යාවේදී හෙද (ගෞරව) උපාධිය
2. ඖෂධවේදී (ගෞරව) උපාධිය
3. විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය
4. විද්‍යාවේදී දෘෂ්ටිමිතිය (ගෞරව) උපාධිය

පර්යේෂණ හා ප්‍රකාශන

සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2023 – IRCHS 2023

IRCHS 2023 සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වාර්ෂික පර්යේෂණ සමුළුව 2023 මාර්තු 31 වැනි දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දෙමුහුන් උත්සවයක් ලෙස පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණය දින දර්ශනයේ වාර්ෂික උත්සවයක් වන අතර ‘‘නවෝත්පාදනය, සහයෝගීතාවය සහ අත්දැකීම්: සෞඛ්‍ය සහ යහපැවැත්මේ තිරසාර සංවර්ධනය සඳහා’’ යන තේමාව යටතේ ජාත්‍යන්තර සමුළුවක් ලෙස සංවිධානය කරන ලදි. මෙහි ප්‍රධාන දේශනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය ඩී.අයි. උළුවඩුගේ, මහත්මිය විසින් සිදු කරන ලදී. හෙද හා වින්නඹු මාතා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එස්.එම්.කේ.එස්. සෙනෙවිරත්න ‘‘ඖෂධීය ප්‍රතිකාර; මිථ්‍යාවන්, විශ්වාසයන් සහ සත්‍යය සොයා ගැනීම". විද්‍යාත්මක වැඩසටහන ආරම්භ වූයේ "කාන්තාවන්ගේ තිරසාර සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා සෞඛ්‍ය සේවයේ අවිඥානික නැඹුරුව ආමන්ත්‍රණය කිරීම" යන මැයෙන්, දේශනයක් පවත්වන ලදී.
විද්‍යාත්මක වැඩසටහනට "සෞඛ්‍ය හා යහපැවැත්මේ තිරසාර සංවර්ධනය" යන තේමාවෙන් යුත් සම්මන්ත්‍රණය ඇතුළත් වූ අතර එය ඖෂධවේදී , හෙද සහ වෛද්‍ය රසායනාගාර විද්‍යාවන්හි කථිකයන් විසින් සම්පත් ලබා ගන්නා ලදී.

IRCHS 2023 ට සාරාංශ 158 ක් ලැබුණු අතර ඉන් වාචික ඉදිරිපත් කිරීම් 27 ක් සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම් 85 ක් තෝරා ගන්නා ලදී. IRCHS 2023 ට සමගාමීව, ‘සෞඛ්‍ය විද්‍යාවේ තරුණ නවෝත්පාදකයින්ගේ සම්මානය 2023’ අඛණ්ඩව තෙවන වරටත් පවත්වන ලදී.

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ නිල පර්යේෂණ සඟරාව

4 වන වෙළුමේ නිකුතු දෙකක් සෞඛ්‍ය විද්‍යා සහ නවෝත්පාදන පර්යේෂණ සඟරාවේ 2023 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලදී.

ශිෂ්‍ය හා සම්පත් විස්තරය 2023

අධ්‍යයනාංශය	මූළු ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන කාර්යය මණ්ඩලය)		අනධ්‍යයන කාර්යය මණ්ඩලය)
		ස්ථිර	තාවකාලික	
විද්‍යාවේදී හෙද හා වින්නඹු මාතා අධ්‍යයනාංශය	127	12	18	5
ඖෂධවේදී අධ්‍යයනාංශය	141	12		7

වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය	136	6		8
මූලික විද්‍යා	229	6		4
දෘෂ්ටිමිති අධ්‍යයනාංශය	55	0		1
පීඨ කාර්යයාලය	-	-	-	9
මුළු සංඛ්‍යාව	**688**	**36**	**18**	**34**

දේශීය සිසුන් පිළිබඳ විස්තරය

Course	මාධ්‍යය	උපාධිධාරීන් සංඛ්‍යාව					උපාධිධාරීන් සංඛ්‍යාව
		පළමු වසර	දෙවන වසර	තෙවන වසර	සිව්වන වසර	මුළු සංඛ්‍යාව	
විද්‍යාවේදී හෙද හා වින්නඹු මාතා	ඉංග්‍රීසි	63	53	45	29	190	26
ඖෂධවේදී		55	61	51	29	196	31
විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා		59	57	49	30	195	22
විද්‍යාවේදී (ගෞරව) දෘෂ්ටිමිති		52	55			107	-
මුළු සංඛ්‍යාව		**229**	**226**	**145**	**88**	**688**	**79**

අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තරය **2023**

පාඨමාලාව	**මහාචාර්යය**	**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය 1 වන ශ්‍රේණිය**	**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය II වන ශ්‍රේණිය**	**කථිකාචාර්යය /කථිකාචාර්යය (අංශුනික.)**	**මුළු සංඛ්‍යාව**
විද්‍යාවේදී හෙද හා වින්නඹු මාතා	2	2	2	6	12
ඖෂධවේදී	2	4	1	5	12
වෛද්‍ය රසායනාගාර විද්‍යා	1	1	3	1	6
මූලික විද්‍යා	1		5		6
මුළු සංඛ්‍යාව	6	7	11	12	36

පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු - 2023

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීය ප්‍රකාශිත	විදේශීය ප්‍රකාශිත
1	තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන			8
2	තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන		1	
3	සම්මන්ත්‍රණ කටයුතු	3.1 සම්පූර්ණ පත්‍රිකා	1	
		3.2 / සාරාංශ	27	5
4	ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන			
5	ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන	5.1 ප්‍රකාශකයකු විසින්		
		5.2 කතුවරයා විසින්		
	මුළු සංඛ්‍යාව		29	13

දන්ත වෛද්‍ය විද්‍යා පීඨය



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (USJ) දන්ත වෛද්‍ය විද්‍යා පීඨය (FDS) ශ්‍රී ලංකාවේ දෙවන දන්ත වෛද්‍ය පීඨය ලෙසත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හි නවවන පීඨය ලෙසත් 08/12 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 2257/28 මගින් ස්ථාපිත කරන ලදී. 2021. “අධ්‍යාපනය තුළින් සෞභාග්‍යවත් ජීවිතයක්” යන විශ්වවිද්‍යාල දැක්මට අනුව දන්ත තාක්ෂණිකව දියුණු නොමසුරුව ජනතාවට සේවය කිරීමට පෙළඹෙන දන්ත වෛද්‍ය වෘත්තියේ ඉදිරි පරම්පරාව සඳහා ඉහළම මට්ටමේ දන්ත වෛද්‍ය අධ්‍යාපන වැඩසටහනක් ලබාදීමට පීඨය බලාපොරොත්තු වේ.

පීඨය විසින් පවත්වනු ලබන දන්ත ශල්‍ය වෛද්‍ය උපාධි වැඩසටහන දන්ත වෛද්‍ය අධ්‍යාපනයේ ගෝලීය ප්‍රමිතීන්ට සමගාමීව පස් අවුරුදු වැඩසටහනකි. ඉගෙනුම් සහ ශිෂ්‍ය කේන්ද්‍රීය අත්දැකීම් සඳහා වේදිකාවක් සපයමින් සිසුන්ට ඔවුන්ගේ තනි ඉගෙනුම් ශෛලීන් අනුව විශිෂ්ටත්වය දැක්වීමට පහසුකම් සැලසීම සඳහා සමමුහුර්ත පද්ධතිය පදනම් කරගත් විෂයමාලා බෙදාහැරීම් සහ විෂය පදනම් ඇගයීම් සැලසුම් කර ඇත. පූර්ව සායනික අදියර (BDS I) වෛද්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය සිසුන් සමඟ එක්ව උගන්වනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බඳවා ගැනීම් වර්ෂ 2020/21 යටතේ 2022 ජනවාරි මාසයේ පළමු කණ්ඩායම ලෙස දන්ත වෛද්‍ය සිසුන් 32ක් බඳවා ගන්නා ලදී.

පීඨය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGHS) වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා සමඟ සාකච්ඡා කර සිසුන්ගේ සායනික පුහුණුව සඳහා ශ්‍රී ලංකා ජාතික දන්ත රෝහල (NDHSL) සහ දකුණු කොළඹ ශික්ෂණ රෝහල වෙත සිසුන් යැවීමට අනුමැතිය ලබාගෙන ඇත. මෙම රෝහල් දන්ත වෛද්‍ය පීඨයේ ශික්ෂණ රෝහල් ලෙස සලකනු ලැබේ

දන්ත වෛද්‍ය පීඨය අධයයනාංශ 09 කින් සමන්විත වන අතර ඒවා පහතින් දැක්වේ

පීඨාධිපති	**ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එස්.ජී.යසවර්ධන මහත්මිය**
අධ්‍යයනාංශය	**අධ්‍යයනාංශ ප්‍රධාන**
1. මූලික විද්‍යා අධ්‍යයනාංශය	වෛද්‍ය කේ.එම්.ආර්.එල්.කුලසේකර
2. සමාජ දන්ත සෞඛ්‍ය අධ්‍යයනාංශය	වෛද්‍ය ඒ.ඒ.එච්.කේ. අමරසිංහ
3. පරිපූර්ණ සහ වෘද්ධ දන්ත වෛද්‍ය අධ්‍යයනාංශය	-
4. මුඛ සෞඛ්‍ය සහ පරිදන්ත වෛද්‍ය අධ්‍යයනාංහය	-
5. මුඛ ව්‍යාධිවේද අධ්‍යයනාංහය	වෛද්‍ය ආර්.පී.ඒකනායක
6. මුඛ ශල්‍ය වෛද්‍ය අධයයනාංශය	වෛද්‍ය එස්.ශම්මුගරත්නම් (වැඩ බලන)
7. පරිපූරක සායනික විද්‍යා අධයයනාංශය	-
8. කෘතිම දන්ත වෛද්‍ය අධයයනාංශය	-
9. දන්ත සංරක්ෂණ අධ්‍යයනාංශය	වෛද්‍ය අයි.ඩබ්ලිව්.පී.ඩී.පලිපාන

පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි

උපාධි

1. දන්ත ශෛල්‍ය වෛද්‍ය විද්‍යා

ශිෂ්‍ය හා සම්පත් විස්තරය **2023**

උපාධි පාඨමාලාව	මුළු සිසුන් සංඛ්‍යා	අධ්‍යයන කාර්යය මණ්ඩලය		අනධ්‍යයන සේවක සංඛ්‍යාව
		ස්ථීර	තාවකාලික	
දන්ත ශෛල්‍ය වෛද්‍ය විද්‍යා	32	8	2	0

පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2023

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශයට පත් කරන ලද	විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද
1	තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන			6
2	තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන		2	
3	සම්මන්ත්‍රණ කටයුතු	3.1 සම්පූර්ණ පත්‍රිකා	1	1
		3.2 සාරාංශ	1	
4	ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන			
5	ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන	5.1 ප්‍රකාශකයකු විසින්		
		5.2 කතුවරයා විසින්		
මුළු සංඛ්‍යාව			4	7

නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය



https://fuab.sjp.ac.lk/

නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය (FUAB) යනු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 10 වන පීඨය වන අතර, අතිශයින් අවශ්‍ය ජෛව ආර්ථිකයක් සඳහා ඉදිරියේ ඇති අභියෝගවලට මුහුණ දීම සඳහා නීල හරිත සංකල්පය කෙරෙහි අවධානය යොමු කරමින්,ඍත්තීය සුදුසුකම් ලත් උපාධිධාරීන් සහ පශ්චාත් උපාධි ශ්‍රම බලකායක් බිහි කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

පීඨයේ වත්මන් පරිපාලන සංයුතිය පහත පරිදි වේ:

පීඨාධිපති	**ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ප්‍රදීප් ජයවීර**
අධ්‍යයනාංශය	**අධ්‍යයනාංශපති**
1. ජලජ ජෛව සම්පත් අධ්‍යයනාංශය	අචාර්යය එරන්දි පතිරණ
2. නාගරික ජෛව සම්පත් අධ්‍යයනාංශය	අචාර්යය ජේ.ඒ.සුරනි චතුරිකා
3. බහුවිධ අධ්‍යයන අධ්‍යයනාංශය	අචාර්යය ජනිතා කේ වල්පිට

පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි

1. විද්‍යාවේදි ජලජ ජෛව සම්පත් උපාධිය
2. විද්‍යාවේදි නාගරික ජෛව සම්පත් උපාධිය
3. විද්‍යාවේදි නාගරික ජෛව සම්පත් (ගෞරව) උපාධිය

වර්තමානයේ ජලජ ජෛව සම්පත් පිළිබඳ විද්‍යාවේදි උපාධි වැඩසටහන සහ නාගරික ජෛව සම්පත් පිළිබඳ විද්‍යාවේදි උපාධි වැඩසටහන යන දෙකම සිසුන් කණ්ඩායම් 02 සඳහා සපයනු ලැබේ.
(2020/2021 කණ්ඩායම සහ 2021/2022 කණ්ඩායම) සපයනු ලැබේ.

අධ්‍යයන වැඩසටහන්

වැඩසටහන්කරණය, ස්මාර්ට් සංවේදනය, IoT (ඉන්ටර්නෙට් ඔෆ් තින්ග්ස්) සහ එම්2එම් (යන්ත්‍රයෙන් යන්ත්‍රයෙන් යන්ත්‍රය දක්වා) සන්නිවේදනයේ සිසුන් අතර ස්මාර්ට් ගොවිතැන් සංකල්ප ඇති කිරීම සඳහා බහුවිධ අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් ‘‘ස්මාර්ට් ගොවිතැන සඳහා තොරතුරු තාක්ෂණ’’ පිළිබඳ නව විකල්ප පාඨමාලා මොඩියුලයක් හඳුන්වා දෙන ලදී. මෙම පාඨමාලාව ස්මාර්ට් ගොවිතැන් හඳුන්වාදීම, ක්ෂුද්‍ර පාලකය වැනි ක්ෂේත්‍ර ආවරණය කරයි

පර්යේෂණ හා බාහිර ක්‍රියාකාරකම්

"ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න සහ තිරසාර බෙල්ලන් වගාව සඳහා Crassostrea madrasensis සහ එහි මෝය පරිසරය සංලක්ෂිත කිරීම" පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් හරහා ඉන්දියානු බෙල්ලන්ගේ (Crassostrea madrasensis) ක්ෂුද්‍රජීවය සාර්ථකව සංලක්ෂිත විය. පර්යේෂණ සඳහා අරමුදල් සපයන ලද්දේ ලෝක විද්‍යා ඇකඩමියේ (TWAS), ජලජ ජෛව සම්පත් දෙපාර්තමේන්තුවේ ආචාර්ය එරන්දි පතිරණ වෙතින් ලබාගත් තරඟකාරී පර්යේෂණ ප්‍රදානයක් මගිනි. පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු, ප්‍රධාන විමර්ශකයෙකු ලෙස, විදේශීය අරමුදල් සපයන ආයතනයකින් ලබාගත් පළමු පර්යේෂණ ප්‍රදානය මෙයයි.

"IoT මත පදනම් වූ පූර්ණ ස්වයංක්‍රීය පාලිත පාරිසරික පද්ධතිය යටතේ Lactuca Sativa (Lettuce) වර්ධනය සහ ගුණාත්මක භාවය ඇගයීම" පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් OREL Corporation සමඟ සහයෝගයෙන් සිදු කරන ලදී. නාගරික ජෛව සම්පත් දෙපාර්තමේන්තුවේ ආචාර්ය සුරනි චතුරිකා සහ ආචාර්ය උදාරි රත්නතුංග මෙම උපාධි පර්යේෂණයේ පර්යේෂණ අධීක්ෂකවරුන් ලෙස කටයුතු කළහ.

ජාත්‍යන්තර සහයෝගිතා

නාගරික ජෛව සම්පත් දෙපාර්තමේන්තුව ජපානයේ මීජි විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පාසල සමඟ ගිවිසුමකට අත්සන් තැබීය. කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවේ මහාචාර්ය සහ Meiji විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පාසලේ සහකාර පීඨාධිපති මහාචාර්ය ටකාෂි ඉකේඩා 2023 වසරේ පෙර පීඨයට ගොස් ආයතන දෙක අතර සහයෝගීතාව ආරම්භ කළේය.

ඕස්ට්‍රේලියානු රජය විසින් අරමුදල් සපයනු ලබන KLIE ප්‍රදාන වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ සමුද්‍ර වගාව සංවර්ධනය කිරීමේදී ජලජ ජෛව සම්පත් දෙපාර්තමේන්තුව ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්ව විද්‍යාලය සමඟ ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කරයි. විෂය පථය පිළිබඳ අධ්‍යයනය සාර්ථකව නිම කිරීමෙන් පසු ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ආසියානු මුහුදු බැස්ස්, ඉන්දියානු බෙල්ලන් සහ මුහුදු පැලෑටි වාණිජ වශයෙන් වගා කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. ජලජ සත්ව සෞඛ්‍ය සහ නිෂ්පාදන පිළිබඳ සහකාර මහාචාර්ය මහාචාර්ය ජෝයි බෙකර් සහ ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් ප්‍රාථමික කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ ආචාර්ය වේන් ඕ කොනර් විශ්ව විද්‍යාලයට ගිය අතර එමඟින් ශ්‍රී ලංකාවේ සමුද්‍ර වගා සංවර්ධනයේ මාර්ග සිතියම පිළිබඳ ඵලදායී සාකච්ඡාවක් සහ අවබෝධයක් ලබා ගැනීමට හැකි විය.

ප්‍රජාව/සමාජයීය වගකීම හා ජාතික දායකත්වය

ජලජ ජෛව සම්පත් දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් සභාව මගින් පරිපාලනය කරනු ලබන පිටිපන, මීගමුව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානය සමඟ අවබෝධතා ගිවිසුමකට (MoU) එළැඹිණි. මෙම මධ්‍යස්ථානය, පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා ජලජීවී වගාව පිළිබඳ ක්ෂේත්‍ර පුහුණුව සහ පර්යේෂණ පහසුකම් සපයන අතර, දෙපාර්තමේන්තුව ජලජීවී සත්ව සෞඛ්‍ය කළමනාකරණය, පෝෂණ කළමනාකරණය සහ මධ්‍යස්ථානයේ නව ජලජීවී වගා මෙහෙයුම් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික විශේෂඥතාව ලබා දෙනු ඇත.

නාගරික ජෛව සම්පත් අධ්‍යයනාංශය Orel විසනවෝත්පාදන සමඟ එක්ව IoT පදනම් කරගත් ස්මාර්ට් ගොවිතැන් තාක්ෂණයේ නියමු ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද IoT පාදක පොහොර පද්ධතිය මඟින් තත්‍ය කාලීනව ශාක අවශ්‍යතාවයට අනුව පෝෂ්‍ය පදාර්ථ ලබා දේ.

ශිෂ්‍ය සම්පත් විස්තරය 2023

උපාධි පාඨමාලාව	මුළු සිසුන් සංඛ්‍යා	අධ්‍යයන කාර්යය මණ්ඩලය		අනධ්‍යයන කාර්යය මණ්ඩලය
		ස්ථිර	තාවකාලික	
විද්‍යාවේදී නාගරික ජෛව සම්පත් උපාධිය	98	8	1	0
විද්‍යාවේදී ජලජ ජෛව සම්පත් උපාධිය	83			
මුළු සංඛ්‍යාව	**181**			

පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර - 2023

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශයට පත් කරන ලද	විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද
1	තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන			**4**
2	තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන		**1**	**3**
3	සම්මන්ත්‍රණ කටයුතු	3.1 සම්පූර්ණ පත්‍රිකා	**1**	**1**
		3.2 සාරාංශ	**1**	**2**
4	ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන			**8**
5	ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන	5.1 ප්‍රකාශකයකු විසින්		
		5.2 කතුවරයා විසින්		
මුළු සංඛ්‍යාව			**3**	**18**



පරිගණක පීඨය (FOC) යනු ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ විශ්ව විද්‍යාල අතර නැගී එන පරිගණක හා ඒ ආශ්‍රිත විෂයයන් සඳහා පමණක් කැප වූ නවතම පීඨකි. කීර්තිමත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 11 වැනි පීඨය ලෙස පරිගණක පීඨය පිහිටුවීමට නියමිතය. ජාතික අපනයන ක්‍රමෝපායට අනුකූලව සහ තොරතුරු වයස් නිපුණතා සහිත ශ්‍රම බලකාය අඛණ්ඩව සැපයීම සඳහා තොරතුරු තාක්ෂණය සහ BPO සේවා අංශයෙන් දිනෙන් දින ඉහළ යන ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පරිගණක පීඨය පිහිටුවීමේ අභියෝගය භාර ගත්තේය.

මෙම පරිගණනය සහ ඒ ආශ්‍රිත උප විෂයයන් 21 වැනි සියවසේ ප්‍රධාන විෂයයන් ලෙස මතුවෙමින් තිබේ. නිපුණතා-ශ්‍රම බලකාය සඳහා ගෝලීය ඉල්ලුම සපුරාලීම සඳහා, පරිගණක පීඨය විසින් නවීනතම පරිගණක කරණය සහ ඒ ආශ්‍රිත දැනුම ඇතුළුව සියලුම ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පහත ලැයිස්තුගත කර ඇති පරිදි ශ්‍රී ලංකාව තුළ අද්විතීය සහ පළමු පරිගණක ගෞරව උපාධි වැඩසටහන් තුනක් නිර්මාණය කර ඇත. උපාධිධාරීන් සමත්වීම සහතික කරන අතරම නවීන තාක්ෂණයන් පිළිබඳ අත්දැකීම් ලබා දීමට පීඨය කටයුතු කරනු ඇත.

- පරිගණක විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය
- මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය
- තොරතුරු පද්ධති පිළිබඳ ගෞරව උපාධිය

විශ්වවිද්‍යාලය පරිගණක පීඨයෙහි මෙම උපාධි වැඩසටහන් තුන පහත පරිදි අධ්‍යනාංශ තුනක් හරහා උපාධි අපේක්ෂකයින් අතර අදාළ දැනුම ක්ෂේත්‍ර සහ නිපුණතා ඇති කිරීමට නියමිතය.

- විද්‍යාත්මක පරිගණක අධ්‍යනාංශය
- තොරතුරු පද්ධති ඉංජිනේරු සහ තොරතුරු අධ්‍යනාංශය
- දැනුම් ඉංජිනේරු හා සන්නිවේදන අධ්‍යනාංශය

සමාජ-ආර්ථික සහ ජාතික සංවර්ධනයට දායක වීමේ වැඩි හැකියාවක් ඇති පරිගණක සහ ඒ ආශ්‍රිත උප විෂය ක්ෂේත්‍රවල නැගී එන ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යාපනයේ මෙන්ම පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිවල සන්දර්භය තුළ අති නවීන පර්යේෂණ දියත් කිරීමට ද පරිගණක පීඨය අදහස් කරයි. මෙම නව පීඨයේ පළමු කණ්ඩායම ලෙස සිසුන් 150 දෙනෙකු 2023 මැයි මස ලියාපදිංචි කෙරේ

හැඳින්වීම

විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ක්‍රීඩා ක්‍රියාකාරකම් සැලසුම් කරණයට සහ ක්‍රියාවට නැංවීමට ක්‍රීඩක ක්‍රීඩිකාවන් තරග 39 ක් සඳහා පුහුණු කරවීම සහ ක්‍රීඩාව හා සම්බන්ධ විෂයන් සංවිධානය කිරීම ශාරීරික අධ්‍යාපන ඒකකයේ ප්‍රධාන කාර්යයන් වේ. අන්තර් විශ්වවිද්‍යාල තරඟ ජාතික ක්‍රීඩා සංගමය හෝ ජාත්‍යන්තරව සංවිධානය කරනු ලබන තරඟ සඳහා විධිමත් පුහුණුවක් ලබා දීම සහ විවිධ ක්‍රීඩාවන් සඳහා ක්‍රීඩාපිටි පරිපාලනය සහ නඩත්තුව ශාරීරික අධ්‍යාපන අංශයේ අනෙකුත් කාර්යයන් වේ.

එන්.නිශාන්ති විදානගේ මහත්මිය ශාරීරික අධ්‍යාපන ඒකකයේ වර්තමාන ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂිකා වන අතර ස්ථිර ක්‍රීඩා උපදේශක උපදේශිකාවන් ලෙස රමණී කුලතිලක මහත්මියල එච්.එල්.එල්.දිලංකර මහතාල බී.එන්.එම්.පෙරේරා මහතා සිය සේවය ලබා දෙන අතර ඊ.ඩී ප්‍රියදර්ශනී මහත්මියල නයෝමි කරුණාරත්න මෙනවිය එන්.එල්.වික්‍රමධාර මහතා හා එන්.ගිනිගේ මහතා ශාරීරික අධ්‍යාපන අංශයේ තාවකාලික ක්‍රීඩා උපදේශකවරුන් ලෙස සේවය කරයි.

ශාරීරික අධ්‍යාපන ඒකකයේ අරමුණු

1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශාරීරික අධ්‍යාපනයේ වටිනාකම් පිළිබඳව අවබෝධයක් ලබා දීම හා මානසික සංවර්ධනය තුළින් කායික සංවර්ධනය ඇති කිරීම.
2. ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ හැකියාවන්හි වැඩි දියුණුව සඳහා අවස්ථාවක් ලබා දීම.
3. අභ්‍යන්තර හා බාහිර ක්‍රීඩා සංගම් සමඟ ක්‍රීඩා තරඟ පැවැත්වීමෙන් ක්‍රීඩා සහභාගිත්වය දිරි ගැන්වීම.
4. ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරේ ක්‍රීඩා ක්‍රියාකාරකම් දිරි ගැන්වීම මඟින් විනය සංවර්ධනයක් ඇති කිරීම.
5. ක්‍රීඩාව මගින් විශ්ව විද්‍යාලයීය නාමය ඉදිරියට ගෙන යාම.

අධ්‍යයන හා පරිපාලන නිලධාරීන්ගෙන් ක්‍රීඩා උපදේශක මණ්ඩලයේ සාමාජිකත්වය සැදි ඇත. විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා ක්‍රියාකාරකම් සඟයෝගිතාවයෙන් ගෙන යාම සඳහා ක්‍රීඩා සංගමය නායක/උප නායකයන්ගෙන් සමන්විත වන අතරල ඒ සඳහා සෑම වසරකදීම සම සභාපතිවරයෙකු සහ විධායක සභාවක් පත් කර ගනු ලැබේ.

ක්‍රීඩා උපදේශක මණ්ඩලය

ක්‍රීඩා උපදේශක මණ්ඩලයේ පහත සඳහන් සාමාජිකයන් අන්තර්ගත වන්නේය.

1. ක්‍රීඩා විෂය කෙරෙහි ඇල්මක් දක්වන අධ්‍යයන කාර්යය මණ්ඩලයේ දහසය දෙනෙකු නිත්‍ය සාමාජිකයන් ලෙස උපකුලපතිවරයා විසින් පත් කෙරේ.

2. ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂිකා
3. පූර්ණ කාලීන ශාරීරික අධ්‍යාපන උපදේශකයන් අතරින් පස්දෙනෙකු
   (මෙයින් එක් අයෙකු උපදේශිකාවක් විය යුතුය)

4. ක්‍රීඩා සංගමයේ සම සභාපතිවරු දෙදෙනෙකු, උප සභාපති ද, ලේකම් හෝ වෙනත් නියෝජිතයෙකු (එක් අයෙකු ක්‍රීඩිකාවක් විය යුතුය)

5. විශ්වවිද්‍යාලයීය ප්‍රධාන වෛද්‍ය නිලධාරීන් හෝ ඔහුගේ නියෝජිතයෙකු (විශ්වවිද්‍යාලයේ නිලධාරියෙකු විය යුතුය)

6. අධ්‍යක්ෂක / ශිෂ්‍ය කටයුතු

7. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සුබසාධනය) හෝ ඇයගේ නියෝජිතයෙකු

8. මූල්‍යාධිකාරී හෝ ඔහුගේ හෝ ඇයගේ නියෝජිතයෙකු

9. වැඩ ඉංජිනේරු හෝ ඔහුගේ නියෝජිතයෙකු

10. සහකාර ලේඛකාධිකාරී (මූල ධන වැඩ අංශය)

11. ව්‍යාපෘති ඉංජිනේරු (මූලධන වැඩ අංශය)

ක්‍රීඩා සංගමය

විවිධ ක්‍රීඩා කණ්ඩායම් වල නායකයින් උපදේශකයන්ගෙන් විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ සාමාජිකත්වය සුසැදි ඇත. ඊට සම සභාපතිවරු දෙදෙනෙකුල උප සභාපතිල ලේකම්ල සහකාර ලේකම්ල කනිෂ්ඨ භාණ්ඩාගාරිකල සම්පාදකවරු දෙදෙනෙකු සහ කමිටු සාමාජිකයන් දෙදෙනෙකු අයත් වන්නේය.

අධ්‍යයන වර්ෂයක පළමු රැස්වීමේදි මොවුන් තෝරා පත් කර ගැනේ.

ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ තරගාවලි

විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකයේ ශාරීරික අධ්‍යාපන උපදේශකයින්ගේ සුපරික්ෂණය යටතේ පහත සඳහන් ක්‍රීඩා පුහුණු කිරීම් සහ පහසුකම් ලබා දෙනු ලැබේ.

ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් පහත සඳහන් තරග සංවිධානය කරනු ලබන්නේ ය.

1). අන්තර් පීඨ ආධුනික / නවක තරග

2). අන්තර් පීඨ ක්‍රීඩා තරග

3). ආරාධිත හා සුහද තරග

4). අන්තර් විශ්වවිද්‍යාල තරග

මීට අමතර වශයෙන් බාහිර කණ්ඩායම් සමඟ සුහද තරඟ සංවිධානය සහ අන්තර් විශ්වවිද්‍යාල ශූරතා තරග සංවිධානය හා ඒකාබද්ධ විශ්වවිද්‍යාල කණ්ඩායම් තරග ද පවත්වනු ලැබේ.

ජාතික ශූරතා තරග ලෝක විශ්වවිද්‍යාල තරග සහ ශූරතා තරඟ සඳහා සියලු ම විශ්වවිද්‍යාල වලින් තෝරා ගත් ඒකාබද්ධ විශ්වවිද්‍යාල ක්‍රීඩා කණ්ඩායම්හි ද අපගේ ශිෂ්‍යයින් සහභාගි වන්නේය.

විශ්වවිද්‍යාල කිහිපයක් විසින් පමණක් අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා උත්සව සංවිධානය කරන අතර මෙය වසරක් පාසා පැවැත් වෙන අතර එක් තනි විශ්වවිද්‍යාලයක් විසින් පමණක් සංවිධානය කරනු ලබන එසබස ධඤඝපචසපි තරග සෑම වසර තුනකටම වරක් පැවැත්වෙන්නේය.

2023 දී අප විසින් මෙහෙයවන ලද විශේෂ සිදුවීම්

- TENNIS TEN'S - 2023 විශ්වවිද්‍යාල ටෙනිස් කණ්ඩායම විසින් ශාරීරික අධ්‍යාපන ඒකකය සමඟ සහයෝගීත්වයෙන් සංවිධානය කරන ලදී.
- ආරාධිත අන්තර් විශ්වවිද්‍යාල එල්ලේ ශූරතාවලිය -2023 විශ්වවිද්‍යාල එල්ලේ කණ්ඩායම විසින් ශාරීරික අධ්‍යාපන ඒකකය සමඟ සහයෝගීත්වයෙන් සංවිධානය කරන ලදී.
- SMASHES බැඩ්මින්ටන් ශූරතාවලිය - 2023 විශ්වවිද්‍යාල බැඩ්මින්ටන් කණ්ඩායම විසින් ශාරීරික අධ්‍යාපන ඒකකය සමඟ සහයෝගීත්වයෙන් සංවිධානය කරන ලදී

- VIDUDAYA RITZBARY පිහිනුම් ශූරතාවලිය - 2023 ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් සංවිධානය කරන ලදී.
- **විදුමිණි නායකත්ව පුහුණු වැඩමුළුව 2023** ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් බාහිර උපාධි සිසුන් සඳහා සංවිධානය කරන ලදී.
- නැගෙනහිර විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා - 2023 සඳහා සහභාගී වූ අතර අප බලාපොරොත්තු වූ ආකාරයෙන් ම පිරිමි ශූරතාව ල කාන්තා ශූරතාව සමඟ සමස්ථ ශූරතාව ද අප විශ්වවිද්‍යාලය ක්‍රීඩා කණ්ඩායම් විසින් දිනා ගන්නා ලදී.

වර්ණ ප්‍රදානය

එක් එක් වර්ෂාවසානයේ දී ශාරීරික අධ්‍යාපන ඒකකය හා ක්‍රීඩා සංගමය එක්ව මෙම වර්ණ ප්‍රදාන උත්සවය සංවිධානය කරනු ලබයි. නිර්දේශිත සාධන මට්ටම් යටතේ අපේක්ෂිත ප්‍රමිත අත්පත් කරගනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් උපදේශන සභාවේ නිර්දේශයෙන් වර්ණ ලබන්නේය. මෙම සම්මාන සඳහා වන සාධන මට්ටම් හා වැඩිදුර විස්තර ශාරීරික අධ්‍යාපන ආයතනයෙන් ලබා ගත හැකිය. වැඩිදුරටත්, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා සංගමය විසින් අන්තර් විශ්වවිද්‍යාලයීය තරගාවලියේ දී වැඩි දක්ෂතා පෙන්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට කුසලතා සම්මාන ලබා දෙනු ලබන්නේය.

2023 වර්ෂයේදී 46 වන වර්ණ ප්‍රදානෝත්සවය 2023 ජුනි 9 වන දින බොරලැස්ගමුව ගෝල්ඩන් රෝස් හෝටල් පරිශ්‍රයේදී පැවැත්වුණු අතර ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මහාචාර්ය උපුල් සුබසිංහ -වැඩ බලන උපකුලපති සහ ආරාධිත අමුත්තා ලෙස මහින්ද රණසිංහ මහතා සහභාගී විය.

එහි දී වසරේ වඩාත්ම කැපී පෙනෙන ක්‍රීඩිකාව ලෙස ඩබ්.එම්.එච්.සී.විජේරත්න වර්ණ ලබා ගත් අතර වසරේ වඩාත්ම කැපී පෙනෙන ක්‍රීඩිකයා ලෙස එල්. චමල් කුමාරසිරි වර්ණ ලබා ගනු ලැබීය.

එන්. නිශාන්ති විදානගේ මහත්මිය (ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂිකා)	**ජේ.එම්. රමණි කුලතිලක මහත්මිය** (ශාරීරික අධ්‍යාපන උපදේශිකා) අත්පන්දු (ගැහැනු / පිරිමි) වෙස් (ගැහැනු / පිරිමි) දැල්පන්දු (ගැහැනු) හොකි (ගැහැනු / පිරිමි	**එන්.එල්.වික්‍රමධාර මහතා** (ශාරීරික අධ්‍යාපන උපදේශක) ශෘහස්ථ ක්‍රීඩාගාර උපදේශන සේවා බර ඉසිලීම (ගැහැනු / පිරිමි) මල්ලවපොර (පිරිමි)
එච්.එල්.එල්.දිලංකර මහතා (ශාරීරික අධ්‍යාපන උපදේශක) මලල ක්‍රීඩා(ගැහැනු / පිරිමි) මැරතන් තරහ (ගැහැනු / පිරිමි) කැරම් (ගැහැනු / පිරිමි) පැසිපන්දු (පිරිමි / ගැහැනු) පිහිනුම් (පිරිමි / ගැහැනු) බේස්බොල් (පිරිමි)	**බී.එන්.එම්.පෙරේරා මහතා** (ශාරීරික අධ්‍යාපන උපදේශක) බර ඉසිලීම (ගැහැනු / පිරිමි) මල්ලවපොර (පිරිමි) රග්බි (පිරිමි)	**එන්. ගිනිගේ මහතා** (ශාරීරික අධ්‍යාපන උපදේශක) ක්‍රිකට් (පිරිමි) පාපන්දු (පිරිමි) මේස පන්දු (පිරිමි / ගැහැනු)
ඊ.ඩී ප්‍රියදර්ශනී මහත්මිය (ශාරීරික අධ්‍යාපන උපදේශිකා) කරාටේ (ගැහැනු / පිරිමි) තෛයිකොන්ඩෝ (ගැහැනු / පිරිමි) කබඩි (ගැහැනු / පිරිමි) බොක්සින් (ගැහැනු / පිරිමි)	**එන්. කරුණාරත්න** (ශාරීරික අධ්‍යාපන උපදේශිකා) බැඩ්මින්ටන් (ගැහැනු / පිරිමි) ටෙනිස් (ගැහැනු / පිරිමි) එල්ලේ (ගැහැනු / පිරිමි)	

ක්‍රීඩා පහසුකම්

සියලු විශ්ව විශ්වවිද්‍යාල ප්‍රජාවට ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපන පහසුකම් සලසන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ ක්‍රීඩා ක්ෂේත්‍රය මෙහෙය වන යාන්ත්‍රණය වන්නේ ශාරීරික අධ්‍යාපන අංශයයි.

එළිමහන් වොලිබෝල් ක්‍රීඩා පිටි

විශ්වවිද්‍යාලයේ අත් පන්දු ක්‍රීඩා පිටි දෙකක් පිහිනුම් තටාකය ආසන්නයේ පිහිටා ඇති අතර මෙම අත්පන්දු පිටි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා කාර්ය මණ්ඩලයට ලබා ගත හැකිය

පැසි පන්දු ක්‍රීඩා පිටිය

එළිමහන් පැසි පන්දු පිටි, අත් පන්දු පිටින්ට ආසන්නයේ පිහිටා ඇති අතර ප්‍රධාන වශයෙන් මෙම පිටිය තාර පෘෂ්ටයක් සහිතව සකස්කර ඇත. මෙම පැසි පන්දු පිටි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවනට හා කාර්ය මණ්ඩලයට ලබා ගත හැකිය.

ටෙනිස් ක්‍රීඩා පිටිය

මෙම ටෙනිස් පිටි ආලේපන සහිත පෘෂ්ඨයක් සහිතව මැනවින් නඩත්තු වන්නකි. මෙම ටෙනිස් පිටි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ කාර්ය මණ්ඩලයට මෙන්ම බාහිර පුද්ගලයින්ට ද ලබා ගත හැකිය.

පිහිනුම් තටාකය

මෙම පිහිනුම් තටාකය මීටර් 50 ක සම්මත දිගින් යුතු වන අතර ඊට ධාවන පථ 10 ක් ඇතුළත් වේ. මෙහි නොගැඹුරු අන්තය මීටර් 1.5 ක ගැඹුරකින් යුතු වන අතර ගැඹුරු අන්තය මීටර් 2.5 ක් වන්තනේය. පිහිනුම්කරුවන්ට ඇඳුම් මාරු කිරීමට සහ අවශ්‍ය පහසුකම් වලින් සමන්විත ගොඩනැගිල්ලක් මෙම පිහිනුම් තටාකයට යාබදව පිහිටා තිබෙන්නේය. මෙම පිහිනුම් තටාකය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ කාර්ය මණ්ඩලයට විවෘත වන අතර බාහිර පර්වශයන්ද මෙහි පහසුකම් ලබා ගත හැකිය.

ඉහළ ක්‍රීඩාපිටිය

ක්‍රිකට් ඇතුලු සියලුම එළිමහන් ක්‍රීඩා සඳහා ක්‍රීඩා පිටි දෙකක් භාවිතා වේ. ඉහළ පිටිටනියේ එක් මැටින් තණතීරුවක් ඇත. පිටිටනියට යාබඳව ප්‍රේක්ෂකාගාරය සහ ඇඳුම් මාරු කිරීමට අවශ්‍ය පහසුකම් ඇති සේදුම් කාමර සහිත ඇඳුම් මාරු කරන කාමර එහි ඇතුලත් වේ.

මීට අමතරව සියලු විශ්ව විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ කාර්ය මණ්ඩලය සඳහා ගෘහස්ථ ක්‍රීඩාගාරයල යෝගාල සුම්බා හා ඇරොබික්ස් යන ව්‍යායාම වැඩසටහන් සඳහා ද විශ්වවිද්‍යාලයයේ ශාරීරික අධ්‍යාපන අංශය පහසුකම් සලසා දෙනු ලබයි.

අප අංශය විසින් විශ්වවිද්‍යාලයේ දියුණුව වෙනුවෙන් සිදු කළ දායකත්වයන් -

- පිහිණුම් තටාක පරිහරණය කිරීම් සඳහා බාහිර ආයතනයන්ට පිහිණුම් තටාක මන්තීරු ලබාදීම මගින් මුදල් විශ්වවිද්‍යාලය වෙත උපයා දීම.
- බාහිර ආයතන සඳහා ක්‍රීඩා පිටි වෙන්කිරිම සහ ලියාපදිංචි කිරීම් මගින් මුදල් විශ්වවිද්‍යාලය වෙත උපයා දීම.
- බාහිර පාර්ශව සඳහා ක්‍රීඩා පුහුණු සැසි පැවැත්වීම

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය **(CITS)**

තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය (CITS) යනු විශ්ව විද්‍යාලයේ මූලික ආයතනය වන අතර, මණ්ඩපය පුරා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් පහසුකම්, සේවාදායක පරිපාලනය සහ විද්‍යුත් සේවා සහ යෙදුම් නඩත්තු කිරීම මෙන්ම විශ්වවිද්‍යාල සිසුන්ට තොරතුරු තාක්ෂණ තාක්ෂණික සහාය සහ විසඳුම් ලබා දීම කළමනාකරණය කරයි. සහ කාර්ය මණ්ඩලය. CITS විසින් USJNet Sphere, විශ්ව විද්‍යාල වැටුප් ලේඛන පද්ධතිය, ශිෂ්‍ය බඳවා ගැනීමේ පද්ධතිය, ශිෂ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය (SIMS), ගෙවීම් පද්ධතිය, මානව සම්පත් කළමනාකරණ පද්ධතිය (USJHRMS) සහ FGS හි ක්‍රියාත්මක කරන ලද කළමනාකරණ තොරතුරු පද්ධතිය ඇතුළු වෙබ් පාදක පද්ධති කිහිපයක් ද සංවර්ධනය කර පවත්වාගෙන යයි.

2022 පෙබරවාරි මාසයේදී මහාචාර්ය ආර්.ජී.එන්. මීගම CITS හි අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. තොරතුරු පද්ධති කළමනාකරු ලෙස හර්ෂ මුණසිංහ මහතා ද, පරිගණක උපදේශකවරුන් ලෙස චජිර ප්‍රේමදාස මහතා සහ නෙත්සිරි ජයවීර මහතා ද කටයුතු කරන ලදී. සහකාර ජාල කළමනාකරු වූයේ සුරේෂ් නානායක්කාර මහතාය. අෂේලා නිල්මිණි මහත්මිය ක්‍රමලේඛක සහ පද්ධති විශ්ලේෂක ලෙස කටයුතු කරයි. පරිගණක වැඩසටහන්කරුවන් අතර රනුක එදිරිසූරිය මහතා, තරිඳු චතුරංග මහතා, ශානක එදිරිසිංහ මහතා, නිපුන් සචින්ද මහතා සහ වී.සබේතන් මහතා ඇතුළත් විය. සුනේර කණ්ඩම්බි මහතා තාක්ෂණික නිලධාරියෙකු (ශ්‍රව්‍ය දෘශ්‍ය) ලෙස කණ්ඩායමට එක් වූ අතර මධුෂාන් දේශංග මහතා, සඳුන් අදිකාරි මහතා සහ චාමර දයාරත්න මහතා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තාක්ෂණ නිලධාරීන් ලෙස සේවය කරයි. බණ්ඩාර යාපා මහතා රසායනාගාර පරීක්ෂකවරයා ලෙස කටයුතු කළ අතර ශාන්ත කුමාර මහතා වැඩ සහකාර ලෙස කටයුතු කළේය.

තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය විසින් සපයනු ලබන මූලික සේවාවන් පහත පරිදි වේ.

- විශ්වවිද්‍යාල විද්‍යුත් තැපැල් සේවාව කළමනාකරණය කිරීම
- අන්තර්ජාල පහසුකම් කළමනාකරණය සහ සැපයීම
- ඊ-සේවා සහ යෙදුම් සේවාදායක පරිපාලනය සහ නඩත්තු කිරීම
- කළමනාකරණ තොරතුරු පද්ධති සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම
- මෘදුකාංග සංවර්ධනය සහ ඊ-විසඳුම්
- පුද්ගලික වලාකුළු පද්ධතිය නඩත්තු කරන්න
- ෆයිබර් ඔප්ටික් කොඳු නාරටිය සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම
- ප්‍රාදේශීය ජාල සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- Wi-Fi ජාලය සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම
- විශ්වවිද්‍යාල වෙබ් අඩවි සංවර්ධනය සහ නඩත්තුව
- ඉන්ටර්කොම් පද්ධතියේ ස්ථාපනය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම අධීක්ෂණය කිරීම
- VoIP පද්ධතියේ ස්ථාපනය, මෙහෙයුම් සහ නඩත්තුව පරිපාලනය කිරීම
- ICT උපකරණවල දෝෂ නිරාකරණය සහ නඩත්තු කිරීම
- මෘදුකාංග ස්ථාපනය කිරීම සහ ආරක්ෂක මෘදුකාංග සැපයීම
- පිරිවිතර සහ තාක්ෂණික ඇගයීම් සකස් කිරීම
- විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සඳහා සහාය වීම
- සිසුන් සඳහා උපදේශන සේවා සහ තාක්ෂණික සහාය ලබා දීම

පුස්තකාලයාධිපති, ආචාර්ය නයනා විජයසුන්දර මහත්මියගේ මෙහෙයවීම යටතේ එක් නියෝජ්‍ය පුස්තකාලයාධිපතිවරියක්, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/වරියන් (Grade I) හතරදෙනෙක්, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/වරියන් (Grade II) හතරදෙනෙක් (04), සහකාර පුස්තකාලයාධිපතිවරුන් /වරියන් තිදෙනෙක්, එක් සහකාර ලේඛකාධිකාරීවරියක් (පුස්තකාල සේවා), එක් සහකාර ජාල කළමනාකරුවෙක්, සහ 47 දෙනෙකුගෙන් යුත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් පිරිසකගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් 2023 වසරේදී පුස්තකාලයේ රාජකාරී කටයුතු ඉටු කරන ලදී. 2023, ජුනි මාසයේ දී සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා) විශ්‍රාම ගන්නා ලද අතර, එක් සහකාර පුස්තකාලයාධිපතිවරියක් සේවයෙන් ඉල්ලා අස් විය.

2023 වර්ෂය තුලදී, වාර්ෂික ප්‍රතිපාදන වලින් රු. මිලියන 0.39 ක වියදමින් පොත් නාම 20 ක් ද (පිටපත් 70 ඇතුළත්ව), රු. 3000.00 ක වියදමින් දේශීය වාර සඟරා (මුද්‍රිත) නාම 01 ක් මිලදී ගන්නා ලදී. තවද, රු. මිලියන 2.16 ක වියදමින් JSTOR විද්‍යුත් දත්ත පදනමද, රු. මිලියන 0.5 ක වියදමින් Research4 life විද්‍යුත් දත්ත පදනම ද මිලදී ගන්නා ලදී. MacProvideo.com රු. 44,429.76 ක වියදමින් ලබා ගන්නා ලදී. රු. 151,054.00 ක වියදමින් CrossRef DOI ලියාපදිංචි පහසුකම ලබා ගන්නා ලදී. Turnitin Feedback studio Growth License (LMS Integrated version) රු. මිලියන 4.2 ක වියදමින් ලබා ගන්නා ලදී. පුස්කොළ පොත් 19 ක් (රු. 500,000.00) වර්ෂය තුලදී මිලදී ගන්නා ලදී. රු. 2,73,3370.00 ක වටිනාකමකින් යුත් පොත් නාම 1337 ක්, රු. 52,500.00 ක වටිනාකමකින් යුත් දේශීය හා විදේශීය වාර සඟරා නාම 53 ක් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත. සඟරා හුවමාරු කර ගැනීමේ පදනම යටතේ සඟරා නාම 06 ක් (රු. 23,175.37 වටිනාකම සහිත) ලැබී ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ කොන්සෝටියම් (Consortium), CONSAL මගින් Emerald, Taylor & Francis, Oxford University Press Journals යන විද්‍යුත් දත්ත පදනම් 03 වෙත ප්‍රවේශ වීමට පාඨකයින්ට අවස්ථාව සලසන ලදී. මේ හරහා ප්‍රලේඛන සම්පාදන සේවාවක්ද පාඨකයින්ට ලබා දී ඇත. තවද, කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයේ AHEAD ව්‍යාපෘතිය හරහා EBSCO දත්ත පදනම සඳහා ප්‍රවේශය ලබා ගන්නා ලදී.

2023 වර්ෂය තුළදී පොත් නාම 2091 ක් (පොත් පිටපත් 2789) ක් පිරිසැකසුම් අංශය හා ශාඛා පුස්තකාල මගින් පිරිසකසන ලද අතර, එම ප්‍රමාණය ලංකා ශාලාවට පිටපත් 137 ක්, නිත්‍ය විමර්ශන අංශයට පිටපත් 131 ක්, විමර්ශන අංශයට පිටපත් 346 ක්, සහ බැහැරදෙන අංශයට පිටපත් 2175 ක් වශයෙන් සමන්විත විය. තවද CD පට 01ක් 'Interactive Study Area' එකට එකතු කරන ලදී. 2023 වසර අවසාන වනවිට පුස්කොළ පොත් 76 ක් සංරක්ෂණ කටයුතු වලින් අනතුරුව ප්‍රතිග්‍රහණය කර ඇත.

වර්ෂය තුළදී, ලියාපදිංචිය ලැබූ සමස්ථ පාඨක සංඛ්‍යාව 4795 ක් වන අතර, එය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 36 ක් ද, අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 39 ක් ද, ප්‍රථම උපාධිය හදාරන සිසුන් 4420 ක් ද, ඩිප්ලෝමා සහ පශ්චාද් උපාධි සිසුන් 300 ක් ද වශයෙන් විය. එම සංඛ්‍යාවන් සමඟ වර්ෂය තුළ ලියාපදිංචිව සිටි සමස්ථ පාඨක සංඛ්‍යාව 17,062 ක් විය.

අන්තර් පුස්තකාල පිරුළු සේවාව යටතේ කරන ලද ඉල්ලීම් ඉටු කිරීමට ලැබුණු හැකියාව ප්‍රතිශතයක් වශයෙන් 90% ක් විය. විශ්වවිද්‍යාලයීය ප්‍රකාශන සඳහා කරන ලද ඉල්ලීම්වලට අනුව ISBN අංක 25 ක් හා ISSN අංක 11 ක් ලබා දීමට කටයුතු කරන ලදී. 2023 වසරේදී ලැප්ටොප් පරිගණක බැහැරදීම් 185 සිදුකරන ලදී. ලැප්ටොප් පරිගණක බැහැර දීමේ සේවාව සඳහා ලැප්ටොප් පරිගණක 30 ක් යොදාගෙන ඇත. (නමුත්,පරිගණක 06 ක් පමණක් ක්‍රියාකරන තත්වයේ පවතී). Scholar Bank (Digital Repository) හි පර්යේෂණ පත්‍රිකා 11,188 ක්

ඇතුලත් කිරීම සිදු කර ඇති අතර 2023 වර්ෂය අවසාන වන විට පුවත්පත් දත්ත සමුදාය තෝරාගත් පුවත්පත් ලිපි 9090 ක ගෙන් සමන්විත විය. 2023 වර්ෂය තුළදී පුස්කොළ පොත් 56 ක්, Scholar Bank (Digital Repository) එකට ඇතුළත් කරන ලදී. තොරතුරු මූලාශ්‍ර පිළිබඳ දැනුවත් කිරීම සහ තොරතුරු සාක්ෂරතාවය පාඨකයන් තුළ වර්ධනය කිරීම අරමුණු කරගත් වැඩමුළු 22 ක් ශිෂ්‍ය ප්‍රජාව හා අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වා ඇත. තවද, පුස්තකාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් 2023 වර්ෂය තුළ refereed journal ලිපි 03 ක්, conference abstracts 16 ක් Full text conference papers 05 ක් සහ පොත් පරිච්ඡේද 01 ක් ප්‍රකාශයට පත් කරන ලදී.

2023 වර්ෂය තුළදී, සහකාර පුස්තකාලයාධිපතිවරුන්/වරියක් හතර දෙනෙකු පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාද් උපාධි පාඨමාලා සම්පූර්ණ කර ඇති අතර, පුස්තකාල තොරතුරු සහකාරවරු තිදෙනෙකු පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර ඇත. එක් අයෙකු ආචාර්ය උපාධිය ද, තවත් අයෙකු පශ්චාද් උපාධි පාඨමාලාව ද, දෙදෙනෙකු ඩිප්ලෝමා පාඨමාලාව ද හදාරමින් සිටියහ. තවද, 2023 වර්ෂයේදී විශ්වවිද්‍යාලීය පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය මගින් පැවැත්වූ වැඩමුළුවක් සඳහා පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සහභාගී විය.

බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය

1979 වර්ෂයේ වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව හඳුන්වා දීමත් සමග ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශය ආරම්භ කෙරුණි. ඉන් අනතුරුව ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව, විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සහ විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධි පාඨමාලාව ආරම්භ කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 932 අනුව 2010 වර්ෂයේදී බාහිර උපාධි ඒකකය බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය (EDECU) බවට පරිවර්තනය විය. 2014 වර්ෂයේදී සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව ආරම්භ කරන ලද අතර විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව 2021 දී ආරම්භ කරන ලදී.

බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය විශ්වවිද්‍යාල පාලක සභාව විසින් පත් කරන ලද අධ්‍යක්ෂවරයෙකු විසින් මෙහෙය වන අතර මහාචාර්ය පින්නවල සංඝසුමන හිමි වත්මන් අධ්‍යක්ෂ තනතුර හොබවයි. මෙම ඒකකයෙහි අධ්‍යයන පහසුකම්, ඇගයීම් හා ශික්ෂණ සහායතා සහ ලියාපදිංචි හා විභාග අංශය යන උප අංශ තුනක් පවතින අතර ඒ සෑම අංශයක්ම සමායෝජකවරයෙකු විසින් මෙහෙයවනු ලැබේ. මෙම ඒකකය උපකුලපතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් කළමනාකරණ කමිටුවක් (MC) මගින් පාලනය වේ. බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකයේ අධ්‍යයන කටයුතු මෙහෙයවීම සඳහා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය යටතේ වෙන වෙනම අධ්‍යයන මණ්ඩල (BoS) දෙකක් පිහිටුවා ඇත.

<u>උපාධි පාඨමාලා</u>

බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය යටතේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් පිරිනමන බාහිර උපාධි පාඨමාලා හයක් ඇත.

1. මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය විසින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා
    - ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

- ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
- සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය)බාහිර උපාධි පාඨමාලාව

2. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය විසින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

- විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධි පාඨමාලාව
- වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
- විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
-

<u>ශිෂ්‍ය ලියාපදිංචිය</u>

2023 වර්ෂයේදී 2022 අධ්‍යයන වර්ෂය සඳහා බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය පිරිනමන උපාධි පාඨමාලා සඳහා සිසුන් 5728ක් ලියාපදිංචි වී ඇත. ලියාපදිංචි වූ සිසුන් අතරින් 3550ක් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයටද 2178ක් කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයටද අයත් වෙති.

උපාධි පාඨමාලාව	2023 වර්ෂයේදී ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	3217
සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	133
ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	200
වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	984
විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධි පාඨමාලාව	1026
විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	168
2022 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	5728

වගුව 1

<u>නම්නීකරණ වැඩසටහන්</u>

ලියාපදිංචිය, සම්මන්ත්‍රණ, විභාග ක්‍රියාවලිය, විභාග නීති සහ රෙගුලාසි සම්බන්ධ සියලු තොරතුරු නම්නීකරණ වැඩසටහනේදී සිසුන්ට දැනුම් දෙනු ලැබේ. බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය විසින් 2023 වර්ෂයේදී ZOOM හරහා එක් එක් උපාධි වැඩසටහන සඳහා වෙන වෙනම නම්නීකරණ වැඩසටහන් හයක් පැවැත්වූ අතර 2023 දී පවත්වන ලද නම්නීකරණ වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

නම්නීකරණ වැඩසටහන	පැවැත්වූ දිනය
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	2023.12.02
සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	2023.12.02
ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	2023.02.11
වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	2023.02.11

විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධි පාඨමාලාව	2023.02.11
විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	2023.02.11

වගුව 2

<u>සම්මන්ත්‍රණ</u>

උපාධි පාඨමාලා සඳහා සම්මන්ත්‍රණ මාලාවක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය පීඨ සමඟ එක්ව පවත්වන අතර 2023 වර්ෂය තුළ එක් එක් උපාධි පාඨමාලා සඳහා බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය විසින් පැවැත්වූ සම්මන්ත්‍රණ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

උපාධි පාඨමාලාව	පැවැත්වූ සම්මන්ත්‍රණ ගණන
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	2409
ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	440
සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය)බාහිර උපාධි පාඨමාලාව	313
වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	423
විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධි පාඨමාලාව	505
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	728
2023 වර්ෂයේ පැවැත්වූ සම්මන්ත්‍රණ ගණන	4818

වගුව 3

<u>පරීක්ෂණ</u>

2023 වර්ෂය තුළ එක් එක් උපාධි පාඨමාලා සඳහා බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පැවැත්වූ පරීක්ෂණ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

	උපාධි පාඨමාලාව	2023 වර්ෂයේ පවත්වන ලද විභාග සංඛ්‍යාව		
		I කොටස	II කොටස	III කොටස
1	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව (නව විෂය නිර්දේශය)	1	1	1
2	ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව (පැරණි විෂය නිර්දේශය)	1	1	-
3	සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	1	1	1
4	ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	1	1	1

5	වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව (පැරණි විෂය නිර්දේශය)	1	1	1
	උපාධි පාඨමාලාව	2023 වර්ෂයේ පවත්වන ලද විභාග සංඛ්‍යාව		
		I කොටස	II කොටස	III කොටස
6	වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව (නව විෂය නිර්දේශය)	1	1	1
7	විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධි පාඨමාලාව	1	1	1
8	විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	2	2	2
9	විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	I සමාසිකය 1	I සමාසිකය 1	I සමාසිකය 1
		II සමාසිකය 1	II සමාසිකය 1	II සමාසිකය 1
එක් එක් කොටස සඳහා පවත්වන ලද මුළු විභාග ගණන		11	11	10
2023 වර්ෂයේ පවත්වන ලද මුළු විභාග සංඛ්‍යාව		32		

වගුව 4

පැරණි විෂය නිර්දේශයේ බාහිර උපාධි පාඨමාලා, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධි පාඨමාලාව - 2014 අධ්‍යයන වර්ෂය සහ වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - 2014 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි 2023/12/31 දිනෙන් අවසන් විය.

<u>අධීක්ෂණ මාර්ගගත පරීක්ෂණ</u>

බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය මාර්ගගත විභාග ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) භාවිතයෙන් පවත්වනු ලැබේ. බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකය 2023 වසරේ විදේශගත සිසුන් සඳහා අධීක්ෂණ මාර්ගගත පරීක්ෂණ සාර්ථකව පවත්වා ඇමරිකානු ඩොලර් 3415 ක් උපයා ඇත. මාර්ගගත අධීක්ෂණ විභාගවල සාරාංශය පහත පරිදි වේ.

උපාධි පාඨමාලාව	උපාධි කොටස	ආදායම (ඇමරිකානු ඩොලර්)
ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	II කොටස	120
	III කොටස	120
ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	II කොටස	60

උපාධි පාඨමාලාව	උපාධි කොටස	ආදායම (ඇමරිකානු ඩොලර්)
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	I කොටස	120
	II කොටස	400
සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	II කොටස	77
විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	I කොටස - I සමාසිකය	340
	II කොටස - II සමාසිකය	320
	III කොටස - II සමාසිකය	306
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	I කොටස	170
	II කොටස	420
	III කොටස	327
වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	II කොටස	480
	III කොටස	155
මුළු ආදායම (ඇමරිකානු ඩොලර්)	3415	

වගුව 4

<u>උපාධි ප්‍රදානෝත්සවය</u>

17 වැනි බාහිර උපාධි ප්‍රදානෝත්සවය 2023 දෙසැම්බර් 24 වැනි දින පැවැත්වූ අතර එක් එක් පාඨමාලාව සමත් උපාධිධාරීන් සංඛ්‍යාව පහත පරිදි වේ.

උපාධි පාඨමාලාව	උපාධිධාරීන් සංඛ්‍යාව
ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	350
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	302
සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	51
ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	40
වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	288
විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය බාහිර උපාධි පාඨමාලාව	210
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	1054
විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව	53
මුළු උපාධිධාරීන් සංඛ්‍යාව	2348

වගුව 5

<u>පාඨමාලා සමාලෝචනය</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලය (QAAC) විසින් ලබා දුන් මඟපෙන්වීම අනුව, බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකයෙහි තත්ත්ව සහතිකකරණ ඒකකය විසින් බාහිර උපාධි පහක් සඳහා පාඨමාලා සමාලෝචනයක් පවත්වන ලදී.

- වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
- විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව
- ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය
- සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
- ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

2023 වර්ෂයේදී ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව, සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සහ ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලා සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩසටහන් පැවැත්වූ අතර ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව "A" සාමාර්ථ්‍යයක් ද සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව "B" සාමාර්ථ්‍යයක් ද ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය "C" සාමාර්ථ්‍යයක් ද ලබා ඇත.

<u>කමිටු රැස්වීම්</u>

බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ඒකකයෙහි 2023 වර්ෂයේදී කළමනාකරණ කමිටු රැස්වීම් 12 ක්, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ අධ්‍යයන මණ්ඩල රැස්වීම් 12 ක් සහ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ අධ්‍යයන මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලදී.

විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය

විශ්වවිද්‍යාල ප්‍රජාවගේ වෛද්‍ය ගැටලු පිළිබඳව විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය විසින් කටයුතු කරයි. සිසුන්, කාර්ය මණ්ඩලය සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පවුලේ සාමාජිකකයින්ට වෛද්‍ය පහසුකම් සපයාදීම මෙයට ඇතුළත් වේ. තවද අඛණ්ඩ සත්කාර, නිවාරණ සත්කාර සහ උපදේශන සේවා සපයනු ලබයි. මහජන සෞඛ්‍ය පරීක්ෂක අංශය විශ්වවිද්‍යාලය තුළ ඩෙංගු මර්දන, ජලභීතිකා මර්දන ව්‍යාපාරය, පළිබෝධ පාලනය සහ ආහාර තත්ත්ව පාලනය සිදු කරයි. දැනට වෛද්‍ය මධ්‍යස්ථානය රෝගීන් ලියාපදිංචි කිරීම, පත්වීම් සහ ඖෂධ බෙදාහැරීමේ සිට අංග සම්පූර්ණ විද්‍යුත් සෞඛ්‍ය වාර්තා සේවාවකින් සමන්විතය. ඩිජිටල්කරණය කළ පළමු විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය මෙයයි. 2023 වර්ෂයේදී අපගේ වෛද්‍ය මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් තත්ත්ව කළමනාකරණය සඳහා ISO 9001:2015 ප්‍රමිතිය ලබා ගත් ශ්‍රී ලංකාවේ පළමු වෛද්‍ය මධ්‍යස්ථානය බවට පත් විය.

2023 වර්ෂය තුළ වෛද්‍ය එස්. ද සිල්වා මහත්මිය විෂය භාර වෛද්‍ය නිලධාරීවරයා ලෙස කටයුතු කරන ලදි . වෛද්‍ය ඩී.එම්.එල්.ආර්.එච් පෙරේරා මහත්මිය වෛද්‍ය නිලධාරියෙකු ලෙසත් වෛද්‍ය ඩී.පී.ඩී ඇසලගේ දන්ත ශල්‍ය වෛද්‍යවරයා ලෙසත් සේවය කරන ලදි. වෛද්‍ය කේ.ජී.එන් සෙනෙවිරත්න, වෛද්‍ය අනෝමා අරංගල සහ වෛද්‍ය එස්.එම්.ඩී.ජී.එස් පෙරේරා දේශීය වෛද්‍ය නිලධාරීන් ලෙස සේවය කරන ලදි.

වෛද්‍ය පහසුකම් ලබා ගන්නා ලද සාමාන්‍ය රෝගීන්	ඖෂධහලට යවන ලද බෙහෙත් වට්ටෝරු ගණන	වෛද්‍ය පහසුකම් ලබා ගන්නා ලද දන්ත රෝගීන්
25784	15534	1029

වෛද්‍ය මධ්‍යස්ථානය මගින් පහත වැඩසටහන් පවත්වන ලදී.

- 2023 මාර්තු 21 වන දින ලෝක මුඛ සෞඛ්‍ය දිනය - වෛද්ය මධ්‍යස්ථාන පරිශ්‍රයේ වෛද්ය මධ්‍යස්ථානය සහ දන්ත වෛද්ය පීඨය විසින් පවත්වනු ලැබේ.
- 2023 ජුනි 27 වැනි දින වෛද්ය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා ගිනි සරඹ.
- 2023 නොවැම්බර් 14 සහ 23 යන දිනවල විද්යා පීඨයේ, මානව ශාස්ත්‍ර හා සමාජ විද්යා පීඨයේ, ඉංජිනේරු පීඨයේ, සම සෞඛ්‍ය විද්යා පීඨයේ, කළමනාකරණ අධ්‍යයන පීඨයේ සහ තාක්ෂණ පීඨයේ විද්යාගාර කාර්ය මණ්ඩලය සඳහා ප්‍රථමාධාර වැඩසටහන් සිදු කර ඇත
- 2023 සැප්තැම්බර් 19 වැනි දින බොරලැස්ගමුව සෞඛ්‍ය වෛද්ය කාර්යයාලය සමඟ එක්ව 1978 සහ 1988 වසරවල උපත ලැබූ කාර්ය මණ්ඩලය සඳහා පියයුරු පිළිකා සහ ගැබ්ගෙල පිළිකා පරීක්ෂණ පරීක්ෂණය සිදු කරන ලදී.
- වෛද්ය පීඨ කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලබන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන.
- නොවැම්බර් 28 සහ 29 යන දිනවල සෞඛ්‍ය පරීක්ෂාව
- නොවැම්බර් 30 වන දින යෝගා ,සුම්බා සහ ආහාර ලබා ගැනීම පිළිබඳ උපදෙස් ලබා දීම

හැදින්වීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව (RC-USJ) 2016 දී පිහිටුවන ලද්දේ උසස් තත්ත්වයේ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ජනනය කරන ලද දැනුම ව්‍යාප්ත කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ජාතික සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීම සඳහා ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාවෙහි ක්‍රියාකාරකම් අරමුණු කර ඇත්තේ උසස් තත්ත්වයේ පර්යේෂණවල නිරත වීමට විශ්ව විද්‍යාලයේ විද්වතුන්, විධායක නිලධාරීන් සහ සිසුන් දිරිමත් කිරීමයි. යටිතල පහසුකම් සංවර්ධනයට පහසුකම් සැලසීම, පර්යේෂණ සඳහා අරමුදල් ලබා දීම, දැනුම බෙදා හැරීමට පහසුකම් සැලසීම සහ ජාතික හා ජාත්‍යන්තර සහයෝගීතාවය දිරිමත් කිරීම මගින් මෙය සාක්ෂාත් කර ගැනීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව අරමුණු කරයි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව විසින් පර්යේෂණ සම්මාන ක්‍රමය මගින් පර්යේෂකයන් හඳුනාගෙනඔවුන්ගේ කාර්යයන් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරයි.

දැක්ම

දේශීය සහ තිරසාර හවුල්කාරිත්වයන් පෝෂණය කරමින්, පාරිසරික, සමාජීය, ආර්ථික පදනමේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා විශිෂ්ටත්වය සහ සාර්ථක පර්යේෂණ සහ සංවර්ධන පදනම් වූ දියුණුව ළඟා කර ගැනීමට හැකි වාතාවරණයක් නිර්මාණය කිරීම මගින් අරමුදල් සහ යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය පුළුල් කිරීම තුළින් පර්යේෂණ සහ සංවර්ධනය පෝෂණය කිරීම. වර්තමාන සහ අනාගත පරම්පරාවේ යහපැවැත්ම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි පර්යේෂණ ප්‍රජාව විසින් ජාත්‍යන්තර පාර්ශවකරුවන්ගේ ආයතන.

අරමුණු

1. ජාතික සහ ගෝලීය අවශ්‍යතා සපුරාලන ජාතික හා ජාත්‍යන්තර වැදගත්කමක් ඇති පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
2. විශ්වවිද්‍යාලය තුළ හිතකර පර්යේෂණ සංස්කෘතියක් වගා කිරීම
3. පර්යේෂණවල විශිෂ්ටත්වයේ ස්වයං තිරසාර මධ්‍යස්ථාන පිහිටුවීම
4. පර්යේෂකයන්ට සහයෝගයෙන් කටයුතු කිරීමට සහ ගුණාත්මක පර්යේෂණ සිදු කිරීමට පහසුකම් සැලසීම
5. පර්යේෂකයන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම
6. පර්යේෂණ ක්‍රියාවලිය සුමට කිරීම
7. පර්යේෂකයන්ට ඔවුන්ගේ දැනුම ජාතික හා ජාත්‍යන්තරව බෙදා හැරීමට පහසුකම් සැලසීම
8. කර්මාන්ත සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ පර්යේෂණ උපදේශන සඳහා පහසුකම් සැලසීම
9. උසස් තත්ත්වයේ ශිෂ්‍ය පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
10. විශ්වවද්‍යාලයේ පර්යේෂණ සභාවේ සාමාජික ආයතනවල පර්යේෂණ මෙහෙයුම් වල සඵලතාවය වැඩි දියුණු කිරීම
11. පර්යේෂණ සහ එහි පරිපාලනය සම්බන්ධ අනෙකුත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇති කර පවත්වාගෙන යාම

නිලධාරීන්	
නම	**තනතුර**
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පත්මලාල් මානගේ	උපකුලපති විධායක සභාපති
මහාචාර්ය රොෂාන් අජ්වර්ඩ්	සම සභාපතිවරුන්
අචාර්යය ආර්.එම්.ඒ.යූ රාජපක්ෂ	ප්‍රධාන ලේකම්
උපදේශන මණ්ඩලය (පීඨ වල පීඨාධිපතිවරුන්)	
මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද	පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
මහාචාර්ය එස් එම් සී යූ පී සුබසිංහ	පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය
අචාර්යය දුෂාන් ජයවික්‍රම	පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය
මහචාර්යය මනෝරි ගමගේ	පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය
මහචාර්යය පී.පී.ආර් පෙරේරා	පීඨාධිපති, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
මහාචාර්යය නිල්මිණි ලියනගේ	පීඨාධිපති තාක්ෂණ පීඨය
අචාර්යය එම්.එන් ධර්මවීර	පීඨාධිපති, ඉංජිනේරු පීඨය
මහාචාර්යය ඩී.අයි.උළුවඩුගේ	පීඨාධිපති ,සම සෞඛ්‍ය විද්‍යා පීඨය
මහාචාර්යය සුරංගි යසවර්ධන	පීඨාධිපතිනිය, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය
ජ්‍යෙෂ්ඨ මහාචාර්යය පී.පී.එම් ජයවීර	පීඨාධිපති, ජලජ හා නාගරික ජෛව සම්පත් පීඨය
මහාචාර්යය ප්‍රසාද් ජයවීර	පීඨාධිපති, පරිගණක පීඨය
පීඨ පර්යේෂණ කමිටු සභාපතිවරුන්	
මහාචාර්යය ටී.එම්.එස්.පී.කේ තෙන්නකොන්	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
මහචාර්යය බී.එම්.එස්.ජී. බන්නැහැක	ව්‍යවහාරික විද්‍යා පීඨය
මහචාර්යය කේ.ජී.එල්.චන්ද්‍රලාල්	කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය
අචාර්යය වරුණි තෙන්නකෝන්	වෛද්‍ය විද්‍යා පීඨය
අචාර්යය කේ.කේ.ඒ.සංජීව	තාක්ෂණ පීඨය
ආචාර්යය නදිකා ජයසූරිය	ඉංජිනේරු පීඨය
අචාර්යය එන්.ඩී. විතානගේ	සම සෞඛ්‍ය විද්‍යා පීඨය
පීඨ නියෝජිතයන්	
පූජ්‍ය පින්නවල සංඝසුමන හිමි	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
මහචාර්යය සී.ඒ.ඩී. නහල්ලගේ	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ආර්.එල්.එස් ෆර්නැන්ඩු	කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය
මහාචාර්යය ටී.එස් .එම් අමරසේන	කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය
අචාර්යය රොෂාන් දසනායක	තාක්ෂණ පීඨය
අචාර්යය ගයාන් ප්‍රියදර්ශන	තාක්ෂණ පීඨය

අචාර්යය යූ.කේ. විජේනායක	ඉංජිනේරු පීඨය
අචාර්යය ජනිතා වල්පිට	ජලජ හා නාගරික ජෛව සම්පත් පීඨය
අචාර්යය ජේ.ඒ.එස් චින්තක	ජලජ හා නාගරික ජෛව සම්පත් පීඨය
මහාචාර්යය හිරාන් අමරසේක්ර	ප්‍රධානී – විශ්වවිද්‍යාල වෙබ් කණ්ඩායම
මහචාර්යය එස්.ටී.ඩබ්ලිව්.එස් යාපා	අධ්‍යක්ෂක – කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ලලීන් කරුණානායක	අරාධිත
මහචාර්යය මෙතිකා විතානගේ	අරාධිත
ජ්‍යෙෂ්ඨ මහචාර්යය එච්.එච්.ඩී.පී.එන් ඕපාත	අරාධිත
ජ්‍යෙෂ්ඨ මහචාර්යය කේ.ඩී.ගුණවර්ධන	අරාධිත
අචාර්යය ඒ.කේ.එල් ජයවර්ධන	අරාධිත – කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය
අචාර්යය ඩබ්.ලිව් .ජී.එස් කැලුම්	අධ්‍යක්ෂ - කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය
ඒ.බී. වැලිවිට	ලේඛකාධිකාරී
අචාර්යය ඩබ්ලිව් .ඒ.එන්.ඩී. විජේතිලක	පුස්තකාලායාධිපති
කේ.ටී.සී.ප්‍රියංගනි	මූල්‍යාධිකාරි
සී.ජී.බාලසූරිය	සහකාර ලේඛකාධිකාරි - උපකුලපති කාර්යයාලය

විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රතිපාදන

2015 - 2022 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව

පීඨය/ වසර	2015	2016	2017	2018	2019	2021	2022
මානව ශාස්ත්‍ර සහ සමාජයීය විද්‍යා	05	10	09	12	09	05	10
ව්‍යවහාරික විද්‍යා පීඨයි	16	31	32	36	27	38	31
කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨය	13	04	10	07	08	11	05
වෛද්‍ය විද්‍යා පීඨය	21	33	26	19	17	11	12
තාක්ෂණ පීඨය	-	-	06	01	07	19	25
ඉංජීනේරු පීඨය	-	-	01	-	01	02	05
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	-	-	-	-	04	06	05
පුස්තකාලය	-	-	-	-	01	-	-
මුළු ගණන	**55**	**78**	**84**	**75**	**74**	**93**	**93**

2015 - 2022 වසර තුළ පර්යේෂණ ප්‍රදාන සඳහා වෙන් කරන ලද අරමුදල් (රු. මිලියන)

පීඨය/ වසර	2015	2016	2017	2018	2019	2021	2022
මානව ශාස්ත්‍ර සහ සමාජයීය විද්‍යා	7.24	19.51	13.67	17.37	15.42	8.96	18.01
ව්‍යවහාරික විද්‍යා පීඨයි	28.07	63.22	78.29	85.14	58.49	89.56	77.61
කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨය	8.92	3.23	9.06	3.33	9.28	10.34	8.09
වෛද්‍ය විද්‍යා පීඨය	24.95	45.53	40.63	47.03	35.21	25.48	22.53
තාක්ෂණ පීඨය	-	-	19.21	1.49	19.18	47.75	70.77
ඉංජීනේරු පීඨය	-	-	2.14	-	2.46	5.9	8.20
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	-	-	-	-	7.41	9.36	0.39
පුස්තකාලය	-	-	-	-	0.53	-	-
මුළු ගණන	**69.18**	**131.49**	**163.00**	**154.35**	**144.98**	**197.74**	**220.73**

පර්යේෂණ මධ්‍යස්ථාන

2024 මාර්තු 5 වන විට පර්යේෂණ සභාව යටතේ දැනට පර්යේෂණ මධ්‍යස්ථාන විසි දෙකක් ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථාන ඒ ඒ පීඨ තුළ ශක්තිමත් පර්යේෂණ පසුබිමක් සහිත කැපවූ සහ උද්යෝගිමත් විද්වතුන් විසින් ආරම්භ කර ඇත. විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව පිහිටුවීමත් සමඟ, එවැනි මධ්‍යස්ථාන සියල්ල එහි විෂය පථය යටතට ගෙන ඇති අතර, අභිසාරීත්වය සහ සහයෝගීතාවය සඳහා පොදු පර්යේෂණ සහ සංවර්ධන නවෝත්පාදන වේදිකාවක් නිර්මාණය කර ඇත.

පර්යේෂණ මධ්‍යස්ථාන පහත පරිදි වේ :

	පර්යේෂණ මධ්‍යස්ථානය	අධ්‍යක්ෂක
1	ජල තත්ත්ව සහ ඇල්ගී පර්යේෂණ මධ්‍යස්ථානය	ආචාර්යය එෆ්.එස්.අයිඩ්රෝස්
2	වකුගඩු පර්යේෂණ මධ්‍යස්ථානය (CKD - පර්යේෂණ)	මහාචාර්යය පී.පී.ආර්.පෙරේරා
3	නවෝත්පාදන සඳහා අන්තර් විනය මධ්‍යස්ථානය,පෛව තාක්ෂණය සහ ස්නායු විද්‍යාව	අචාර්යය එම්.ආර්.පී.එච්.ලියනගේ
4	බහුවිධ පර්යේෂණ සඳහා මධ්‍යස්ථානය	මහාචාර්යය ටී.එම්.එස්.පී.කේ.තෙන්නකෝන්
5	කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පර්යේෂණ මධ්‍යස්ථානය	මහාචාර්යය කේ.පී.එල්.චන්ද්‍රලාල්
6	පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානය (CCR)	ආචාර්යය කේ.එල්.එම්.ඩී. සෙනෙවිරත්න
7	උසස් ද්‍රව්‍ය පර්යේෂණ සඳහා මධ්‍යස්ථානය (නැනෝ තාක්ෂණය)	අචාර්යය සී.ජේ. නාරංගොඩ
8	පෛව තාක්ෂණ මධ්‍යස්ථානය	අචාර්යය සචිනි ෆර්නැන්ඩු
9	වන විද්‍යාව සහ පරිසරය පිළිබඳ මධ්‍යස්ථානය	මහාචාර්යය දහම් ජයවර්ධන
10	රොබෝ තාක්ෂණය සහ බුද්ධිමය පද්ධතිය සඳහා නවෝත්පාදන මධ්‍යස්ථානය	අචාර්යය පී.ආර්.එස්. ද සිල්වා
11	ඇපල් පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	අචාර්යය ඩී.ඩී.ඒ.ගාමිණි
12	නිශ්චල දේපල අධ්‍යයනය සඳහා මධ්‍යස්ථානය	අචාර්යය ටී.ජී.යූ පී. පෙරේරා

13	පාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා පර්යේෂණ මධ්‍යස්ථානය	ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ආර්.එල්.එස් ෆර්නැන්ඩු
14	ශාක ද්‍රව්‍ය සහ ශාකසාර නිෂ්පාදන පර්යේෂණ මධ්‍යස්ථානය	අචාර්යය එම්.එල්.ඒ.එම්.එස් මුණසිංහ
15	පරිසරගෝල ප්‍රත්‍යස්ථතා පර්යේෂණ මධ්‍යස්ථානය	අචාර්යය ආර්.එම්.ඒ.යූ.රාජපක්ෂ
16	බෝ නොවන රෝග පර්යේෂණ මධ්‍යස්ථානය(NCDRC)	මහාචාර්යය සී.එස්.ඊ.ගුණවර්ධන
17	සිහිකල්පනාව පදනම් කරගත් පර්යේෂණ සහ භාවිතයන් සඳහා මධ්‍යස්ථානය	අචාර්යය සරත් මහවිතාගේ
18	උසස් අධිකරණ වෛද්‍ය පර්යේෂණ සඳහා මධ්‍යස්ථානය	අචාර්යය බන්දුල විජේසිංහ
9	සමුද්‍ර විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (CMST	මහචාර්යය ආර්.ආර්.එම්.කේ.පී. රණතුංග
20	විද්‍යාත්මක පරිගණක සහ උසස් ඖෂධ සොයාගැනීම සඳහා මධ්‍යස්ථානය	අචාර්යය ආර්.එස්.ජයකොඩි
21	නැනෝ සංයුක්ත පර්යේෂණ මධ්‍යස්ථානය	අචාර්යය ටී.එන්.බී.ඇටම්පාවල
22	ව්‍යාපාර කළමනාකරණය සඳහා පර්යේෂණ මධ්‍යස්ථානය (RCBM)	මහාචාර්යය එම්.ඩී. පුෂ්පකුමාරී

පර්යේෂණ ප්‍රදාන 2020

පර්යේෂණ ප්‍රදාන ලැයිස්තුව

කාණ්ඩය	ප්‍රදාන
1	දේශීය/විදේශීය සම්මන්ත්‍රණ ක්‍රියාදාමයන් හෝ සම්මන්ත්‍රණවල ප්‍රකාශයට පත් කරන ලද සාරාංශයක් (කථිකාචාර්ය-පරිවාස සහ කථිකාචාර්ය යන ශ්‍රේණි වල අයදුම්කරුවන්ට පමණක් අයදුම් කළ හැකිය)
2	දේශීය/විදේශීය සම්මන්ත්‍රණ ක්‍රියා පටිපාටිවල ප්‍රකාශයට පත් කරන ලද සම්පූර්ණ පත්‍රිකාවක්
3	විනිසුරු/ඕනෑම සුවිගත සඟරාවක (වෙනත් ඕනෑම සුවිගත කිරීමේ සේවාවක්) ප්‍රකාශයට පත් කරන ලද සම්පූර්ණ පත්‍රිකාවක් පහත 4 කාණ්ඩයේ ලැයිස්තුගත කර ඇති ආකාරයට වඩා)
4	සුවිගත සඟරාවක පළ කරන ලද ඔනෑම පත්‍රිකාවක් . * පිළිගත් දර්ශක සඟරා ලැයිස්තුගත කර ඇත. http://www.isinet.com/journals under: විද්‍යා උපුටා දැක්වීම් සුවිගත කරන ලද පුළුල් කරන ලද (™) (විද්‍යා වෙබ් කලා සහ මානව ශාස්ත්‍ර උපුටා දැක්වීම් දර්ශකය (විද්‍යා වෙබ්) එල්සිවියර් SCOPUS එමරල්ඩ් ඉන්සයිට් කැබෙල්ස් ජාත්‍යන්තරය
a. 5	වසර සඳහා ඉහළම h-දර්ශකය ඇති පර්යේෂකයන් 5 කාණ්ඩයේ සම්මාන සඳහා සලකා බැලීමට පර්යේෂකයාට 5 හෝ ඊට වැඩි h දර්ශකයක් තිබිය යුතුය • සෑම පීඨයකටම සම්මාන තුනක් පිරිනැමේ • 2016 සිට ක්‍රියාත්මක වන පරිදි එකම අපේක්ෂකයා සඳහා වසර පහකට වරක් 1, 2 සහ 3 ස්ථාන ප්‍රදානය කෙරේ.
6	පිළිගත් සුවිගත සඟරාවල සම්පූර්ණ පත්‍රිකා 5ක් හෝ වැඩි ගණනක් ප්‍රකාශයට පත් කර ඇති පර්යේෂකයන් (ඉහත 4 කොටස යටතේ ලැයිස්තුගත කර ඇත). ආයතනික අනුබද්ධය ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සඳහන් කළ යුතුය.
7	මුල් වෘත්තීය පර්යේෂක සම්මානය • h- දර්ශකය 5 හෝ 5 ට වැඩි විය යුතුය • පර්යේෂකයා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ සිටිය යුතුය • පර්යේෂණ සම්මාන අයදුම්පත් සඳහා නියමිත කාල සීමාව වන විට පර්යේෂකයා අවුරුදු 40ට අඩු විය යුතුය

8	• ප්‍රකාශිත ලිපිවල පළමු කතුවරයා • ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අනුරූප කතුවරයා විය යුතුය • අනුබද්ධය සහ විශ්ව විද්‍යාලයේ විද්‍යුත් තැපැල් ලිපිනය පර්යේෂණ ලිපියේ තිබිය යුතුය • ඉහළම සමුච්චිත බලපෑම ඇති අපේක්ෂකයාට සම්මානය පිරිනැමේ • සුචිගත සහරා හි පළ කරන ලද සම්පූර්ණ පත්‍රිකා සඳහා සාධකය (SCI/SSCI/AHCI/ElsevierSCOPUS/ Emerald Insight/ Cabell's International)
9	• උපකුලපති සම්මානය (CVCD මාර්ගෝපදේශ අනුගමනය කරන්න) (විද්‍යා විෂය ධාරාව සහ සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර විෂය ධාරාව මත පදනම්ව අදාළ CVCD මාර්ගෝපදේශවල නිර්ණායක භාවිතා කරමින් සම්මාන දෙකක් ප්‍රදානය කෙරේ) • අයදුම්කරුවන් පසුගිය වසර පහ තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවයේ යෙදී සිටිය යුතුය • කිසිදු පීඨ සාමාජිකයෙකුට වසර පහකට වරක් වඩා සම්මානය ලැබිය නොහැක.
10	බාහිර පර්යේෂණ ආධාර ලබා ගත් පර්යේෂකයන්

* සියලුම ප්‍රකාශනවල කර්තෘගේ ආයතනික අනුබද්ධය ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නම තිබිය යුතුය.

උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන (AHEAD) මෙහෙයුම් වේගවත් කිරීම සඳහා ලෝක බැංකුව අරමුදල් සපයන ලදී

වාර්ෂික වාර්තාව සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ AHEAD මෙහෙයුමේ ප්‍රගතිය - 2023

01. හැඳින්වීම:

පහළ මධ්‍යම ආදායම් ලබන රටක් (LMIC) ලෙස ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් (UMIC) බවට පත්කිරීමට හැකි වන පරිදි උසස් අධ්‍යාපන අංශය සංවර්ධනය කළ යුතුය. මෙම අදහස පිළිගනිමින්, උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) මෙහෙයුමක් ඔස්සේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතියට දායකවීම සඳහා ශ්‍රී ලංකා රජය (GoSL) සහ ලෝක බැංකු අරමුදල එකඟතාවයට පත්ව ඇත.

ප්‍රධාන මූල්‍ය ප්‍රභවයන් දෙක හරහා ලබා දුන් මුළු ප්‍රදානය USD මිලියන 100ක් විය: එනම් ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙන් (IBRD) ඇමරිකානු ඩොලර් මිලියන 67ක් සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් (IDA) ඇමරිකානු ඩොලර් මිලියන 33ක් විය. සම්පූර්ණ ඇස්තමේන්තුගත ව්‍යාපෘති කාලය වසර හයකි.

2. ප්‍රතිලාභීන්:

AHEAD මෙහෙයුම්වලින් ප්‍රතිලාභ ලබන මූලික සහ සෘජු ප්‍රතිලාභීන් වූයේ සිසුන් (600,000 පමණ), විද්වතුන් (5000 පමණ), උසස් අධ්‍යාපන අංශයේ කළමනාකරුවන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩල සාමාජිකයින්ය. AHEAD මෙහෙයුම් සිදු කළ කාලය තුල සහ එම කාලය අවසන්වීමෙන් පසුවද ප්‍රතිලාභීන් විසින් ප්‍රතිලාභ ලබා ඇත.එමෙන්ම AHEAD වෙතින් බොහෝ වක්‍ර ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් ද විය.

3. ක්‍රියාත්මක කිරීම:

AHEAD වැඩසටහනේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වූයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයයි (MoHE). ජාතික මට්ටමේ සම්බන්ධීකරණය සිදු කරන ලද්දේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) උසස් තාක්ෂණ ආයතන (ATIs) විසිනි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (MoHE), විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සහ සියලුම විශ්ව විද්‍යාල පහළොව (15) අතර සියලුම AHEAD ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරන ලද්දේ මෙහෙයුම් අධීක්ෂණ සහ උපකාරක කණ්ඩායම (OMST) විසිනි. විශ්වවිද්‍යාල මට්ටමේ සම්බන්ධීකරණය, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම සහ පහසුකම් සැලසීමේ කටයුතු සෑම විශ්වවිද්‍යාලයකම මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (OTS) මගින් සිදු කෙරේ.

4. මෙහෙයුම් තාක්ෂණික කාර්යාලය (OTS):

මෙහෙයුම් තාක්ෂණික කාර්යාලයේ (OTS) කර්තව්‍යය වූයේ මෙහෙයුම් සහ අධීක්ෂණ සහායක කණ්ඩායමේ (OMST) සහාය ඇතිව වැඩසටහන ක්‍රියාත්මක කරන කාලය තුල විශ්වවිද්‍යාලයේ අදාළ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන, මූල්‍ය කළමනාකරණය සහ කොන්ත්‍රාත් කළමනාකරණය ඇතුළුව නිත්‍ය ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීමයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික කාර්යාලය (OTS), අධ්‍යක්ෂ/OTS (අර්ධකාලීන) යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රසම්පාදන (අර්ධ කාලීන), නියෝජ්‍ය අධ්‍යක්ෂ/මුදල් (අර්ධ කාලීන), නියෝජ්‍ය අධ්‍යක්ෂ අධ්‍යක්ෂ/ඉංජිනේරු (අර්ධ කාලීන), ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරියෙකු (පූර්ණ කාලීන), ලේකම්වරයකු (පූර්ණ කාලීන) සහ තාක්ෂණික සහකාරවරු (පූර්ණ කාලීන) 04 දෙනකු සහ සහායක කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව පවත්වාගෙන යන ලදි. 2023 වර්ෂයේ, AHEAD මෙහෙයුම් වැඩසටහන් වල නිරතව සිටි මෙහෙයුම් තාක්ෂණික කාර්යාලයේ (OTS) කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් නම්, දැරූ තනතුරු සහ ඔවුන් සේවයේ නිරතව සිටි කාල සීමාවන් පහතින් සඳහන් කර තිබේ.

අ.අං	නම	තනතුර	කාලසීමාව - සිට	කාලසීමාව - දක්වා
1.	මහාචාර්ය හරේන්ද්‍ර කාරියවසම්	අධ්‍යක්ෂ/OTS	2023.01.01	2023.06.30
2.	ආචාර්ය ඉසුරු මානවඩු	අධ්‍යක්ෂ/OTS	2023.07.17	2023.12.31
3.	ඒ.ඒ.කේ.එන් රණසිංහ මෙය	නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රසම්පාදන	2023.01.01	2023.12.31
4.	කේ.ටී.සී. ප්‍රියංගනී මෙය	නියෝජ්‍ය අධ්‍යක්ෂ / මූල්‍ය	2023.01.01	2023.12.31
5.	ඕ.ඒ.ඩබ්. කරුණාරත්න මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ඉංජිනේරු	2023.01.01	30.06.2023
6.	ආර්.එම්. ගුණරත්න මෙය	ජ්‍යෙෂ්ට පරිපාලන නිලධාරී	2023.01.01	31.12.2023
3	මධ්‍යස්ථ උපකරණ පහසුකම් යටතේ රසායනාගාර පරීක්ෂණ ගාස්තු (සංවර්ධන අරමුදල් වලින් මාරු කර ඇත)	-	1,045,386
	මූළු එකතුව	**197,566,940**	**200,328,245**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

විලම්බිත ආදායම් - දිගුකාලීන වැඩසටහන්

සටහන 21

අනු අංකය	විස්තරය	උප ලේඛණ අංක.	2023/12/31 දිනට රු.	2022/12/31 දිනට රු.
1	විලම්බිත ආදායම් - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යවිද්‍යා පීඨය	**21.01**	148,270,761	111,825,414
2	විලම්බිත ආදායම් - පශ්චාද් උපාධි පීඨය	**21.02**	137,672,897	107,542,137
3	විලම්බිත ආදායම් - මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය	**21.03**	35,693,808	33,496,857
4	විලම්බිත ආදායම් - බාහිර විභාග	**21.04**	1,550,862,283	1,269,298,825
5	විලම්බිත ආදායම් -වෛද්‍ය විද්‍යා පීඨය	**21.05**	6,169,953	4,547,904
6	විලම්බිත ආදායම් -ව්‍යවහාර විද්‍යා පීඨය	**21.06**	-	22,896,753
7	විලම්බිත ආදායම් -තාක්ෂණ පීඨය	**21.07**	4,524,527	804,413
මුළු මුදල			**1,883,194,230**	**1,550,412,303**

ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන

සටහන 22

විස්තරය		2023/12/31 දිනට රු.	2022/12/31 දිනට රු.
	2022/01/01 දිනට ශේෂය	1,532,901,801	1,482,464,315
	එකතු : ව ර් ෂ ය සඳහා ප්‍රතිපාදන (වත්මන් සේවා පිරිවැය)	99,436,840	94,902,117
	එකතු : නිශ්චිත ප්‍රතිලාභ වගකීම් මත පොලී පිරිවැය	275,922,324	170,483,396
	එකතු : පසු සේවා පිරිවැය	-	15,952,070
	අඩු : නිශ්චිත ප්‍රතිලාභ මත ලාභය හෝ අලාභය	(58,080,140)	129,039,913
	අඩු : ව ර් ෂ ය තුල ගෙවීම්	104,504,845	101,860,184
දෙසැම්බර් 31 දිනට ශේෂය		**1,861,836,260**	**1,532,901,801**

ආපසු ගෙවනු ලබන තැන්පතු

සටහන 23

අනු අංකය	විස්තරය	උප ලේඛණ අංක.	2023/12/31 දිනට රු.	2022/12/31 දිනට රු.
1	විවිධ තැන්පතු	**23.01**	7,445,454	6,933,508
2	නැවත ගෙවන සුක්තකාල තැන්පතු හා විද්‍යාගාර තැන්පතු - පශ්චාද් උපාධි පීඨය	**23.02**	20,433,700	18,771,700
3	නැවත ගෙවන උපාධි ලෝගු තැන්පතු		6,123,479	3,925,179
4	ටෙන්ඩර් තැන්පතු	**23.03**	14,659,003	5,430,297
5	නැවත ගෙවන සුක්තකාල තැන්පතු - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යවිද්‍යා පීඨය		4,890,000	3,645,000
මුළු එකතුව			**53,551,636**	**38,705,684**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

උපචිත වියදම් සහ අනෙකුත් ගෙවීම්

සටහන 24

අනු අංකය	විස්තරය	උප ලේඛණ අංක.	2023/12/31 දිනට රු.	2022/12/31 දිනට රු.
1	විවිධ ණයකම්	**24.01**	546,311,809	1,221,896,056
2	ගෙවිය යුතු	**24.02**	718,455,657	723,584,808
3	දිසර්කාලීන වැඩසටහන්	**24.03**	84,231,396	57,204,030
මුළු මුදල			**1,348,998,862**	**2,002,684,893**

සටහන 25

2023/01/01 දිනට වත්කම් ප්‍රත්‍යාගණනයේ වටිනාකම				
විශ්වවිද්‍යාලයේ පරිගණක මෘදුකාංග සහ ජාලකරණය, දූරකථන ස්විචි සූචරුව, අනෙකුත් ප්‍රාග්ධන වත්කම් පිළිබඳ වත්කම් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යනාංශයක් වන දේපළ කළමනාකරණ සහ තක්සේරු දෙපාර්මේන්තුව විසින් රු. 222,538,500/- සඳහා නැවත තක්සේරු කර ඇත. 2023 ජනවාරි 01 වැනි දිනට රුපියල් 1,942,063.32 ක මූදල ප්‍රතයාගණන අතිරික්තයක් ලෙස පිළිගෙන ඇත.				
විස්තරය	**පරිගණක මෘදුකාංග හා ජාලකරණය**	**දූරකථන ස්විච සූචරු**	**අනෙකුත් ප්‍රාග්ධන වත්කම්**	**මූළු එකතුව**
2023/01/01 දිනට වත්කම් වල පිරිවැය	68,292,068.00	10,313,012.30	308,806,908.01	**387,411,988.31**
2023/01/01 දිනට ක්ෂය සඳහා ප්‍රතිපාදන	33,868,261.74	5,066,840.90	127,880,448.99	**166,815,551.63**
2023/01/01 දිනට රැගෙන ආ ශුද්ධ ශේෂය	34,423,806.26	5,246,171.40	180,926,459.02	**220,596,436.68**
2023/01/01 දිනට වත්කම් ප්‍රත්‍යාගණනයේ වටිනාකම	55,339,500.00	6,353,000.00	160,846,000.00	**222,538,500.00**
ප්‍රත්‍යාගණන කිරීමේ අතිරික්තය ප්‍රත්‍යාගණන අතිරික්ත ගිණුමට මාරු කර ඇත	20,915,693.74	1,106,828.60	(20,080,459.02)	**1,942,063.32**

ප්‍රත්‍යාගණනය අතිරික්ත ගිණුමට ගැලපීම	
2023/01/01 දිනට ආරම්භක ශේෂය	12,479,318,927.26
වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම මත ප්‍රත්‍යාගණන අතිරික්තය	1,942,063.32
2023/12/31 දිනට අවසන් ශේෂය	**12,481,260,990.58**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

පොදු සංචිතයට ගැලපීම.

සටහන 26

ජනවාරි 01 දිනට ශේෂය	**(3,255,055,273)**
පෙර වසරේ ආපසු ගෙවිය හැකි වෙන්ඩර් තැන්පතු ගෙවීම	(50,000)
විගණන කමිටු තීරණයට අනුව ජීවන වියදම් දීමනා හිඟය පොදු සංචිතයට ගැලපීම	1,222,859
වෙනස් නොවන ලෙජර ගිනුම් ශේෂයන් විගණන කමිටු තීරණයට අනුව පොදු සංචිතයට මාරු කිරීම	1,699,698
විශ්වවිද්‍යාල අර් ඵසාදක අරමුදල් දෝෂ නිවැරදි කිරීම	(31,295)
වැඩිපුර ගණනය කල තැපැල් වියදම් දෝෂය නිවැරදි කිරීම	95,900
පොලී ආදායම් සංවර්ධන අරමුදලට බැර කිරීම	(131,215,242)
අරමුදල් - ගිවිසුම් කඩ කිරීම්	(52,101,230)
2023 වසර්ය සඳහා සුනරාවර්ථන අතිරික්තය	159,911,749
2023/12/31 දිනට ශේෂය	**(3,275,522,833)**

සටහන 27

අසම්භාව්‍යන් සහ වගකීම්

පහත අසම්භාව්‍යන් සහ වගකීම් හෙළිදරව් කිරීම් පමණි.

අසම්භාව්‍ය වත්කම් හා වගකීම්

අනු අංකය	නඩුව පිළිබඳ විස්තරය	කරුණු / ගැටලුව	වෙනත්	කළමනාකරණ අදහස
1.	හෝමාගම කම්කරු විනිශ්චය සභාව - 33/1400/2018 ජේ.වී.ටී.යූ.කේ.ජයසේකර මහතා විසින් ගොනු කරන ලද නඩුව - ආයාචනය- නැවත සේවයේ පිහිටුවන්න, වැටුප් ආපසු ලබාදීම ඊළඟ දිනය: 25.04.2023	කම්කරු ගැටලු	පොරොත්තු	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පක්ෂව නඩු තීන්දුවක් ලබාදීම සඳහා කළමනාකාරිත්වය නිරන්තර අධීක්ෂණයෙන් පසුවන අතර නඩුවේ වත්මන් තත්ත්වය අනුව වන්දි වටිනාකම තක්සේරු කළ නොහැක.
2.	නුගේගොඩ දිසා අධිකරණය – ම/3020/2018 බී.ආර්.එම්.එන්.රත්නායක මහත්මියට (බැඳුම්කර අයකර ගැනීම) එරෙහිව විශ්වවිද්‍යාලයෙන් නඩුව. වටිනාකම - රුපියල් 10,762,632.36 ඊළඟ දිනය 2023.07.17	බැඳුම්කර කඩකිරීම්	පොරොත්තු	
3.	නුගේගොඩ දිසා අධිකරණය –M/2949/2018 නව කලා රහහල. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් නඩුව පවරා ඇත වටිනාකම-රු.1,065,229.27 ඊළඟ දිනය පියවර සහ වෙනස් වීම	ගිවිසුම අවසන් කිරීම	පොරොත්තු	
4.	නුගේගොඩ දිසා අධිකරණය –M/2950/2018 රසායන විද්‍යා ගොඩනැගිල්ල. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් නඩුව පවරා ඇත වටිනාකම-රු.720,010.56 ඊළඟ දිනය පියවර සහ වලනය	ගිවිසුම අවසන් කිරීම	පොරොත්තු	

5.	හෝමාගම මහාධිකරණය - ALT 10/2018 කම්කරු විනිශ්චය මණ්ඩලයේ තීන්දුවට එරෙහිව විශ්වවිද්‍යාලය විසින් ගොනු කරන ලද නඩුවක්. හෝමාගම මහාධිකරණය - ALT 11/2018 කම්කරු විනිශ්චය මණ්ඩලයේ තීන්දුවට එරෙහිව රංග ප්‍රසාද් මහතා විසින් ගොනු කරන ලද නඩුව. විශ්වවිද්‍යාලය වගඋත්තරකරුවෙකු ලෙස නම් කර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය - SC/HC/14/2021/LA මහාධිකරණ තීන්දුවට එරෙහිව රංග ප්‍රසාද් මහතා ගොනු කළ නඩුව. විශ්ව විද්‍යාලය වගඋත්තරකරුවෙකු ලෙස දක්වා ඇත.	අභියාචනා කරුණු	ලබා දුන් නියෝගය - තැන්පතු මුදල ප්‍රතිපූරණය කරන්න (රු. 1,948,927.51 පමණ)	
6.	හෝමාගම කම්කරු විනිශ්චය සභාව - 35/1502/2020 මනෝජ් උපශාන්ත විසින් ගොනු කරන ලද නඩුව - ආයාචනය - නැවත සේවයේ පිහිටුවීම, ආපසු වැටුප්, අර්ධ වැටුප් ඊළඟ දිනය: 24.04.2023	කම්කරු ගැටලු	පොරොත්තු	
7.	නුගේගොඩ දිසා අධිකරණය – 4379/2021/එම් ආචාර්ය එස්.ආර්.එන්.කොළඹගේ මහතාට එරෙහිව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් නඩුව වටිනාකම රු.6,998,145.89 පසුව නුගේගොඩ දිසා අධිකරණය – 4380/2021/එම් එරෙහිව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් නඩුවක් පවරා ඇත වෛද්‍ය එස්.ආර්.එන් කොළඹගේ ගේ ඇපකරුවන්. වටිනාකම රු.6,998,145.89 ඊළඟ දිනය 2023.01.16	බැඳුම්කර කඩකිරීම්	පොරොත්තු	.
8.	ශ්‍රේෂ්ඨාධිකරණය - SC/FR/283/2020 ආචාර්ය සුනේත්‍රා කංකන්මගේ විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව මහාචාර්ය සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගොනු කළ නඩුව	මූලික අයිතිවාසිකම් ගැටලු	පොරොත්තු	

9.	ශ්‍රේෂ්ඨාධිකරණය -SC/FR/216/2021 පසිඳු හිරුෂාන්ගේ රිය අනතුර සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට එරෙහිව නඩුව	මූලික අයිතිවාසිකම් ගැටලු	පොරොත්තු	
10.	ශ්‍රේෂ්ඨාධිකරණය -SC/FR/104/2021 මහාචාර්ය සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට එරෙහිව විශාකා සූරියබණ්ඩාර මහත්මියගේ නඩුව	මූලික අයිතිවාසිකම් ගැටලු	පොරොත්තු	
11.	2023 දෙසැම්බර් 31 දිනට බැඳුම්කර කඩ කිරීමේ මුදල රුපියල් 190,605,580.42 කි. 2023.01.01 දිනට ලැබිය යුතු මුළු (බැඳුම්කර කඩකරන්නන් 41) **76,488,183.34** 2023 වර්ෂයේදී දී අලුතින් එකතු කරන ලද බැඳුම්කර 168,374,617.65 2023 වසර සඳහා මුළු ලැබීම් (54,257,220.57) 2023.12.31 දිනට ලැබිය යුතු මුළු (බැඳුම්කර කඩකරන්නන් 39) **190,605,580.42**	බැඳුම්කර කඩ කිරීම	පොරොත්තු	මෙම මුදල අයකර ගැනීම සඳහා විශ්ව විද්‍යාලය විසින් අඛණ්ඩ පසු විපරම් සිදු කරනු ලැබේ.

ප්‍රාග්ධන කැපවීම්

1. හෝමාගම මහනේන්වත්ත පිටිපන අක්කර 20 ක ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා භාර දෙන ලදී. ඉඩමේ වටිනාකම රු. මිලියන 960 ක් වන අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ගෙවීම සිදු කෙරේ. ඉඩමේ අයිතිය පැවරීමෙන් පසු ඉඩම විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශයේ වත්කමක් ලෙස සටහන් කෙරේ.

2. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අංක 587 දරණ, මත්තේගොඩ, හෝමාගම අක්කර 10 කැකුණගහවත්ත නම් ඉඩම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සඳහා භාර දෙන ලදී. 2023 වර්ෂයේදී ඉඩම වටිනාකම රු. 1,120,847,068.50 වන අතර එම මුදල 2023 වර්ෂයේදී ප්‍රාග්ධනිත කරන ලදී. මෙම ඉඩම විශ්වවිද්‍යාලයේ වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත.

3. බොරලැස්ගමුව, එගොඩවත්ත පාරේ. 4 වැනි පටුමගේ ඉඩම ලබා ගැනීමට විශ්වවිද්‍යාලය විසින් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රුපියල් මිලියන 13ක් තැන්පත් කර ඇත. ඉඩමේ වටිනාකම රුපියල් මිලියන 52ක් ලෙස ගණන් බලා ඇත. විශ්වවිද්‍යාලය විසින් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී.

4. මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගංගොඩවිල, සෝරත් මාවතේ, හේමවිමන ඉඩම 2014.03.20 වන දින සන්තකයේ තබා ඇති අතර රජයේ තක්සේරුකරු විසින් එම ඉඩම පර්චසයක් රුපියල් ලක්ෂ 05 ක් ලෙස තක්සේරු කර ඇත. ඉඩමේ ප්‍රමාණය පර්චස් 167 ක් වන අතර ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 83.5 කි. කෙසේ වෙතත් තවමත් ගෙවීම් පියවා නොමැති අතර ඉඩම් සන්තකයේ කටයුතු ශේෂ පත්‍ර දිනට ගැනීමට නියමිතය.

5. රත්තනපිටියේ මෙත්සෙවන නිවාසය මුල්ලේරියාවේ සන්ෆලවර් ගම්මානයට ගෙන යාමට විශ්වවිද්‍යාලය බස්නාහිර පළාත් සභාවට රුපියල් මිලියන 74 ක් ගෙවා ඇත. මෙත්සෙවණ ඉඩමේ අක්කර 10 ක භූමි ප්‍රමාණයෙන් අක්කර 3.5 ක් විශ්වවිද්‍යාලයට පවරා දී වෛද්‍ය විද්‍යා පීඨය පිහිටුවා ඇත. ඉතිරි ඉඩම පවරා ගැනීමට විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇති අතර ඉඩමේ අයිතිය පැවරීමෙන් පසු එම ඉඩම විශ්වවිද්‍යාලයේ මුල්‍ය ප්‍රකාශනයේ වත්කමක් ලෙස සටහන් කෙරේ.

6. ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක් සැලසුම් සහ ගොඩනැගීමේ කොන්ත්‍රාත්තුවක් ලෙස 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර ශේෂ පත්‍රයේ දිනට කෙරී ගෙන යන වැඩ යටතේ වාර්තා කර ඇත. මිල ඉහළ යාම හේතුවෙන් කොන්ත්‍රාත් මුදල වෙනස් කර ඇති අතර අමතර කැපවීමක් ඇත. තවද ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පොලී හිමිකම් බිල්පත්වලට අමතරව පහත සඳහන් පරිදි හිඟ බිල්පත් වටිනාකමක් ඇත.

ව්‍යාපෘතියේ නම	**බහුවිධ කාර්යය ගොඩනැගිල්ල (කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය)**	**බහුවිධ කාර්යය ගොඩනැගිල්ල (මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)**
ව්‍යාපෘතිය ආරම්භක දිනය	15.07.2020	01.03.2020
ව්‍යාපෘති මුදල	රු.1,479 මිලියන + බදු	රු.1,183 මිලියන + බදු
මිල විචලනයන් සමඟ කොන්ත්‍රාත් අගය (ඇස්තමේන්තුගත)	රු.1,775 මිලියන + බදු	රු.1,420 මිලියන +බදු
භෞතික කාර්යසාධනය	83%	96%
කෙරීගෙන යන වැඩ - ප්‍රාග්ධනිත	රු.1426 මිලියන	රු.1559 මිලියන
පොලී වලට අදාළ බිල්පත්	83 මිලියන	69 මිලියන

7. ව්‍යාධි විද්‍යා පීඨයේ වෛද්‍ය විද්‍යා පීඨය සඳහා ව්‍යූහ විද්‍යා ගොඩනැගිල්ල දක්වා ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය 2021 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර ජී.ඩී.පී. ඉංජිනියරින් ආයතනය (GDP Engineering (Pvt) Ltd) වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද වටිනාකම 2023 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 151 කි. මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන ලද්දේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන AHEAD ව්‍යාපෘතිය මගින් වන අතර ගොඩනැගිලි වත්කම් වෙත පැවරී ඇත. කෙසේ වෙතත්, 2023.12.31 වන විට 3 වන සහ 4

වන මහලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති හේතුවෙන් ගොඩනැගිල්ල අධ්‍යයන කටයුතු සඳහා භාවිතා කර නොමැත.

8. තාක්ෂණ පීඨය සඳහා පරිගණක ජාල පද්ධතිය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 2021 වර්ෂයේ දී ලුමිනෙක්ස් ආයතනය (Luminex (Pvt) Ltd වෙත පිරිනමන ලදී. සම්පූර්ණ ව්‍යාපෘති වටිනාකම රුපියල් මිලියන 60 කි. කොන්ත්‍රාත්කරුගේ මිල වැඩිකිරීමේ ඉල්ලීම මත ව්‍යාපෘතිය අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කරන ලද අතර කොන්ත්‍රාත්කරු විසින් නිම කරන ලද වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අමතර උපකරණ සමඟ ව්‍යාපෘතිය අවසන් වන තෙක් වැඩ කරමින් පවතින බව පෙන්වා දී ඇත.

9. මෙම ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු සඳහා සම්පූර්ණ කර කාරක ප්‍රාග්ධනයක් ලෙස පෙන්වා නොමැති බැවින් පහත ව්‍යාපෘතිය ප්‍රාග්ධනීකරණය කර නොමැත.

අනු අංකය	විස්තරය	**01.01.2023 ශේෂය**	වර්ෂය තුල ගැලපුම්	**31.12.2023 ශේෂය**
1	ස්වර්ණ ජයන්ති සැමරුම් ශ්‍රවනාගාරය	5,794,676	-	5,794,676
2	කෙරීගෙන යන වැඩ - කැලේ කඩේ ආපනශාලාව - අදියර I	19,009,106	-	19,009,106
3	කෙරීගෙන යන වැඩ - කැලේ කඩේ ආපනශාලාව - අදියර II	11,813,102	1,405,387	13,218,489
4	කෙරීගෙන යන වැඩ - කැලේ කඩේ ආපනශාලාව - අදියර III	20,789,037	(1,772,290)	19,016,747
5	කෙරීගෙන යන වැඩ - කැලේ කඩේ ආපනශාලාව - අදියර 1V	3,723,213	(13,370)	3,709,844
6	කෙරීගෙන -සිසුන් ලියාපදිංචිය හා විභාග සඳහා වූ පද්ධතිය (මානව ශාස්ත්‍ර)	480,000	-	480,000

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ බහු කාර්යය ගොඩනැඟිල්ල ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කර නොමැත. කෙසේ වෙතත් සමහර දේශන ශාලාව විශ්වවිද්‍යාල අවශ්‍යතාවයට අනුව භාවිතා වන අතර ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කර නැති බැවින් ක්ෂයවීම් සඳහා සලකා බලනු නොලැබේ.

10. අනෙකුත් ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති හා ප්‍රාග්ධනිත ක්‍රියාකාරකම් වල විස්තර සටහන 27 උප ලේඛනවල අමුණා ඇත.

සටහන 28

වාර්තා කරන දිනට පසු ශේෂ පත්‍රයේ සිදු වන වෙනස්කම් හා සිදුවීම් පල කිරීම.

වාර්තා කළ දින සිට කිසිදු තත්වයක් උද්ගත වී නැත, නමුත් මූල්‍ය ප්‍රකාශනවල අපගේ හෙළිදරව් කිරීම්වලට ගැලපීම් අවශ්‍ය වන පරිදි නිකුත් කිරීමට මූල්‍ය ප්‍රකාශනවලට බලය පැවරීමට පෙර.

සටහන 29

අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු

1. උපකුලපතිවරයා, පීඨාධිපතිවරුන් සහ සෙනෙට් සභිකයින් දෙදෙනෙකු විශ්වවිද්‍යාල කවුන්සිලයේ සාමාජිකයින් වේ. 2023 වර්ෂය තුළ මෙම සාමාජිකයින්ට ගෙවන ලද වේතනය සහ අනෙකුත් ආදායම රුපියල් 65,120,676.20 කි. විශ්වවිද්‍යාලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධ කිරීම සඳහා විශේෂ ගෙවීමක් සිදු නොකෙරේ.

2. අංක 28, ලෙස්ලි රණගල මාවත, කොළඹ 08, දරන ස්ථානයේ පිහිටි කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) යනු වෙනම සංස්ථාපිත පනතක් යටතේ සංස්ථාපිත වූ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතනයකි. පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකයෙකු වන අතර අධ්‍යයන කටයුතු සඳහා අවසර දීම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සනාතන සභාව විසින් සිදු කරනු ලැබේ. ආයතනයේ මූල්‍ය මෙහෙයුම් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය මගින් පාලනය වේ. ඒ අනුව කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ගනුදෙනු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට නැවත වාර්තා නොකෙරේ.

3. සුජීව රාජපක්ෂ මහතා කවුන්සිලයේ, මූල්‍ය කමිටුවේ සාමාජිකයෙකු සහ විශ්වවිද්‍යාලයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සමාජිකත්වය දරණ අතර මහජන බැංකුවේ සභාපතිවරයාද වේ, විශ්වවිද්‍යාලය විසින් ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම් සඳහා රුපියල් මිලියන 5,013 ක් ආයෝජනය කර ඇති අතර ජංගම ගිණුම් 23 ක් පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මහජන බැංකුව සමඟ සිදු කළ ගනුදෙනුව සම්බන්ධයෙන් ගැටලුවක් ඇති නොවන අතර ගනුදෙනුව සාමාන්‍ය ගණුදෙනුවක් හෝ ව්‍යාපාරමය කටයුත්තක් ලෙස සිදු කරන ලදී.

4. විශ්වවිද්‍යාල ගනුදෙනු සඳහා ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලබන්නේ ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයෙන් වන අතර ලැබුණු අරමුදල් ප්‍රමාණය සහ දරන ලද වියදම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

   වෙනත් රාජ්‍ය ආයතන සමඟ කරන ලද ගනුදෙනු නිසි පරිදි සිදුවූ අතර විශ්වවිද්‍යාලය සමඟ සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවක් නොතිබුණි.

   මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත අයවැය සකස් කෙරේ.

සටහන 30

මූල්‍ය ප්‍රකාශන වල අයවැය තොරතුරු ඉදිරිපත් කිරීම.

ඇස්තමේන්තුගත අයවැය හා සත්‍ය අයවැය සංසන්දනය කිරීමේ ප්‍රකාශය පහත පරිදි වේ.

ඇස්තමේන්තු සහ සත්‍ය පිරිවැය සංසන්දනය කිරීමේ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

2023 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා	අයවැය (රු.)	සත්‍ය පිරිවැය (රු.)	ජයග්‍රහණ (%)
මෙහෙයුම් වියදම්			
පුද්ගල වැටුප්	5,345,000,000	4,916,669,446	91.99

ගමන් / ප්‍රවාහන	22,187,733	20,846,519	93.96
සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය	150,000,000	178,235,329	118.82
නඩත්තු	39,850,000	65,052,812	163.24
කොන්ත්‍රාත් සේවා	556,200,000	865,204,745	155.56
වෙනත් මෙහෙයුම් වියදම්	907,000,000	907,974,007	100.10
පාරිතෝෂික	42,500,000	104,504,845	245.89
ක්ෂය ගණනයට පෙර සම්පූර්ණ මෙහෙයුම් වියදම්	**7,062,737,733**	**7,053,239,791**	**99.87**

මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත අයවැය සකස් කෙරේ.

සටහන 31

වෙනත් හෙලිදරව් කිරීම්

1. 2023 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මහපොළ භාරකාර අරමුදල මගින් සපයන ලද අරමුදල්වලින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්වය ලෙස රුපියල් මිලියන 243ක් ගෙවා ඇත. විශ්වවිද්‍යාලය විසින් නිර්දේශ කරන ලද මුදල් ප්‍රමාණය මත පදනම්ව සිසුන් වෙත ගෙවීම් සෘජුවම ලබා දෙන ලදී. 2023 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ මුහුණුවර මත එය අනාවරණය කර නොමැත.

2. ආසියානු සංවර්ධන බැංකුව (ADB) යටතේ ක්‍රියාත්මක වන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සහ උපකරණ මිලදී ගැනීම සඳහා ඩොලර් මිලියන 35 (ආසන්න වශයෙන් රුපියල් බිලියන 6) ප්‍රදානය කිරීමට අනුමැතිය ලබා දී ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය. ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා වන ගිවිසුමක් උසස් අධ්‍යාපන ලේකම් විසින් "සන්කෙන් උපදේශන පෞද්ගලික ආයතනය" (Sanken Consultant (Pvt) Ltd) සමඟ 2021 ජනවාරි මාසයේ දී රුපියල් මිලියන 3,625 මුදලක් (වැට් බද්ද නොමැතිව) ඉදිකිරීම සඳහා අත්සන් කර ඇත. ආසියානු සංවර්ධන අරමුදල් මත විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා වන ගොඩනැගිලි සංකීර්ණය සඳහා සම්පූර්ණ අරමුදල් වටිනාකම රුපියල් 3,030,055,994.48 ක් වන අතර පහත ප්‍රදාන වටිනාකම 2023 වර්ෂයේ දී හඳුනා ගන්නා ලදී.

අයිතමය	මුළු එකතුව (රු.)
වත්කම්	93,392,437
රැකියා මාර්ගෝපදේශ වියදම්	160,200
උපාධි වැඩසටහන් ප්‍රතීතනය	4,000,000
ගොඩනැගිලි සඳහා අත්තිකාරම් ගෙවීම්	308,409,809
ව්‍යාපෘති කළමනාකරණ උපදේශනය - ගොඩනැගිලි	43,681,448
ගොඩනැගිලි / කෙරී ගෙන යන වැඩ	334,479,752
සම්පත් දායක්වයන් සහ අනෙකුත් ව්‍යාපෘති වියදම්	21,889,852
කෙටි කාලීන පුහුණු	13,483,837
තරගකාරී පර්යේෂණ ප්‍රදාන	21,020,214
මුළු එකතුව	**840,517,548**

විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වන ත්වරණය උසස් අධ්‍යාපන ව්‍යාපෘති සහ සංවර්ධන (AHEAD) වැඩසටහන යටතේ විශ්වවිද්‍යාලයට ලෝක බැංකු ප්‍රදානයක් ලැබී ඇත. පහත සඳහන් ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම සඳහා 2018 වර්ෂයේ සිට 2023 දක්වා රුපියල් 2,200,771,515.74 ක ලෝක බැංකු ප්‍රදානයක් ලැබී ඇත.

ක්ෂේත්‍ර 01 - ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛතා විෂයයන් සඳහා උසස් අධ්‍යාපනය සඳහා බඳවා ගැනීම් වැඩි කිරීම.

ක්ෂේත්‍ර 02 - ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම සහ මානව සම්පත් සංවර්ධනය පොහොසත් කිරීම.

ක්ෂේත්‍ර 03 - පර්යේෂණ, සංවර්ධනය, නවෝත්පාදන සහ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම.

විවිධ ව්‍යාපෘති සඳහා ප්‍රදානය ලැබුණු අතර එම ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ඇත.

3. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අයත් කළුබෝවිල පිහිටි රුපියල් මිලියන 347 ක් වටිනා ඉඩම සහ ගොඩනැගිල්ල සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කරන ලදී. සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයෙන් එකී දේපළ නැවත ලබා ගැනීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කරන ලද අතර පුනරුත්ථාපන කටයුතු ශේෂ පත්‍රයේ දිනට සිදු වන අතර කෙරී ගෙන යන වැඩ ලෙස පෙන්වයි.

4. ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ ශාලාවක්, ව්‍යායාම ශාලාවක් සහ පිහිනුම් තටාකයක් සහිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා නාගරික දෙපාර්තමේන්තු ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 618 ක් වටිනා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 පෙබරවාරි 13 වැනි දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී. උපදේශන ගාස්තු සහ සැලසුම් සකස් කිරීම සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට (CECB) 2016 වර්ෂයේ දී රුපියල් 5,794,676.00 ක් ගෙවා ඇත. අයවැය මඟින් ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි විය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පසු විපරමක් සිදු කර ඇත.

5. රසායන හා වීදුරු භාණ්ඩ තොග සමීක්ෂණය විශ්වවිද්‍යාලය විසින් 2023/12/31 ශේෂ පත්‍ර දින දක්වා සිදු කරනු ලබන අතර තොග වටිනාකම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට සකස් කර ඇත.

6. නඩත්තු ගබඩා බඩු තොග වල චලනය නොවන අයිතම සඳහා 2023 වර්ෂයේ දී ප්‍රතිපාදන සලසා ඇත.

7. වෛද්‍ය විද්‍යා පීඨය මඟින් පවත්වා ගෙන යනු ලබන ඇමරිකානු ඩොලර් ස්ථාවර තැන්පතු ගිණුම හා ඇමරිකානු ඩොලර් ගිණුම මත සිදු වන විනිමය පාඩුව රුපියල් මිලියන 45 කි. තවදුරටත් පවත්වා ගෙන යන ඉතුරුම් ගිණුමේ ශේෂය හා ස්ථාවර තැන්පත් ගිණුම් ශේෂ පත්‍ර දිනයේ දී ස්ථානීය අනුපාතයට ක්‍රියාකාරී මුදල් බවට පත් කරන ලදී.

8. විශ්වවිද්‍යාලය මඟින් යගිරල පිහිටි වන ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ඉඩම ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වන අතර විශ්වවිද්‍යාලය මඟින් පර්යේෂණ ක්‍රියාකාරකම් වලට අදාළ පිරිවැය දරයි.

2023.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. } HED/D/USJ/FA/23/03 මෙම අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 මැයි 31 දින

උපකුලපති,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලයේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව. විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්. වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ

පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඉ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව යම් සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව. පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මූදල් රෙගුලාසි 211	සේවාවන් හෝ සැපයීම් ඉටුකිරීමෙන් පසු අප්‍රමාදව ගෙවීම් සිදු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක් වර්ෂ 05ත් අතර කාලයක සිට එකතු වටිනාකම රු.190,796,584ක් වූ ගෙවිය යුතු ශේෂයක් පැවතුණි.
	(ii) මූදල් රෙගුලාසි 571	2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදයට අදාල එකතුව රු.7,370,591 ක් වූ කොන්ත්‍රාත් වැඩ 41ක අතරාදවුම් මූදල් සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
	(iii) මූදල් රෙගුලාසි 571(2)	වර්ෂ 03 ඉක්ම වූ එකතුව රු. 1,208,438 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු 61 ක් සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ)	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය වක්‍රලේඛයේ 03 (viii)	අදාළ වක්‍රලේඛය පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති දීමනා, සුභසාධන වැඩසටහන්, සංවර්ධන සහායන් හෝ සහනාධාර ලබාදීම් නතර කළ යුතු වුවද 2022 මැයි මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා අභ්‍යන්තර රක්ෂණ ක්‍රමයක් සඳහා රු.34,764,499ක් ගෙවා තිබුණි.
(ඇ)	2016 ජනවාරි මස 01 දිනැති අංක 01/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකයේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුලදී රු.5,233,971 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ)	2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 හා 2020 අගෝස්තු 14 දිනැති අංක SC&PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි සහ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක ERD/AE/GEN/16 දිනැති මුදල් අමාත්‍යාංශ ලිපි	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම් හා එකඟතාවයකින් තොරව 2017 වර්ෂයේ සිට 2023 දක්වා කාල පරිච්ඡේදය තුලදී එකතුව රු.528,309,119ක විදේශ පර්යේෂණ ප්‍රදාන 22 ක් ලබා ගෙන නොතිබුණි.
(ඉ)	2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන වක්‍රලේඛ ලිපියේ භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 5 වන ඡේදය	බැදුම්කර කඩ කරන ලද ආචාර්යවරුන් 20 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගෙන තිබූ රු.54,257,220 ක් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යායේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

2.3 වෙනත් නිරීක්ෂණ

(අ)	2019 හා 2021 වර්ෂවලදී Curriculum Development in data science and artificial intelligent ව්‍යාපෘතිය සඳහා කැයිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයෙන් ලැබී තිබුණු යුරෝ 55,422 කින් (රු.12,063,937) ගිවිසුම් ප්‍රකාරව ක්‍රියා නොකිරීම හේතුවෙන් යුරෝ 28,309 ක් (එනම් සියයට 52 ක්) සමාලෝචිත වර්ෂයේදී ආපසු ප්‍රේශනය කර තිබුණි. ඒ සඳහා විශ්වවිද්‍යාලයට රු.1,998,905 ක විනිමය අලාභයක් දැරීමට සිදුවී තිබුණි.
(ආ)	2013 වර්ෂයේ සිට ඉඩම් අත්පත්කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් වෙත රු.මිලියන 15.5ක් ගෙවා තිබුණද එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය විද්‍යා පීඨයේ 2021 සහ 2022 වර්ෂවල සිට පැවත එන රු.2,768,183 ක් වූ විලම්බිත ආදායම් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2019 වර්ෂයේ ආරම්භ කරන ලද කැලේකඩේ ආපනශාලාව හා ඒ ආශ්‍රිත ඉදිකිරීම් සඳහා රු.54,954,186 ක් වැය කර තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීමෙන් තොරව 2022 මැයි 06 දින අන්‍යොන්‍ය එකඟතාවයෙන් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදීද එහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ආපනශාලාව ප්‍රයෝජනයට ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

(ඉ) වටිනාකම රු.9,323,729 ක් වූ පර්යේෂණ අරමුදල් 20 ක් වසර 2 සිට වසර 4 දක්වා කාලයක් තුළදීද එකතුව රු.6,184,926ක් වූ දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් යටතේ පවතින විවිධ ගිණුම් 20ක් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂය තුළදී ද අදාල අරමුණු සඳහා භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 28 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.2,256,357 ක් වූ ආපදා ණය, කාර්යය මණ්ඩල ණය හා වාහන ණය වසර 1 සිට වසර 5 දක්වා කාලයක සිට අයනොවී පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න,
විගණකාධිපති.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව		
2.2.2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව		
නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ	
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i) 211	සේවාවන් හෝ සැපයීම් ඉටුකිරීමෙන් පසු අප්‍රමාදව ගෙවීම් සිදු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ත් වර්ෂ 05ත් අතර කාලයක සිට පවතින ගෙවිය යුතු එකතු වටිනාකම රු.190,796,584ක් විය.	විශ්වවිද්‍යාලයේ වියදම් සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරයෙන් නොලැබෙන අතර ලැබීමේදීද ප්‍රමාදයන් පවතී. මෙම මුදල් ලැබීමේ ප්‍රමාදයන් කොරෝනා වසංගත තත්වයත් සමඟ ඇතිවූ ආර්ථික ගැටලු නිසා සිදු වූ අතර වර්තමානයේදී පෙර වර්ෂයට සාපේක්ෂව මහා භණ්ඩාගාරයෙන් මුදල් නිදහස් වෙමින් පවතී. ඒ අනුව හිඟ මුදල් ගෙවීමට කටයුතු කරනු ඇත.
(ii) 571	2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අදාල එකතුව රු. 7,370,591 ක් වූ කොන්ත්‍රාත් වැඩ 41ක අතරැඳවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.	මෙම රැඳවුම් මුදල් 2024 වර්ෂයේදී ඉල්ලීම් ඉදිරිපත් නොවීම මත ආදායමට ගනු ඇත. කොන්ත්‍රාත්මත අතරැඳවුම් මුදල (Retention Money) අදාළ කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලුමකල යුතු අතර එසේ ඉල්ලුම් නොකල අතරැඳවුම් මුදල් පිළිබඳ සමාලෝචනයක් කර නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතී.
(ii) 571 (2)	වර්ෂ 03 ඉක්ම වූ එකතුව රු. 1,208,438 ක් වූ ආපසු ගෙවිය යුතු චෙන්ඩර් තැන්පතු 61 ක්	විශ්වවිද්‍යාල ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව වර්ෂ 03 ඉක්මවූ ආපසු ගෙවිය යුතු ශේෂයන් ආදායම් ලෙස ගිණුම් ගත කරනු ලබයි. ඒ අනුව අදාළ වසර 03 ඉක්මවීමෙන් අනතුරුව මෙම ශේෂයන් ආදායමට ගනු ලබයි. මේ පිළිබඳ

	නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශයන්හි ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර ඇත.
(ආ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 ජාතික අයවැය වක්‍රලේඛයේ 03 (viii)	අඳාළ වක්‍රලේඛ පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති දීමනාවක්, සුභසාධන වැඩසටහන්, සංවර්ධන සහායන් හෝ සහනාධාර ලබාදීම් නතර කළ යුතු වුවද 2022 මැයි මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා රක්ෂණ ක්‍රමයක් සඳහා රු.34,869,007ක් ගෙවා තිබුණි.	විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලය සඳහා රජයේ කාර්යමණ්ඩලයට ලබාදෙන අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක නොවන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවක කාර්යය මණ්ඩලය සඳහා පාලක සභා අනුමැති යටතේ 2018 වසරේ ආරම්භ වූ රක්ෂණ ආවරණ ක්‍රමයක් ක්‍රියාත්මක වේ. මෙම රක්ෂණ ක්‍රමය නව රක්ෂණ ක්‍රමයක් නොවන අතර පෙර වර්ෂයන්හි සිට ක්‍රියාත්මක වී තවදුරටත් පවතී. මෙය විශ්වවිද්‍යාලය මඟින් මූලික රක්ෂණාවරණයක් පමණක් විශ්වවිද්‍යාලයෙහි උපයා ගත් අරමුදල් ආයෝජන පොලී මඟින් ගෙවීම් සිදුකරනු ලබයි. මෙය පොදු මූල්‍ය වක්‍රලේඛ 06/2019 හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් වක්‍රලේඛ 718 යටතේ ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. මූලික රක්ෂණ ආවරණය ඉක්මවා ලබාගෙන ඇති සියලුම රක්ෂණ ආවරණ සඳහා කාර්යය මණ්ඩලය විසින් ගෙවීම් සිදු කරනු ලබයි.
(ඇ) 2016 ජනවාරි මස 01 දිනැති අංක 01/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකයේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ රු. 5,233,971 ක් ගෙවීම් කර තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛ 2016/04 අනුව ස්වයං මූල්‍ය පාඨමාලා අයවැය මඟින් මෙම ගෙවීම් සඳහා වෙන්කිරීම් කර ඇත. පොදු ව්‍යාපාර සඳහා කාරක සභා නියෝග අනුව පැවති ගෙවීම් ක්‍රමවේදය අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. තවදුරටත් නව ක්‍රමවේදයක් සකස් කර පාලක සභා අනුමැතිය ලබාගෙන ඇත. මේ අනුව 2016/04 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛ අනුව නවක්‍රමවේදය 2024/01/01 සිට ක්‍රියාත්මක කිරීමට අනුමැති ලබාගෙන ඇත.

(ඇ) 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 හා 2020 අගෝස්තු 14 දිනැති අංක SC&PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි සහ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක ERD/AE/GEN/16 දිනැති මුදල් අමාත්‍යාංශ ලිපි	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවයකින් තොරව 2017 වර්ෂයේ සිට 2023 දක්වා කාල පරිච්ඡේදය තුලදී එකතුව රු.528,309,119 ක විදේශ පර්යේෂණ ප්‍රදාන 22 ක් ලබාගෙන නොතිබුණි.	විදේශ ප්‍රදාන හා ආධාර ලැබීම් අනුමැතිය ලබා ගැනීම පිළිබඳව වරින්වර වක්‍රලේඛ වෙනස් වූ අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ගිවිසුම් ඉදිරිපත් කර ඇත. මෙම මුදල් හුදෙක්ම පර්යේෂණ කටයුතු සඳහා ලැබෙන අතර ඉතා ඉක්මණින් එම පර්යේෂණ ඉල්ලිම් සිදුකිරීමට අනුමැතියට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ අදාළ අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමේදී ගත වන කාල පරාසය අනුව පර්යේෂණ සඳහා මුදල් ලබා ගැනීම පාලක සභා අනුමැතියට යටත්ව ලබාගෙන ඇත. වර්තමානයේදී පවතින වක්‍රලේඛ අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබේ.
(ඉ) 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන වක්‍රලේඛ ලිපියේ භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 5 වන ඡේදය	බැදුම්කර කඩ කරන ලද ආචාර්යවරුන් 20 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගෙන තිබූ රු.54,257,220ක් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.	උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙහි උපදෙස් පරිදි බැදුම්කර අරමුදල් අගයන්, කාර්යමණ්ඩලයේ සප්ත වාර්ෂික නිවාඩු ගුවන් ටිකට්පත් ලබාගැනීමේ වියදම් ලබාගැනීමට උපදෙස් දී ඇත. ඒ අනුව බැදුම්කර අරමුදල් මහා භාණ්ඩාගාරය වෙත යොමු කර නොමැත.

2.3	වෙනත් කරුණු	
(අ)	2019 හා 2021 වර්ෂවලදී Curriculum Development in data science and artificial intelligent ව්‍යාපෘතිය සඳහා තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයෙන් ලැබී තිබුණු යුරෝ 55,422 ක් (රු. 12,063,937) ගිවිසුම් ප්‍රකාරව ක්‍රියා නොකිරීම හේතුවෙන් යුරෝ 28,309 ක් (එනම් සියයට 52 ක්) සමාලෝචිත වර්ෂයේදී නැවත ආපසු ප්‍රේශනය කර තිබුණි. ඒ සඳහා විශ්වවිද්‍යාලයට රු. 1,998,905 ක විනිමය අලාභයක් දැරීමට සිදුවී තිබුණි.	මෙම ප්‍රදානයෙහි ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කලද අදාල වෙන්කල මුදල විදේශ විනිමය අනුපාතයෙහි සිදුවූ අසාමාන්‍ය ඉහල යාම මත ප්‍රමාණවත් නොවීම මත අදාළ උපකරණ මිලදී ගැනීමට නොහැකි විය. එම ප්‍රසම්පාදන අයිතම ප්‍රමාණවත් මුදල් මත කොටස් ලෙස මිලදී ගැනීමටද නොහැකි වූ අතර ඒ සඳහා ප්‍රදානයන්හි අනුමැතිය නොලැබුණි. එසේ හෙයින් ප්‍රදාන මුදල් සම්පූර්ණයෙන්ම උපයෝගී නොවූ අතර ගිවිසුම් අනුව ඉතිරි මුදල තාක්ෂණ ආයතන වෙත යැවීමට සිදුවිය. ප්‍රදානයන් ලැබුණු අවස්ථාවේ යුරෝ අගය රු. 200.00 මට්ටමට වඩා අඩු මට්ටමකට පැවති අතර ගෙවීම් කිරීමේදී රු. 350.00 ඉක්මවූ මුදලකට ආපසු යැවීමට සිදුවිය. එසේ හෙයින් විදේශ විනිමය අලාභයක් දැරීමට සිදුවිය. ශ්‍රී ලංකාව කොරෝනා වසංගතයෙන් පසුව ඇතිවූ ආර්ථික අවප්‍රමාණය මත විදේශ විනිමය අසාමාන්‍ය ලෙස ඉහලයාම මත ඇති වූ විදේශ විනිමය අලාභයක් වේ.
(ආ)	2013 වර්ෂයේ සිට ඉඩම් අත්පත්කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් වෙත රු.මිලියන 15.5 ක් ගෙවා තිබුණද එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.	ඉඩම් අත්පත් කරගැනීම දිර්ඝ ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා රාජ්‍ය ආයතන කිහියපක (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඩම් අමාත්‍යාංශය, මිනින්දෝරු දෙපාර්තමේන්තු, අධ්‍යයන අමාත්‍ය හා මහාභාණ්ඩාගාරය) සෘජු සහ වක්‍ර දායකත්වය අවශ්‍යය වේ. ඇතැම් ආයතන වල ක්‍රියාවලීන් විශ්වවිද්‍යාල පරිපාලනයෙන් බැහැර වන අතර ඒ සඳහා ඉතා දිර්ඝ කාලයක් ගත වූ අවස්ථා ඇත. උදාහරණයක් ලෙස ඉඩම් සඳහා ගෙවනු ලබන මුදල් සඳහා ඉඩම් හිමිකරු එකඟ නොවන අවස්ථා වලදී ඉඩම් අමාත්‍යාංශය විසින් වන්දි සමාලෝචන කමිටුවක් පත් කරනු ලබන අතර

		එහි නිර්දේශයන් ලබා ගැනීම දැක්විය හැක. කෙසේ නමුත් මෙම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ පසුවිපරම් කරමින් අදාළ ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පවතී.
(ඇ)	කළමණාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය විද්‍යා පීඨයේ 2021 සහ 2022 වර්ෂවල සිට පැවත එන රු.2,768,183 ක් වූ විලම්බිත ආදායම් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ස්වයං මූල්‍ය පාඨමාලා සම්පූර්ණයෙන්ම අවසන් වූ පසු සියලුම ආදායම් හා වියදම් ගලපනු ලැබේ. කෙසේ වුවත් සම්පූර්ණ සිසු පිරිසම් අදාළ කාලය තුල පාඨමාලාව අවසන් නොකරන බැවින් ස්වයං මූල්‍ය පාඨමාලා විවෘතව තබා ගැනීමට සිදුවීම මත මෙම විලම්බිත ආදායම් ශේෂය තබාගෙන ඇත. කෙසේ වුවත් අදාළ උපාධිප්‍රදානොත්සවය අවසන් වූ වහාම පාඨමාලා ගිණුම් කටයුතු අවසන් කර ආදායමට ගැනීමට තීරණය කර ඇත.
(ඇ)	2019 වර්ෂයේ ආරම්භ කරන ලද කැලේකඩේ ආපනශාලාව හා ඒ ආශ්‍රිත ඉදිකිරීම් සඳහා රු.54,954,186 ක් වැය කර තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීමෙන් තොරව 2022 මැයි 06 දින අන්‍යෝන්‍ය එකඟතාවයෙන් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදීද එහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ආපනශාලාව ප්‍රයෝජනයට ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.	මේ පිළිබඳ 2023 වර්ෂයේ පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී විමසීමට ලක් වූ අතර පවත්නා මූල්‍ය ප්‍රතිපාදන මඟින් අදියර ලෙස කාර්යය අවසන් කරන ලෙස එහිදී උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව එහි බිම් මහලේ ඉතිරි කාර්යයන් අවසන් කිරීම සඳහා ප්‍රමාණ පත්‍රයක් සකස් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් රු. මිලියන 05 ආසන්න මුදලකට නව කොන්ත්‍රාත්තුවක් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන මඟින් ප්‍රදානය කරන ලදී. එහි වැඩ කටයුතු මේ වන විට ක්‍රියාත්මකව ඇති අතර 2024/06/30 දිනට ප්‍රථම එය අවසන් කර භාර දීමට නියමිතය.
(ඉ)	වටිනාකම රු.9,323,729 ක් වූ පර්යේෂණ අරමුදල් 20 ක් වසර 2-4 දක්වා කාලයක් තුලදී ද එකතුව රු. 6,184,926 ක් වූ දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් යටතේ පවතින විවිධ	පර්යේෂණ අරමුදල් ලැබෙනුයේ නිශ්චිත කාර්යයන් සඳහා වන අතර අදාළ පර්යේෂණ හිමියන් පර්යේෂණ ආධාර ගිණුම් නැඹීමට ලිඛිතව විවෘතව උපදෙස් දෙන්නෙක් නැඹීමට සිදුව ඇත. පසුව වර්ෂ 03 ඉක්මවූ පර්යේෂණ ප්‍රදාන

	ගිණුම් 20 ක් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂය තුලදී ද අදාළ අරමුණු සඳහා භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.	ශේෂයන් පොදු පර්යේෂණ ගිණුමකට මාරු කර පර්යේෂණ සඳහා යොදා ගැනීමට කටයුතු කරනු ඇත. සංවර්ධන අරමුදල් උපයෝජනය කිරීම සඳහා අදාළ අරමුදල් ව්‍යවස්ථාගතව හෝ චක්‍රලේඛ අනුව සිදු කරන බැවින් අපේක්ෂිත අරමුණු සඳහා යොදවන තෙක් අරමුදල් ශේෂයන් ලෙස පවතී. එම උපයෝජනය නොවූ අරමුදල් උපයෝජනය පිලිබඳ අධ්‍යයනය සඳහා කාර්ය මණ්ඩලයෙන්ද සමන්විත කමිටුවක් පත්කිරීමට තීරණය කර ඇති අතර එෙන උපයෝජනයන් අවම කිරීමට කටයුතු කරනු ඇත.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 28 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.2,256,357 ක් වූ ආපදා ණය, කාර්යයමණ්ඩල ණය හා වාහන ණය වසර 1 සිට වසර 5 දක්වා කාලයක සිට අයනොවී පැවතුණි.	වර්ෂය ඉක්මවූ හිඟ මුදල් ප්‍රමාණයන් හැර අනෙකුත් ණය මුදල් ප්‍රමාණයන් නිසි ලෙස අයකර ගැනීමට කටයුතු කරන අතර එය අඛණ්ඩව පසු විපරම් කරමින් පවතී. ණය මුදල් අයකර ගැනීම ප්‍රමාද වීමට ඇතැම් අවස්ථා වලදී සිදුවේ. එනම් සේවා හැර යාම, ඉල්ලා අස්වීම ආදියෙදී විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂයන්හි ඉතිරි ණය මුදල් අයකර ගැනීමට සිදුවන අවස්ථා වලදී එම මුදල් නිදහස් කරන තෙක් ණය මුදල අයකර ගැනීමට නොහැකි වේ. එවැනි අවස්ථා වලදී වර්ෂය ඉක්මවූ ණය මුදල් ලෙස පෙන්නුම් කරනු ලබයි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පත්මලාල්
උපකුලපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

උපකුලපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.